# වාර්ෂික වාර්තාව

# 2024








ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව
# 2024

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# පටුන


සභාපතිතුමාගේ පණිවුඩය..........1
අප ගැන..........2
කොමිෂන් සභාව සහ විධායක කළමනාකාරිත්වය..........5
විධායක කාර්ය මණ්ඩලය..........14
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය..........18
තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 2024..........23
විදුලි සංදේශ සංඛ්‍යාලේඛන සහ තොරතුරු..........25
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව..........30
බලපත්‍ර කළමනාකරණය..........30
ජාල..........32
සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ..........35
අනුකූලතා සහ විමර්ශන කටයුතු..........37
නීති..........40
විශේෂ ව්‍යාපෘති අංශය..........41
ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා..........43
තොරතුරු තාක්ෂණය..........48
පාලන සහ ආයතනික කටයුතු අංශය..........50
තරඟකාරිත්ව..........55
මූල්‍ය..........57
අභ්‍යන්තර විගණනය..........61
අපගේ සේවක පැතිකඩ..........62
විගණන කමිටු යාවත්කාලීන කිරීම..........63
ආයතනික පාලන වාර්තාව..........67
මූල්‍ය ප්‍රකාශනය..........70
විගණකාධිපතිගේ වාර්තාව..........97
අතිරේක තොරතුරු..........104
වසර 10ක මූල්‍ය ප්‍රගතිය..........105
කෙටි යෙදුම් ලැයිස්තුව..........106


මෙම වාර්තාව මාර්ගගතව බැලීමට QR කේතය පරිලෝකනය කරන්න.
https://www.trc.gov.lk/

# වගු

වගුව 1: 17 වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම ... 31
වගුව 2: 17 ආ වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම ... 31
වගුව 3: 17 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභීන් ... 31
වගුව 4: විදුලි සංදේශ කුලුණු ආශ්‍රිත සංඛ්‍යාලේඛන ... 33
වගුව 5: වෙළඳ බලපත්‍ර ... 33
වගුව 6: 2024 වර්ෂය තුළ පවරන ලද කෙටි කේත අංක ... 34
වගුව 7: මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය ... 34
වගුව 8: සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර නිකුත් කිරීම ... 36
වගුව 9: ලැබුණු පැමිණිලි සහ මෙහෙයවන ලද විමර්ශන කටයුතු ... 36
වගුව 10: නිෂ්කාශන ලිපි නිකුත් කිරීම ... 36
වගුව 11: 2024 දී මෙහෙයවන ලද පැමිණිලි ... 37
වගුව 12: කාර්ය සාධනය පිළිබඳ සාරාංශය ... 39
වගුව 13: උසස් පුහුණු කමිටුව විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර වැඩසටහන් වල සාරාංශය - 2024 ... 46
වගුව 14: අනුමත ජාත්‍යන්තර වැඩසටහන් සඳහා අරමුදල් සපයන ආකාරය - 2024 ... 46
වගුව 15: විදේශ පුහුණු වැඩසටහන් ... 52
වගුව 16: දේශීය පුහුණු වැඩසටහන් ... 53
වගුව 17: බදු සහ සෙස් බදු එකතු කිරීම ... 55
වගුව 18:අන්තර් සම්බන්ධතා කටයුතු මෙහෙයවීම ... 56
වගුව 19: ගාස්තු ක්‍රම නියාමනය ... 56
වගුව 20: විශේෂ කාණ්ඩය යටතේ ගාස්තු ක්‍රම ... 56
වගුව 21: බදු ගෙවීම් ... 57
වගුව 22: ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණය ... 60

## ප්‍රස්ථාර

ප්‍රස්ථාර 1: පාරිභෝගික පැමිණිලි - 2024 ........ 37
ප්‍රස්ථාර 2: විදුලි සංදේශ බදු ........ 58
ප්‍රස්ථාර 3: විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ........ 59
ප්‍රස්ථාර 4: ජංගම දුරකථන කුලුණු බදු ........ 59
ප්‍රස්ථාර 5: කෙටි පණිවුඩ සේවා බදු ........ 59
ප්‍රස්ථාර 6: මුළු ආදායම් රැස්කිරීම් ........ 59
ප්‍රස්ථාර 7: මුළු ආදායම ........ 59

# සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) සභාපතිවරයා වශයෙන් එහි 2024 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවුඩය එවීමට ලැබීම මාහට ඉමහත් ගෞරවයකි. 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත බලාත්මක කිරීමත් සමඟ විදුලි සංදේශ ක්ෂේත්‍රයට මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යන දෙ අංශයටම එකසේ මෙම වසර ඉතා වැදගත්ය. දශක තුනකට ආසන්න කාලයකට පසු, සිදු කරන ලද මෙම තීරණාත්මක සංශෝධනය තුළින් විදුලි සංදේශ කර්මාන්තය පාලනය කරන නියාමන රාමුව ශක්තිමත් වී ඇති අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයේ විකාශනය වන අවශ්‍යතා සපුරාලීමට කොමිෂන් සභාවට ඇති හැකියාව වැඩි දියුණු වී ඇත.

නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ සඳහා ද අත්‍යවශ්‍ය සන්නිවේදන සේවා සපයමින්, විදුලි සංදේශ කර්මාන්තය ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික උන්නතිය උදෙසා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරමින් සිටී. අන්තර්ජාල සම්බන්ධතා සමඟ ජංගම සහ ස්ථාවර විදුලි සංදේශ සේවාවල ගතික සම්මිශ්‍රණයත් සමඟ, රටේ ජනගහනයට අනුව පෙර වසරට සාපේක්ෂව මෙම අංශයේ වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2024 වසර අවසන් වන විට, රට තුළ ජංගම දුරකථන ග්‍රාහකයින් මිලියන 28.8 ක්, ස්ථාවර ග්‍රාහකයින් මිලියන 3.4 ක් සහ බ්‍රෝඩ්බෑන්ඩ් පරිශීලකයින් මිලියන 20.6 ක් සිටියහ. ජංගම සහ ස්ථාවර දුරකථන ව්‍යාප්ත අනුපාත පිළිවෙලින් 131.5% සහ 15.7% ලෙස වාර්තා විය. ජාතික සංවර්ධනය ඉදිරියට ගෙන යාමේදී සහ සෑම කෙනෙකුටම ඩිජිටල් තාක්ෂණයන්, සේවා සහ අවස්ථාවන් වෙත සමාන, ආරක්ෂිත සහ අර්ථවත් ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීමේදී විදුලි සංදේශ අංශයේ වැදගත්කම මෙම සංඛ්‍යා ලේඛන මගින් පිළිබිඹු වේ.

විදුලි සංදේශ පනතට කරන ලද සංශෝධන මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට වඩාත් ක්‍රියාකාරී නියාමන භූමිකාවක් ඉටු කිරීමට බලය ලබා දී ඇත. දැන්, කොමිෂන් සභාවට තරඟකාරිත්වය ප්‍රශස්තව කළමනාකරණය කිරීම, යටිතල පහසුකම් හවුලේ භාවිතය අධීක්ෂණය කිරීම, අනුකූලතාව බලාත්මක කිරීම සහ වර්ණාවලි පැවරීම නියාමනය කිරීමට හැකියාව ලැබී තිබේ. අතිරේක ප්‍රතිසංස්කරණ අතරට නව බලපත්‍ර කාණ්ඩ හඳුන්වාදීම, නියාමන උල්ලංඝනයන් සඳහා දඩ මුදල් වැඩි කිරීම සහ ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ සබ්මැරීන් කේබල් ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන හඳුන්වාදීම ඇතුළත් වේ. මෙම වැඩිදියුණු කිරීම් හුදෙක් අධීක්ෂණය ශක්තිමත් කරනවා පමණක් නොව, විදුලි සංදේශ අංශය තුළ ආදායම් උත්පාදනය කිරීමට සහ ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කිරීමට නව මංපෙත් විවර කරයි.


එමෙන්ම සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණයේ ද සැලකිය යුතු දියුණුවක් ඇතිවී ඇත. වර්ණාවලි සම්පස්ථබව සම්පූර්ණ කිරීම මගින්, පවතින සංඛ්‍යාත වඩාත් ඵලදායී ලෙස භාවිත කිරීමට ඉඩ සැලසී ඇති අතර, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු වී ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගුවන් විදුලි ප්‍රවේශ ජාල හවුලේ භාවිතය සඳහා නව්‍ය ක්‍රම හඳුන්වා දී ඇති අතර, වර්ණාවලි භාවිතය සඳහා විනිවිද පෙනෙන මිලකරණ ආකෘති සකස් කර ඇත. එමෙන්ම වර්ණාවලි වෙන්දේසි රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම තුළින් වර්ණාවලි වෙන්කිරීමේ සාධාරණත්වය සහ විනිවිදභාවය තවදුරටත් සහතික කරනු ලැබ ඇත.

කොමිෂන් සභාවේ ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමෙහි ලා ජාත්‍යන්තර සහයෝගීතාවය ද වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ලෝක බැංකුව සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සමඟ එක්ව කටයුතු කරමින්, ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය ශක්තිමත් කිරීමට පියවර ගෙන තිබේ. විදුලි සංදේශ සේවා සැපයීමේ විෂමතාවය තුරන් කිරීම සහ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමේ ජාතික ඉලක්ක සමඟ පෙළගැසෙමින්, 5G ඇතුළුව වැඩිදියුණු බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සඳහා වර්ණාවලිය වෙන් කිරීම පිළිබඳ විශේෂඥ සහාය ලබා ගැනීම මෙම හවුල්කාරිත්වයේ දී අවධානයට යොමු වූ වැදගත් කරුණ විය. යටිතල පහසුකම් හවුලේ භාවිතය පිළිබඳ අලුතින් ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි මගින් මෙහෙයුම් පිරිවැය අඩු කිරීම, අඩු සේවා පහසුකම් සහිත ප්‍රදේශවලට සේවා ව්‍යාප්ත කිරීම, මෙන්ම සියළුම පරිශීලකයන්ගේ සේවා අවශ්‍යතා මුළුමනින්ම සපුරාලන විදුලි සංදේශ පරිසරයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

ඊට අමතරව, විදුලි සංදේශ වෙළඳපොළ තුළ සාධාරණ තරඟකාරිත්වයක් ඇති කරලීමේ ප්‍රගතිය ලබා ඇත. වෙළඳපල අසමතුලිතතාවයන් පිළිබඳව සාකච්ඡා කිරීම සහ සියලුම පාර්ශ්වකරුවන් සඳහා සමාන හා සාධාරණ තරඟකාරිත්වය හා අවස්ථා සහතික කිරීම සඳහා ගැසට් නිවේදන මගින් නව නියාමන පියවර හඳුන්වා දෙන ලදී. නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම, සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා ආරක්ෂා කිරීම උදෙසා මෙම ප්‍රයත්නයන් ගෙන ඇත.

2024 වසර මුළුල්ලේම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සම්පූර්ණයෙන්ම රජයේ රෙගුලාසිවලට අනුකූලව අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, අත්‍යවශ්‍ය සේවාවන් බාධාවකින් තොරව මහජනතාවට ලබා දීම සහතික කළේය. මෙම වසරේ දී උද්ගත වූ දුෂ්කරතා මධ්‍යයේ වුවද, අපගේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් හඳුනාගෙන ඒවා උපයෝගී කරගනිමින් ආයතනයේ අරමුණු කරා වැඩ කිරීමේදී සහයෝගීතාව සහ එකමුතුකම වර්ධනය කිරීමට අපට හැකි විය. අභියෝගාත්මක වාතාවරණයන් හී දී පවා ජාතියට සේවය සලසමින් ප්‍රධාන නියාමන ආයතනයක් වශයෙන් අපගේ වගකීම් ඉටු කිරීමෙහි ලා අපට සහාය වීමේ දී කාර්යමණ්ඩලය විසින් දක්වන ලද උද්යෝගය සහ කැපවීම බෙහෙවින් වැදගත් විය.

අපි අනාගතය දෙස බලන විට, නව රජය යටතේ ශ්‍රී ලංකාවේ පුළුල් ආර්ථික හා සමාජීය ඉලක්කවලට සහාය වන අයුරින් විදුලි සංදේශ කර්මාන්තය ඉදිරියට ගෙන යාමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අඛණ්ඩව කැපවී සිටී. කොමිෂන් සභා සාමාජිකයින්ට, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන්ට ඔවුන්ගේ අඛණ්ඩ උත්සාහය සහ කැපවීම වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. අපි සියලුම දෙනා එක්ව, මෙම වසරේ ජයග්‍රහණ තවදුරටත් සාක්ෂාත් කර ගනිමින් ජාතික ඩිජිටල් පරිවර්තනයට දායක වෙමු.



වරුණ ශ්‍රී ධනපාල
වැඩබලන ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සහ
සභාපති, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# අප ගැන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL), 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත, හා පසුව සංශෝධනය කරන ලද, 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වේ. මෙම වාර්තාවේ පනත යන්නෙන් 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතින් හා 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත හැඳින්වෙන අතර කොමිෂන් සභාව යන්නෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හැඳින්වේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) යනු රටේ විදුලි සංදේශ නියාමන කටයුතු මෙහෙයවීමේ රාජ්‍ය බලධරයා වේ. ඒ අනුව පාරිභෝගිකයින්ගේ සහ දුරකථන ක්‍රියාකරු සමාගම්වල යහපත නිසැක කරමින් මෙරටේ විදුලි සංදේශ සේවා නංවාලීමට පනත මඟින් කොමිෂන් සභාවට බලය පවරා ඇත.



**දර්ශනය**

"විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මඟින් දියුණුවෙමින් ඉදිරියට යන විදුලි සංදේශ කර්මාන්තයේ විශ්වීය නියාමකයකු වශයෙන් පිළිගැනීමට ලක්වීම."



**මෙහෙවර**

"කුසලතාවයෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලංකායක් මඟින් තරඟකාරී වෙළඳපලෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගත හැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබාදීමට වග බලා ගැනීම"

**අපගේ වටිනාකම්**



- **වගවීම:** අපගේ ප්‍රතිපත්ති උපදෙස් සහ කාර්යයන් සම්බන්ධයෙන් වගකීම භාර ගැනීම.
- **විනිවිදභාවය:** අපගේ කාර්යයන් පසුපස පවත්නා තාර්කිකත්වය පැහැදිලි කිරීමට සූදානම් ව සිටීම
- **වෘත්තීයභාවය:** කොමිෂන් සභාවේ විදුලි සංදේශ නියාමනය පිළිබඳ අපගේ එදිනෙදා කටයුතුවල දී ප්‍රශස්ත වෘත්තීමයභාවයක් ප්‍රදර්ශනය කිරීම සහ අඛණ්ඩ ස්වයං-වැඩිදියුණුව සාක්ෂාත් කර ගැනීම.
- **අඛණ්ඩතාව:** අපගේ පාරිභෝගිකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ යහපත උදෙසා සදාචාරාත්මකව, කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස කාර්යයන් ඉටු කිරීම මඟින් කාර්යසාධනය ක්‍රියාවට නැංවීම.

### මෙහෙවර ප්‍රකාශනය අර්ථ නිරූපනය කිරීම

ශ්‍රී ලංකාවේ දිගු කාලීන සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කරනු වස් සාධාරණත්වය, තරඟකාරීත්වය සහ ආයෝජන දිරිගන්වන නියාමන පරිසරයන් නිර්මාණය කිරීම උදෙසා සියළුම පාර්ශවකරුවන් සමඟ ස්වාධීන, විවෘත සහ පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීම තුළින් සියළුම පරිභරණය කරන්නන්ට සාධාරණ, යුක්තිසහගත සහ දැරිය හැකි මිල ගනන් යටතේ වැඩිදියුණු සහ ගුණාත්මක බවෙන් ඉහළ සන්නිවේදන තාක්ෂණ සේවා සැපයිය හැකි බව සහතික කිරීම.

### කොමිෂන් සභාව

කොමිෂන් සභාව සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර කොමිෂන් සභාව අයත් වන තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ.

එමෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභා සාමාජිකයෙකු ද වේ. සෙසු සාමාජිකයින් තිදෙනා පිළිවෙලින් නීති, කළමණාකරන, මූල්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවක් ලබා ඇත්තාවූ තැනැත්තන් වේ.

## අරමුණු

විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කළ යුතු අරමුණු පහත දැක්වේ.

- ශ්‍රී ලංකාවේ ජාතික සහ අන්තර්ජාතික විදුලි සදේශ සේවාවක් සැපයීම සඳහා සියලුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි වන පරිදි විශ්වාසනීය හා කාර්යක්ෂම සේවාවක්, (එවැනි සේවාවක් සැපයීම ප්‍රායෝගික නොවන අවස්ථාවල හැර) හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා, ග්‍රාමීය සේවා සහ වෙනත් ප්‍රදේශවල ජාතික යහපත පිණිස අවශ්‍ය යයි සළකනු ලබන සේවා ඇතුළුව, සපයනු ලබන බවට වග බලා ගැනීම.
- සෑම ක්‍රියාකරුවෙකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමණාකරන සම්පත් ඇති බවට සහ ඔවුන් විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.
- අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් මෙන්ම විදුලි සංදේශ උපකරණවල තත්ත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චි කරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වයක් පවත්වාගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.
- අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳව සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.
- අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරතාවයන්ගෙන් තොරව විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.
- විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්‍ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිත කිරීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චිකරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම සහ ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම පිණිස දිරි ගැන්වීම.

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම්

රජයේ ප්‍රධාන ආයතනයක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික නියාමන නියෝජිතායතනය වන අතර කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ වර්ධනය වන තරඟකාරී වෙළඳපලේ උද්ගත වන අභියෝග වලට ප්‍රතිචාරීව මහජන යහපත ආරක්ෂා කර, නියාමන ක්‍රියාවලිය ස්ථායී ලෙස ශක්තිමත් කරමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ මහජන යහපත ආරක්ෂා කිරීමයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ සේවා නොසපයන නමුත් කාර්යක්‍ෂමව හා ක්‍රමවත්ව විදුලි සංදේශ සේවා සැපයීමෙහිලා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් දිරිගන්වයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල පහසුකම් විශ්වීය මට්ටමට වැඩිදියුණු කිරීම පිණිස සියළුම විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලට සහාය වේ.

ප්‍රධාන වගකීම් පහත දැක්වේ:

- පනතේ විධිවිධාන සහ දුරකථන ක්‍රියාකරු සමාගම් වලට නිකුත් කළ බලපත්‍ර කොන්දේසි බලාත්මක කිරීම.
- බලපත්‍රලාභී ක්‍රියාකරුවන් අතර නිදහස් සහ සාධාරණ තරඟකාරිත්වයක් පවත්වා ගැනීමට දිරි ගැන්වීම.
    - දුරකථන ක්‍රියාකරු සමාගම් මහජන යහපත සලසන්නේද යන්න නිශ්චය කිරීම සහ අපක්ෂපාතී ලෙස හිතකර ක්‍රියාවන්හී නිරතවීම සඳහා තරඟකාරිත්වය පිරික්සීම.
    - ජාල හා සේවා අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට වග බලා ගැනීම.
    - විවෘත ප්‍රවේශය, අවහිරතා නැති කිරීම සහ විනිවිද පෙනෙන බලපත්‍ර ක්‍රියාවලියක් ඇති කිරීමට හැකි වන පරිදි පොදු නීති රාමුවක් සකස් කිරීම.
- මිල
  පොදු මහජනතාවට දුරකථන ක්‍රියාකාර සමාගම්වල මිල දරාගත හැකිද යන්න බව සැලකිල්ලට ගෙන සාධාරණ මිල සහතික කිරීම.
- පාරිභෝගික ආරක්ෂාව
  මහජනතාව සහ පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිළි පිළිබඳව විමර්ශන පැවැත්වීමේදී සවන් දීමට ඇති කැමැත්ත, සන්නිවේදනය සහ මහජන සහභාගීත්වය දිරිගැන්වීම සහ මහජන සුරක්ෂිතතාවය ඇති කිරීම.
- සමාජ නියාමනය
    - විශ්වීය ප්‍රවේශය/සේවා
    - ග්‍රාමීය ප්‍රජාව, වැඩිහිටි ජනතාව සහ විවිධ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට විශ්වීය ප්‍රවේශ/සේවා සැපයීමට වග බලා ගැනීම.
    - හදිසි අවස්ථාවකදී ක්‍රියා කිරීම සඳහා පූර්ව සූදානමින් සිටීම.
    - විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට විදුලි සංදේශ සේවා සැපයීම.
- අඩු පහසුකම් සහ සීමිත සම්පත් නියාමනය කිරීම
    - සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරනය (Spectrum Management)
    - අංකනය (Numbering)
    - නීත්‍යානුකූල අවසරය ලබාදීම (Right of Way)
    - අවකාශ පරාස (Space Segment)
    - අන්තර් සම්බන්ධතාවය (Interconnection)
    - ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථාන වලට ප්‍රවේශවීම (Access to International Landing Stations)
    - ප්‍රධාන ජාතික ජාල වලට ප්‍රවේශවීම (Access to Backbone)
- ගුණාත්මක විදුලි සංදේශ සේවා
  පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයෙන් අවශ්‍යතාවයන් සපුරාලන ලෙස සාධාරණ හා දරාගත හැකි පරිදි ඉහළ ගුණාත්මක භාවයකින් යුතුව විදුලි සංදේශ සේවා සැපයීමට වගබලා ගැනීම.
- යහපාලනය ප්‍රවර්ධනය කිරීම
  ස්වාභාවික යුක්තියේ මූලධර්ම පිළිපදිමින් කාලෝචිත තීරණ ලබාදීම, මහජන සහභාගීත්වය දිරිගැන්වීම හා විනිවිද පෙනෙන තීරණ ක්‍රියාවලියක් ඇති කිරීමට වග බලා ගැනීම.

- සාධාරණ සහ ඒකපාර්ශවීය නොවූ තීරණ ලබාදීමට වග බලා ගැනීම.
- සිවිල් සමාජය නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයෙන් හෙබි දැනුවත් සමාජයක් බවට ගොඩනැංවීමට සහායවීම.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ අදාල ජාත්‍යන්තර සංවිධාන විසින් විදුලි සංදේශ උපකරණ සහ තාක්‍ෂණික ප්‍රමිතීන් සම්බන්ධයෙන් පනවන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියළුම විදුලි සංදේශ ක්‍රියාකරුවන් හා එක්ව කටයුතු කිරීමට වග බලා ගැනීම.

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් නියාමන කාර්යයන් ඉටු කිරීමෙහිලා නිරත වේ.

- බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ පටිපාටිය සහ බලපත්‍ර ප්‍රදානය කිරීම
    - පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය. පනතේ 17 වන වගන්තියට අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් දෙන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේවුවද පනතේ 20 වන වගන්තියේ බලපත්‍ර ආදියෙන් නිදහස් කිරීම සඳහන් කර ඇත.
    - පනතේ 22 වන වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත හා ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය. විදුලි සංදේශ පනතේ 22 (1) වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක පාවිච්චි නොකළ යුතුය.
    - පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර. පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිශ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය.
- අයක්‍රම නියාමනය කිරීම
    - පනතේ 5 (ඔ) වගන්තියේ නියමයන් ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති බලතල අනුව අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් අයක්‍රම හෝ අයක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්වය කිරීම.
    - පනතේ 5 (1) ප්‍රකාරව අන්තර්ජාල ගාස්තු අනුමත කිරීම/නිශ්වය කිරීම.
- විදුලි සංදේශ පනත (ඒ යටතේ වූ නීති සහ රීති ඇතුලත්ව) සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රවල අනුකූලතාවය පිරික්සීම සහ සහතික කිරීම.
- ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි ලෙස පාවිච්චි කිරීමට වගබලා ගැනීම මෙන්ම පිරික්සීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම.
- පාරිභෝගික පැමිණිලි සහ විමර්ශන/පරීක්‍ෂණ පැවැත්වීමට ප්‍රතිචාර දැක්වීම.
  පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා පිළිබඳව විදුලි සංදේශ සේවා දායකයකු හෝ මහජනයා අතුරින් කෙනෙකු හෝ විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට අවශ්‍යයයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් කොමිෂන් සභාවට පැවැත්විය හැකි අතර කාරණයට අදාල අවස්ථානුගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද සැලැස්විය යුතුය. පනතේ 9(2) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේදී, පනතේ 9(1) ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි පෙනී යන පරිදි එවැනි ක්‍රියාමාර්ග ගන්නා ලෙස එකී දුරකථන ක්‍රියාකාර සමාගම් වලට නියම කළ හැකි අතර අවශ්‍යයැයි හැඟෙන පරිදි මූල්‍යය වන්දි ගෙවන ලෙසද නියම කළ හැකිය.
- විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ විවිධත්වය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම සහ මහජන ක්‍රියාවලීන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේදී ඔවුන්ගේ සහභාගීත්වය දිරි ගැන්වීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/ ජාත්‍යන්තර හා විදේශීය ආයතනවල කටයුතු වලදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.
- කොමිෂන් සභාව විසින් නියෝග, උපදෙස් හා තීරණ නිකුත් කිරීම.
  කොමිෂන් සභාව නියෝග, උපදෙස් සහ තීරණ නිකුත් කිරීම සම්බන්ධයෙන් විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. ප්‍රසිද්ධ විභාග සහ සෙසු සමුළු වලට සහභාගීවන සහ ඒවා නියෝජනය කරන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ක්‍රියාකරුවන්ට, පාරිභෝගිකයින්ට සහ වෙනත් ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වැඩි අවස්ථාවක් ලබා දෙනු ලැබේ.
- විදුලි සංදේශ උපකරණ සහ මාදිලි අනුමැතිය සඳහා තාක්‍ෂණික ප්‍රමිතීන් සඳහන් කිරීම.

### අන්තර් අංශ සහයෝගීතාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා අංශ/ඒකක කිහිපයක් තිබේ. 2024 වර්ෂයේ අංශ/ඒකකවල ප්‍රධාන කාර්යයන් සහ කාර්ය සාධනය මෙම වාර්තාවේ අදාළ අංශවල විස්තර කර ඇත. නිශ්චිත අංශයක්/ඒකකයක් යටතේ යම් යම් ක්‍රියාකාරකම් ලැයිස්තුගත කර ඇතත්, එම ක්‍රියාකාරකම් වෙනත් අංශ/ඒකකවල සහය ඇතිව එම නිශ්චිත අංශය/ඒකකය විසින් සිදු කර ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

# කොමිෂන් සභාව සහ විධායක කළමනාකාරිත්වය



**වරුණ ශ්‍රී ධනපාල මහතා**
**කොමිෂන් සභා සභාපති**

වරුණ ශ්‍රී ධනපාල මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර වසර 24 කට අධික සේවා පළපුරුද්දක් ඇත. 2024 නොවැම්බර් මස සිට ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් ලෙස පත් කරන ලදී. ඔහු මීට පෙර ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ) (2020 සැප්තැම්බර් - 2024 නොවැම්බර්) සහ දත්ත ආරක්ෂණ අධිකාරියේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් (2023 නොවැම්බර් - 2024 නොවැම්බර්) ලෙස සේවය කර ඇත.

නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලයේ (2012 – 2014) අමාත්‍ය උපදේශක ලෙස ධනපාල මහතා තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට දායක විය. 2013 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ඒකමතිකව ඔහුව ආර්ථික හා මූල්‍ය කමිටුවේ උප සභාපති ලෙස තෝරා පත් කළ අතර තාක්ෂණය සහ ගෝලීය ගැටළු පිළිබඳ ප්‍රධාන යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් කටයුතු කළේය.

ඔහු ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන උපාධි ආයතනයෙන් (ජපානය) ජාත්‍යන්තර සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අනුබද්ධ පශ්චාත් කළමනාකාරිත්ව ආයතනයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් භූ විද්‍යාව සහ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය ලබා ඇත. ධනපාල මහතා ශ්‍රී ලංකා පරිගණක සංගමයේ (CSSL) වෘත්තීය සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා ජපන් උපාධිධාරීන්ගේ සංගමයේ (JaGAAS) ප්‍රධාන ලේකම්වරයා ද වේ.



**එයාර් වයිස් මාර්ෂල් බන්දුල හේරත් මහතා (විශ්‍රාමික)**
**අධ්‍යක්ෂ ජනරාල්**

වර්තමානයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස සේවය කරන, එයාර් වයිස් මාර්ෂල් බන්දුල හේරත් (විශ්‍රාමික; ශ්‍රී ලංකා ගුවන් හමුදාව) මහතා අඛණ්ඩ නිකැළැල් සේවා වාර්තාවකින් හෙබි, උද්‍යෝගිමත් නිලධාරියෙකි. ඔහු සතුව ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර 32 කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහුගේ නායකත්වය සියලුම දෙනාගේ පිළිගැනීමට ලක්ව ඇති අතර සිය කණ්ඩායම් සාමාජිකයින්ට මහපෙන්වීම ලබා දෙමින්, පවරා ඇති ඉලක්ක සාක්ෂාත් කර ගැනීමෙහි ලා ඔවුන්ට අභිප්‍රේරණය ලබා දී ඇත. කළමනාකරණ සහ නායකත්ව කුසලතා පිළිබඳ ඔහුගේ වෘත්තීය දැනුම සමඟින්, කෙටිකාලීන සහ දිගු කාලීන ක්‍රියාමාර්ග හරහා විවිධාංගීකරණය වූ ප්‍රවේශයන් ඔස්සේ ඔහු අර්බුදකාරී තත්වයන් සාර්ථකව ජයගෙන ඇත.

ඔහු දේශීය හා විදේශීය කීර්තිමත් විශ්ව විද්‍යාල වලින් තම සේවා ක්ෂේත්‍රයේ ඉහළ මට්ටමේ අධ්‍යයන හා වෘත්තීමය සුදුසුකම් ලබා ඇත. ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ගැඹුරු ප්‍රායෝගික මෙන්ම න්‍යායාත්මක දැනුමක් ඔහු සතුව ඇත. ඔහු 1987 ජූලි 21 වන දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ 5 වන කැඩෙට් නිලධාරී බඳවා ගැනීම සමඟ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බැඳුණි. ඔහු ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ආරක්ෂක අධ්‍යයනය) ලබා ඇත. එමෙන්ම ඔහු ඉන්දියාව, පකිස්ථානය, සිංගප්පූරුව, ඊශ්‍රායලය සහ ඕස්ට්‍රේලියාව වැනි විවිධ රටවල විශේෂිත පුහුණුව ලබා ඇත.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වසර 32 කට අධික ඔහුගේ කීර්තිමත් සේවා කාලය තුළ, ඔහු ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශය තුළ නැගෙනහිර කලාපයේ කලාප සංඥා නිලධාරී, රත්මලාන ගුවන් හමුදා කඳවුරේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු අංශයේ අණදෙන නිලධාරී, ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉලෙක්ට්‍රොනික මාණ්ඩලික නිලධාරී සහ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු නියෝජ්‍ය අධ්‍යක්ෂ වැනි ප්‍රධාන තනතුරු රාශියක් දරා ඇත.

ඔහුගේ කීර්තිමත් හමුදා ජීවිතය තුළ, ඔහු උත්තම සේවා පදක්කම, ශ්‍රී ලංකා ගුවන් හමුදා 50 වන සංවත්සර පදක්කම, ශ්‍රී ලංකා සන්නද්ධ සේවා දිගු සේවා පදක්කම සහ පළඳනාව, 50 වන නිදහස් සංවත්සර අනුස්මරණ පදක්කම, නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම සහ පළඳනාව, උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම, උතුරු සහ නැගෙනහිර මෙහෙයුම් පදක්කම සහ පළඳනාව, පූර්ණ භූමි පදක්කම සහ රිවිරැස මෙහෙයුම් පදක්කම යන පදක්කම් වලින් පිදුම් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස නිල ලාංඡනය සාඩම්බරයෙන් පැළඳි Y-8 ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කර ඇති නිලධාරියෙකි.



**අරුණ චමින්ද කුකුලේගම මහතා**
**කොමිෂන් සභා සාමාජික**

අරුණ කුකුලේගම මහතා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලබා ගත් අතර 2010 දෙසැම්බර් මාසයේදී නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දෙන ලදී. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් මධ්‍ය මට්ටමේ වෘත්තීය සුදුසුකම් ලබා ඇත.

2002 වසරේ සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් නිලධාරියෙකු ලෙස සේවය කරමින් සිට ඇත. ආදායම් නිලධාරියෙකු ලෙස, පුද්ගල, හවුල්කාරිත්ව සහ ආයතනික මට්ටමේ බදු නිරාවරණය සහ නීති අංශයේ සේවා පළපුරුද්ද අත් කරගෙන ඇත. එමෙන්ම බදු පරිපාලන සහ ධාරිතා ගොඩනැංවීම පිළිබඳ විෂයය ක්ෂේත්‍ර වලට අදාළ දේශීය හා විදේශීය පුහුණුවීම් ලබා ගන්නා ලදී. දැනට ඉහළ මට්ටමේ ආයතනිකමය ආයතනයක නියෝජ්‍ය කොමසාරිස් තනතුර දරන අතර කැලණිය විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ ශාස්ත්‍රපති උපාධිය ද (2023 කණ්ඩායම) හදාරමින් සිටියි.



**ආර්.එම්.ආර්.එස්. රණබාහු මහතා**
**කොමිෂන් සභා සාමාජික**

රුක්ෂාන් රණබාහු මහතා ජ්‍යෙෂ්ඨ මෘදුකාංග ඉංජිනේරුවෙකු වන අතර දැනට නවසීලන්ත මෘදුකාංග සමාගමක සේවය කරන විදුලි සංදේශ ඩිජිටල්කරණ මෘදුකාංග සංවර්ධනය පිළිබඳ විශේෂ නිපුණතාවයකින් හෙබි ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර 5 කට අධික පළපුරුද්දක් ඇති නිලධාරියෙකි.ඔහුට විවිධ වෘත්තීමය පසුබිමක් ඇති අතර, මීට පෙර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු ලෙස සේවය කර ඇත. අනුරාධපුර, තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා වශයෙන් සේවය කිරීමෙන් ඔහු වටිනා අත්දැකීම් ලබා ගත් අතර, එහිදී ඔහු විවිධ පරිපාලන කටයුතු සහ රාජ්‍ය සේවා වැඩසටහන් වලට සම්බන්ධ විය. රුක්ෂාන් මහතා මොරටුව විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (ගෞරව) උපාධිය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව ලබා ඇත. මෙම සුවිශේෂී තාක්ෂණික විශේෂඥතාව සහ රාජ්‍ය පරිපාලන අත්දැකීම් සම්මිශ්‍රණය සමඟින්, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සඳහා ඵලදායී ලෙස දායක වීමට ඔහු මනාව සන්නද්ධව සිටී.



**අතුල බණ්ඩාර හේරත් මහතා**
**කොමිෂන් සභා සාමාජික**

නීතිඥ අතුල බණ්ඩාර හේරත් මහතා (LL.B ශ්‍රී ලංකාව) 1986 වසරේ දී නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දුන් අතර ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, කොළඹ දිස්ත්‍රික් අධිකරණය මෙන්ම දිවයිනේ අනෙකුත් පිට පළාත්වල දිසා අධිකරණවල ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු ලෙස කටයුතු කළේය.

ඔහු මහජන බැංකුව, සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම, හපුගස්තැන්න වැවිලි සමාගම, සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම, කැස්බෑව නගර සභාව, ලංකා සෙරමික් සමාගම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම, කොමර්ෂල් ක්‍රෙඩිට් පීඑල්සී සහ ඛනිජ තෙල් සංස්ථාව යන ආයතනවලට වෘත්තීය සේවාවන් සපයයි.

ජනසවිය භාරකාර අරමුදලේ ක්‍රියාකාරකම් විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමසාරිස් ලෙස හේරත් මහතා පත් කරන ලද අතර, ඔහුගේ විචක්ෂණශීලී හැකියාව සහ විශ්වාසවන්තභාවය කෙරෙහි ඉමහත් විශ්වාසය ඇති කරමින්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයට ඔහු පත් කරන ලද අතර වසර පහක් මණ්ඩලයේ සේවය කළේය. ඔහු වසර පහක් කොළඹ ගෙවල් කුලී මණ්ඩලයේ සභාපතිවරයා ලෙසද කටයුතු කළේය.

නීතිඥ අතුල බණ්ඩාර හේරත් මහතා ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම සහ වරාය අධිකාරිය යන ආයතනවල අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සේවය කර ඇත.

ඔහු නීතිඥයින් සහ විනිසුරුවන් සඳහා නිර්දේශිත ග්‍රන්ථයක් වන 2006 දී ප්‍රකාශයට පත් කරන ලද “සාක්ෂි ආඥා පනත පිළිබඳ නඩු නීතිය” හි කතුවරයා වන අතර 2014 සිට 2021 දක්වා “ශ්‍රේෂ්ඨාධිකරණ නීති වාර්තාව” (A.B.H.Law Report) සම්පාදකයා වේ.



**තරලිකා ලිවේරා මහත්මිය**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් / නියාමන කටයුතු**

තරලිකා ලිවේරා මහත්මිය, 1994 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව කලින් විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය, වශයෙන් පැවති අවදියේ ඉංජිනේරුවරියක (II පන්තියේ II ශ්‍රේණිය) වශයෙන් සේවයට එක්වූ අතර, විදුලි සංදේශ නියාමනයෙහි වසර 30 කට අධික පුළුල් පළපුරුද්දක් සහිත නිලධාරිනියක වේ. දැනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරයි.

ඇය පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව (විදුලි හා ඉලෙක්ට්‍රොනික) පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ එක්සත් රාජධානියේ ෂෙෆීල්ඩ් හලාම් විශ්ව විද්‍යාලයෙන් (Sheffield Hallam University) ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත.

ලිවේරා මහත්මිය වෘත්තියෙන් වරලත් ඉංජිනේරුවරියක (CEng) වන අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලයේ ලියාපදිංචි වී ඇත. ඇය එක්සත් රාජධානියේ ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවකි. ඇය දකුණු ආසියාව සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවේ ප්‍රතිපත්ති සහ නියාමන සංසදයේ උප සභාපතිත්වය දරන අතර ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම් - 1 සහ අධ්‍යයන කණ්ඩායම් - 2 හි පුළුල් පරාස දත්ත සේවා අධ්‍යයනය පිළිබඳ උප වාර්තාකරු ලෙස සේවය කළාය. ඇයගේ වෘත්තීය ජීවිතය තුළ, ඇය විදුලි සංදේශ ප්‍රතිපත්ති සහ නියාමනය පිළිබඳ පුළුල් ජාතික සහ ජාත්‍යන්තර අත්දැකීම් ලබා ඇති අතර, උපායමාර්ගික තීරණ ක්‍රියාත්මක කිරීමට ඇයගේ එම අත්දැකීම් කොමිෂන් සභාවට බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇත.



**කේ.එස්.එම්. විශාඛා මෙනවිය**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් / සංවර්ධන**

කේ.එස්.එම්. විශාඛා මෙනෙවිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) වසර 30 කට අධික සේවා පළපුරුද්දකින් හෙබි නිලධාරිනියක වන අතර, ඇය 1994 වසරේ දී ඉංජිනේරුවරියක වශයෙන් සේවයට එක් වූවාය. වර්ණාවලි කළමනාකරණය, විදුලි සංදේශ ජාල, අංකනය සහ ජාත්‍යන්තර සබඳතා යන විෂයය ක්ෂේත්‍ර පිළිබඳව ඇයට අත්දැකීම් ඇත. ඇය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වර්ණාවලි කළමනාකරණ සහ ජාල අංශවල නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ ලෙස සේවය කර ඇත.

ඇය 1993 වසරේ දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය ලබා ගත්තාය. එමෙන්ම ඇය මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පිළිබඳ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය (M.Eng.) ලබා ඇත. ඇය එක්සත් රාජධානියේ ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ (IET) වරලත් ඉංජිනේරුවරියක වන අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලයේ වරලත් සාමාජිකාවක් ද වේ.

ඇය වර්ණාවලි කළමනාකරණ අංශයේ වසර 16 කට වැඩි කාලයක් සේවය කර ඇති අතර, එහිදී ප්‍රධාන ව්‍යාපෘති රැසකට දායක වෙමින් ගුවන් විදුලි සන්නිවේදනය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් උපයා ඇත. මෙම කාලය තුළ ඇය ලෝක ගුවන් විදුලි සම්මන්ත්‍රණ කිහිපයකදීම ශ්‍රී ලංකාව නියෝජනය කළාය. ජාල අංශයේ වසර දහයකට වැඩි කාලයක් සේවය කිරීමෙන් අංකනය සහ ජාලකරණය පිළිබඳ පුළුල් දැනුමක් ද ලබාගෙන ඇත.



**ඊ.එන්.පී.කේ. රත්නපාල මහතා**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රතිපත්ති සහ සැලසුම්**

ශ්‍රී ලංකා විදුලි සංදේශ කර්මාන්තයේ නියාමන අංශයේ වෘත්තීමය ඉංජිනේරුවරයකු ලෙස වසර 31 කට වැඩි සේවා කාලයක් සපුරා ඇති නිහාල් රත්නපාල මහතා, ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ ක්ෂේත්‍රයේ පුළුල් අත්දැකීම් ලබා ඇති නිලධාරියකු වන අතර, ශබ්ද සහ රූපවාහිනී විකාශන අංශය ඇතුළු ගුවන් විදුලි සන්නිවේදන කර්මාන්තයේ ප්‍රධාන වර්ධනයන් සඳහා දායක වී ඇත. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය මෙහෙයවීමේදී ඔහු ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත.

ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) උපාධිය සහ මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශනය පිළිබඳ විශේෂඥ ඉංජිනේරු (MEng) උපාධිය ලබා ඇත. ඔහු ඉංජිනේරු කවුන්සිලය (එක්සත් රාජධානිය) සහ ඉංජිනේරු කවුන්සිලය (ශ්‍රී ලංකාව) යන ආයතන වල ලියාපදිංචි වරලත් ඉංජිනේරුවරයකු වන අතර ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ - IET (එක්සත් රාජධානිය) සහ ඉංජිනේරු ආයතනයේ (ශ්‍රී ලංකාව) සාමාජිකයෙකි. ඔහු 1994 වසරේ සිට බොහෝ ජාත්‍යන්තර සංවිධානවලින් විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත දැනුම සහ අත්දැකීම් ලබාගෙන ඇති අතර, බොහෝ අවස්ථාවලදී ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) විසින් පවත්වන ලද ලෝක ගුවන්විදුලි සන්නිවේදන සමුළුව සඳහා වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අනෙකුත් කලාපීය නියාමන ක්‍රියාකාරකම්වලදී ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත.



**එම්.කේ. ජයන්ත මහතා**
**අධ්‍යක්ෂ / මූල්‍ය**

එම්.කේ. ජයන්ත මහතා, මූල්‍ය හා පරිපාලනය පිළිබඳ දැනුම හා විශේෂඥතාවය සහිතව 2013 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සම්බන්ධ විය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී විශේෂ උපාධිය ලබා ඇති අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකි. ඊට අමතරව, ඔහු එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ වෘත්තීමය සාමාජිකයකු, සහ එක්සත් රාජධානියේ පිරිවැය සහ විධායක ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු ද වේ.

තම සුදුසුකම් තවදුරටත් වැඩිදියුණු කරමින්, ජයන්ත මහතා ඇමරිකා එක්සත් ජනපදයේ හොනොලුලු විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (MBA) උපාධිය ලබා ඇත. ඔහුගේ වෘත්තීය ජීවිතය මුළුල්ලේ, ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති අතර, විශේෂයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් ප්‍රදානය කරන රාජ්‍ය අංශයේ හොඳම වාර්ෂික වාර්තාව සඳහා සම්මානය ඇතුළු කුසලතා සම්මාන කිහිපයක් දිනා ගැනීමට සමත් වී ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සම්බන්ධ වීමට පෙර, ජයන්ත මහතා මූල්‍ය හා පරිපාලන ක්ෂේත්‍රයේ වසර 18 කට වැඩි පළපුරුද්දක් අත් කරගෙන ඇති අතර, ශ්‍රී ලංකාවේ කීර්තිමත් නිෂ්පාදන, වෙළඳ සහ සේවා සංවිධාන කිහිපයකම සමූහ මූල්‍ය පාලක, මූල්‍ය හා පරිපාලන කළමනාකරු සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී වැනි ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හෙබවීය. ඔහුගේ රැකියා අත්දැකීම් තුළින් උකහාගත් දැනුම හා කුසලතා සම්භාරය හේතුවෙන් ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා ඉතා වටිනා සම්පතක් බවට පත්ව ඇත.



**එම්.ජේ.එස්. රවිසිංහ මහතා**
**අධ්‍යක්ෂ / පාලන සහ ආයතනික කටයුතු**

ජගත් රවිසිංහ මහතා 2023 වසරේ අප්‍රේල් මස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන හා ආයතනික කටයුතු අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. ඔහු ආයතනයේ පාලන, ආයතනික කටයුතු සහ මානව සම්පත් සංවර්ධන කාර්යයන්හි වගකීම දරයි. ඔහු වසර 20 ක සේවා පළපුරුද්දකින් හෙබි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට තෝරාගෙන ඇත.

ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ඇත. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ජපානයේ ටෝකියෝ හි ප්‍රතිපත්ති අධ්‍යයන උපාධි ආයතනයෙන් (GRIPS) රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත.

රවිසිංහ මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ගණිත අංශයේ තාවකාලික ප්‍රදර්ශක (Demonstrator) /උපදේශකවරයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. පසුව, ඔහු 2004 ජූලි මාසයේ දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් වූ අතර, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සහකාර කොමසාරිස් පරිපාලන, නියෝජ්‍ය කොමසාරිස් සමෘද්ධි සහ නියෝජ්‍ය කොමසාරිස් සංවර්ධන යන තනතුරු හෙබවීය. ඉන්පසුව, ඔහු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සහකාර පාලක ප්‍රසම්පාදන, සහකාර පාලක ගමන් බලපත්‍ර සහ නියෝජ්‍ය පාලක ගමන් බලපත්‍ර යන තනතුරු දැරීය. ඉන් අනතුරුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුයුක්තව අධ්‍යක්ෂ සංවර්ධන, වැවිලි අධීක්ෂණ හා කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ, පොල් වගා කිරීමේ මණ්ඩලයේ වැඩබලන සාමාන්‍යාධිකාරී, තේ පර්යේෂණ මණ්ඩලයේ වැඩබලන සභාපති, සහ තේ ශක්ති අරමුදලේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් කටයුතු කළේය. ඉන් අනතුරුව, ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන සහ ආයතනික කටයුතු අධ්‍යක්ෂ වශයෙන් සේවයට එක් විය.



**ඉංජිනේරු ජේ.ඒ.එස්. ගුණානන්ද**
**අධ්‍යක්ෂ / සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ**

ඉංජිනේරු ජේ.ඒ.එස්. ගුණානන්දන මහතා විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ වසර 31 කට වැඩි පළපුරුද්දක් සහිත මනා දැනුමකින් හෙබි පළපුරුදු වෘත්තිකයෙකි. ඔහු 1994 දී ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා පෞද්ගලික අංශයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, එම වසර හතරක කාලය තුළ වටිනා අත්දැකීම් ලබා ඇත.

1998 වසරේ දී ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට (TRCSL) සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස සම්බන්ධ විය. එතැන් සිට, ඔහු නියාමන ප්‍රතිපත්ති මෙහෙයවීමේදී සහ රටේ සෙලියුලර් ජංගම දුරකථන කර්මාන්තයේ පරිවර්තනීය වෙනස්කම් ඇති කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. ඔහුගේ දායකත්වය ජංගම දුරකථන ක්‍රියාකරුවන් සහ රාජ්‍ය ආයතන අතර සහයෝගීතාවය වැඩිදියුණු කිරීමට සහ එමගින් වේගවත්ව ජාල ව්‍යාප්ති පහසුකම් සැපයීමට හේතු වී ඇත.

අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා කැපවී සිටින ඉංජිනේරු ගුණානන්දන මහතා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත. ඔහු වරලත් ඉංජිනේරුවෙකු වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL), ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලය (ECSL) සහ ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය (IET) ඇතුළු කීර්තිමත් වෘත්තිමය ආයතනවල ආයතනික සාමාජිකත්වය දරයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වර්ණාවලි කළමනාකරණ අධ්‍යක්ෂවරයා වශයෙන්, ඉංජිනේරු ගුණානන්දන මහතා ජාතික වශයෙන් වැදගත් වැඩසටහන් කිහිපයකට නායකත්වය ලබා දෙයි. ඔහුගේ වගකීම් අතරට වර්ණාවලි රෙගුලාසි කෙටුම්පත් කිරීම, වර්ණාවලි නිෂ්කාශනය සහ 5G වැනි නව තාක්ෂණයන් සඳහා වෙන්දේසි සිදු කිරීම, මාදිලි අනුමැතිය තුළින් විදුලි සංදේශ උපාංග ප්‍රමිතිකරණය කිරීම සහ කර්මාන්ත ආරවුල් නිරාකරණය කිරීම ඇතුළත් වේ.



**ඉන්ද්‍රජිත් හඳපාන්ගොඩ මහතා**
**අධ්‍යක්ෂ / තරඟකාරීත්ව**

ඉන්ද්‍රජිත් හඳපාන්ගොඩ මහතා 1994 වසරේ දී ශ්‍රී ලංකා Blue-Chip සමාගම් සමූහයේ විධායක නිලධාරිවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලද අතර 1998 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මධ්‍යම කළමනාකාරිත්වයට එක් විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආර්ථික කටයුතු අංශයේ සහ තරඟකාරීත්ව අංශයේ වසර 27 ක සේවා කාලය තුළ ඔහු අන්තර් සම්බන්ධතාවය, අයකුම, බලපත්‍ර, ආවේක්ෂණ යනාදී ප්‍රධාන නියාමන කාර්යයන් මෙහෙයවා ඇත. 2002 වසරේ දී ඔහු ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ උපායමාර්ග සකස් කිරීමේ උපදේශන ක්‍රියාවලිය සම්බන්ධීකරණය කරන ලද අතර එම උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා දායක විය. ඉන්ද්‍රජිත් මහතා 2000, 2001 සහ 2002 වසර වලදී ශ්‍රී ලංකා ටෙලිකොම්හි අයකුම තුලනය කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවන ලදී. ඔහු 2003 වසරේ දී විදුලි සංදේශ ක්ෂේත්‍රයට අන්තර්සම්බන්ධතා රීති හඳුන්වාදීම සහ 1999, 2010 සහ 2022 වසර වලදී අන්තර් සම්බන්ධීය තීරණ නිකුත් කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. එමෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වන ලද ප්‍රසිද්ධ විභාග තුනෙන්, විභාග දෙකක් සඳහා මහජන විමර්ශන කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත. පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලියේ දී තාක්ෂණික විශේෂඥතාව ලබා දීම සඳහා පත් කරන ලද ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයෙකු වූ ඉන්ද්‍රජිත් මහතා 2024 වසරේ දී සිදු කරන ලද පනත සංශෝධනය කිරීමේ කාර්යයට ක්‍රියාකාරීව දායක විය. තවද, 2024 අංක 01 දරන තරඟකාරීත්ව රීති හඳුන්වා දීම සඳහා ලෝක බැංකු උපදේශකයින් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

ඔහු විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත සියලුම බදු / අයබදු රැස්කිරීමේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරන අතර මුදල් අමාත්‍යාංශය සමග එක්ව එම බදු ආශ්‍රිත කරුණු මෙහෙයවයි. දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් සිය ජාල සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශීය විශේෂඥයින්ගේ සේවය ලබා ගැනීමට ඉදිරිපත් කරන වීසා ඉල්ලීම් ලිපි ඇගයීමට ලක් කර, එම වීසා නිකුත් කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නිර්දේශ ලිපි නිකුත් කරන ලෙස රේඩියෝ අමාත්‍යාංශයට නිර්දේශ කරයි. වර්තමානයේ ඔහු පාරිභෝගික පැමිණිලි ආරාවුල් නිරාකරණය කිරීමේ අභ්‍යන්තර කමිටුවේ (ICRCC) සභාපතිත්වය දරයි.

ඉන්ද්‍රජිත් මහතා 2008 වසරේ දී දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ අන්තර්ජාල සම්මුති (IP) පාදක සේවා වල බිල්පත් සහ අයකුම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ කණ්ඩායම් නායකයෙකු ලෙස දායක විය. එමෙන්ම ඔහු 2010/2011 වසර වල දී දකුණු ආසියානු විදුලි සංදේශ නියාකමයන්ගේ සංගමයේ ජාල සහ සේවා පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සභාපති විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කරමින් ඉන්ද්‍රජිත් මහතා ඉන්දියාව, පාකිස්තානය සහ ශ්‍රී ලංකාවේ පැවති දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ රැස්වීම් වලට සහභාගී වූ අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ විවිධ විෂයය කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම් රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී විය. ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ එක්සත් රාජධානියේ Coventry හි Cable and Wireless College විසින් පවත්වන ලද විදුලි සංදේශ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ඇතුළු දේශීය සහ ජාත්‍යන්තර ආයතන මඟින් විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත පුළුල් දැනුමක් සහ පුහුණුවක් ලබා ගත්තේය. ඔහු ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ යාවජීව සාමාජිකයෙකි. ඉන්ද්‍රජිත් මහතා පිළිවෙලින් කොළඹ විශ්ව විද්‍යාලය (ශ්‍රී ලංකාව) සහ Flinders විශ්වවිද්‍යාලය (දකුණු ඕස්ට්‍රේලියාව) යන විශ්ව විද්‍යාලවලින් ව්‍යාපාර පරිපාලනය (MBA) සහ රාජ්‍ය පරිපාලනය (MPA) පිළිබඳ පශ්චාත් උපාධි දෙකක් ලබා ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව (ගෞරව) උපාධිධාරියෙකි.



**එස්.ඊ. වාකිෂ්ට මහතා**
**අධ්‍යක්ෂ / තොරතුරු තාක්ෂණ**

ඉංජිනේරු එස්.ඊ. වාකිෂ්ට මහතා මොරටුව විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (ඉංජිනේරු) උපාධිය සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ඇත.

ඉංජිනේරු වාකිෂ්ට මහතා වරලත් ඉංජිනේරුවෙකු වන අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ ආයතනික සාමාජිකයෙකු ද වේ.

ඔහු 2001 වසරේ දී ඉංජිනේරුවෙකු ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සම්බන්ධ විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවය කළ කාලය තුළ, ඔහු වර්ණාවලි කළමනාකරණ අංශයේ සහ ජාල අංශයේ සහකාර අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරුවල වසර ගණනාවක් සේවය කළ අතර, ඔහුගේ දැනුම සහ අත්දැකීම් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත දායක විය. ඔහු සිය වෘත්තීය ජීවිතය තුළ, දේශීය හා ජාත්‍යන්තර සංවිධානවලින් විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත පුළුල් පුහුණුව සහ තාක්ෂණික ප්‍රවණතා පිළිබඳ දැනුම අත්කර ගත්තේය.



**එල්. ගනේෂමූර්ති මහතා**
**අධ්‍යක්ෂ / බලපත්‍ර කළමනාකරණ**

එල්. ගනේෂමූර්ති මහතා පුද්ගලික ආයතනවල විවිධ තනතුරු දරා ඇති අතර 1997 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සම්බන්ධ විය. ඔහු ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික විද්‍යාවේදී (ඉංජිනේරු) උපාධිය සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ඇති අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ (IET) සාමාජිකයෙකි.

ඔහුට පරිගණක හා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වෘත්තිකයෙකු වශයෙන් වසර 32 කට අධික පළපුරුද්දක් ඇත. ඔහු 1993 වසරේ දී ශ්‍රී ලාංකීය පුද්ගලික සමාගමක පරිගණක ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර ඉංජිනේරු කළමනාකරු තනතුර දක්වා උසස් විය.

ඔහු 1997 දී කොන්ත්‍රාත් පදනම මත ඉංජිනේරුවරයෙකු ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සම්බන්ධ වූ අතර පසුව ඔහුට සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස ස්ථිර තනතුරක් ලැබුණි. බලපත්‍ර කළමනාකරණ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට උසස් වූ අතර පසුව වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස පත්විය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වසර 27 කට වැඩි සේවා කාලය තුළ ඔහු ජාල අංශය, වර්ණාවලි කළමනාකරණ අංශය සහ බලපත්‍ර කළමනාකරණ අංශයේ සහකාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ යන තනතුරු දරා ඇත. 2023 වර්ෂයේදී ඔහු අධ්‍යක්ෂ (වැඩබලන)/බලපත්‍ර කළමනාකරණ තනතුර දැරූ අතර පසුව අධ්‍යක්ෂවරයෙකු ලෙස උසස් කරන ලදී.

විදුලි සංදේශ ක්‍රියාකරු බලපත්‍ර සැකසීම සහ නිකුත් කිරීම, සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීම, කළමනාකරණය, සම්බන්ධීකරණය, බලපත්‍ර නිකුත් කිරීම සහ එහි කොන්දේසි බලාත්මක කිරීම, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සම්මුතීන් සහ ගුවන්විදුලි රෙගුලාසි ප්‍රතිපාදන මත පදනම්ව සංඛ්‍යාත ප්‍රතිපාදන වගුව යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම වැනි ක්ෂේත්‍රවල ඔහුට පුළුල් පළපුරුද්දක් ඇත. ගෝලීය සමුද්‍රීය හදිසි ආරක්ෂණ පද්ධතිය පිළිබඳ විභාගය පැවැත්වීම සහ සාර්ථක අපේක්ෂකයින් සඳහා සහතික නිකුත් කිරීම ඔහුගේ රාජකාරිය භාරව පවතී.

ඉංජිනේරු එල්. ගනේෂමූර්ති මහතා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ලෝක ගුවන්විදුලි සන්නිවේදන සමුළුවේදී (WRC) ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත. ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය(APT) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල රැස්වීම්, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් කිහිපයකට සහභාගී වීමෙන් විදුලි සංදේශ නියාමන අංශය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගෙන ඇත.



**එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය**
**අධ්‍යක්ෂ / ජාල**

ඉංජිනේරු එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය 2001 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වූ අතර මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය ලබා ඇත. ඇය වරලත් ඉංජිනේරුවරියක වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකාවක්, ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ ආයතනික සාමාජිකාවක්, සහ ඇමරිකා එක්සත් ජනපදයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ සාමාජිකාවක් ද වේ.

ඉංජිනේරු එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය ශ්‍රී ලංකා ටෙලිකොම් අනුබද්ධිත ශ්‍රී ලංකා ටෙලිකොම් (සේවා) ලිමිටඩ් හි සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර රට තුළ මෙතෙක් සිදු කරන ලද විශාලතම ටෙලිකොම් යටිතල පහසුකම් ව්‍යාපෘතිය වන 150K ටෙලිකොම් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තනතුරක් දැරීය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වසර 24 කට අධික කාලයක් පුරා දිවෙන ඇයගේ වෘත්තීය ජීවිතය තුළ, ඇය වර්ණාවලි කළමනාකරණ අංශය, ජාල අංශය මෙන්ම ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශයේ ද සේවය කර ඇත. ඇය දැනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/ජාල ලෙස සේවය කරයි.

ඉංජිනේරු එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ලෝක ගුවන්විදුලි සංදේශ සමුළුවේදී (WRC) ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත. ඇයගේ වෘත්තීය ජීවිතය තුළ ඇය ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල රැස්වීම්, වැඩමුළු සහ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමෙන් විදුලි සංදේශ නියාමන අංශය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ඇත.



**මේනකා පතිරණ මහත්මිය**
**අධ්‍යක්ෂ / අනුකූලතා සහ විමර්ශන**

මේනකා පතිරණ මහත්මිය 1994 දී ජෝන් කීල්ස් සමූහයේ ගිණුම් විධායක නිලධාරිනියක් සහ සිනමාස් සමාගම් සමූහයේ සමූහ අභ්‍යන්තර විගණකවරියක් ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළාය. ඇය 1998 දී ආර්ථික කටයුතු අංශයේ සහකාර අධ්‍යක්ෂ/ක්‍රියාකරු විශ්ලේෂණ ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව (ගෞරව) උපාධිධාරිනියක වන අතර ඉන්දියාවේ මදුරෙයි කාමරාජ් (Madurai Kamaraj) විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. කොමිෂන් සභාවේ උපදෙස් මත ඇය පාරිභෝගික සම්බන්ධතා පිළිබඳ ප්‍රධාන නියාමන කාර්යයන් හැසිරවීම සඳහා අනුකූලතා අංශයට පත් කරන ලදී.

ඇය දැනට අනුකූලතා සහ විමර්ශන අංශයේ අධ්‍යක්ෂ ධුරය දරයි. විදුලි සංදේශ කර්මාන්තයේ පාරිභෝගික කටයුතු හැසිරවීම, පාරිභෝගික ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ සන්නිවේදන සහ මාධ්‍යය සදාචාරාත්මක භාවිතය පිළිබඳ දැනුවත් කිරීම ඇයගේ ප්‍රධාන කාර්යභාරය වේ. එසේම, ඇය සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, රජයේ පාසල්වල, සියලුම පොලිස් ස්ථානවල සහ අනෙකුත් සමාජ කණ්ඩායම්වල පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ආරාධිත දේශකවරියක ලෙස කටයුතු කළාය. තවද, ඇය පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේ අභ්‍යන්තර කමිටුව (ICRCC) සම්බන්ධීකරණය කරයි. ඇය ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ (IMSL) සාමාජිකාවක ද වේ.

ඇය සතුව වසර 31 කට වැඩි කාලයක් මූල්‍ය හා නියාමන විෂයය ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් තිබේ. පතිරණ මහත්මිය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැස්වීම්වලදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කළ අතර, විදුලි සංදේශ කර්මාන්තයට අදාළ විවිධ විෂයය කරුණු පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම් රැස්වීම්වලට සහභාගී වූවාය.



**ජී.සී.පී. මොරගොඩ මහත්මිය**
**අධ්‍යක්ෂ / නීති**

ගෞරි මොරගොඩ මහත්මිය 1997 වසරේ සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන නිලධාරිනියක ලෙස කටයුතු කර ඇත. දක්ෂ නීතිඥවරියක් ලෙස, ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය සහ එක්සත් රාජධානියේ ස්ට්‍රැත්ක්ලයිඩ් විශ්ව විද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණ සහ විදුලි සංදේශ නීතිය පිළිබඳ නීතිපති උපාධිය ලබා ඇත. තවද, ඇය එක්සත් රාජධානියේ සහ අයර්ලන්තයේ වරලත් පාලන ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් වන අතර ඕස්ට්‍රේලියාවෙන් අපරාධ සහ යුක්තිය පිළිබඳ විශේෂිත සහතිකයක් සම්පූර්ණ කර ඇත. කොමිෂන් සභාවේ වසර 24 කට වැඩි පළපුරුද්දක් ඇති මොරගොඩ මහත්මිය, නීති කටයුතු අධ්‍යක්ෂවරිය ලෙස තම භූමිකාව තුළ විශිෂ්ට ලෙස කටයුතු කරන අතර, අංශය වෙත අධීක්ෂණය සහ නායකත්වය සපයයි. ඇය විවිධ ගැටළු සම්බන්ධයෙන් තීරණාත්මක නීති උපදෙස් සපයන අතර කොමිෂන් සභා තීරණ අභියෝගයට ලක්වූ ඉහළ පෙළේ නඩු රාශියක් සාර්ථකව විසඳා ඇත. කොමිෂන් සභාව සඳහා අත්‍යවශ්‍ය රෙගුලාසි, නීති සහ මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම සහ විදුලි සංදේශ සහ විකාශන නීති සඳහා වගකිව යුතු ප්‍රධාන කමිටු නියෝජනය කිරීම ඇයගේ දායකත්වයන් අතර වේ.

මොරගොඩ මහත්මිය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විවිධ ජාත්‍යන්තර සහ දේශීය සම්මන්ත්‍රණ, රැස්වීම්, වැඩමුළු, සංසද සහ පුහුණු සැසිවල සම්පත්දායකවරියක් ලෙස කටයුතු කර ඇත. සමස්තයක් වශයෙන්, මොරගොඩ මහත්මිය කොමිෂන් සභාවේ සේවය කිරීමට පෙර පෞද්ගලික අංශයේ නීතිඥවරියක සහ අධිකරණ නීතිඥවරියක ලෙස දෙඅංශයෙහිම ස්ථාවර පදනමක් ගොඩනගා ගෙන ඇති අතර, වසර 30 කට අධික පුළුල් අත්දැකීම් ඇගේ භූමිකාවට රැගෙනවිත් ඇත.



**සී.එන්. පලිහවඩන මහතා**
**අධ්‍යක්ෂ / විශේෂ ව්‍යාපෘති**

නිශාන්ත පලිහවඩන මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් සංඛ්‍යානය පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධිය ලබා ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකි.

ඔහු 1998 වසරේ දී වයඹ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය.පසුව, ලෝක බැංකුවේ කෙටිකාලීන පර්යේෂණ උපදේශකයෙකු ලෙස සේවය කිරීමෙන් අනතුරුව ඔහු මුදල් කොමිෂන් සභාවේ පර්යේෂණ නිලධාරියෙකු ලෙස සේවය කළේය. 2003 වසරේ දී, ඔහු සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සම්බන්ධ වූ අතර 2013 දී නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස උසස් කරන ලදී. පුරා වසර 20 ක් මුළුල්ලේ, ඔහු තරඟකාරිත්ව අංශය තුළ විදුලි සංදේශ අයකුම නියාමනය කිරීමේ විශේෂඥයෙකු ලෙස කටයුතු කර ඇත. 2023 දී, ඔහු විශේෂ ව්‍යාපෘති අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී.

පලිහවඩන මහතා බොහෝ වැඩසටහන් වලට සහභාගී වීමෙන් දේශීය හා ජාත්‍යන්තර අත්දැකීම් ලබා ඇත. ඔහු ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම් 03 (AO) හි උප සභාපති වශයෙන් ගෞරවනීය ධූරයක් දරයි.



**එම්.පී. ගුණසිංහ මහතා**
**අධ්‍යක්ෂ / ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා**

මුදිත ගුණසිංහ මහතා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරමින් සිටියි. ඔහුට විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 25කට වැඩි පළපුරුද්දක් ඇති අතර, එයට විදුලි සංදේශ නියාමනයේ වසර 20කට වැඩි පළපුරුද්දක් ද ඇතුළත් වේ. ගුණසිංහ මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ඇති අතර එම විශ්ව විද්‍යාලයෙන්ම විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති (ඉංජිනේරු විද්‍යාව) උපාධිය ලබා ඇත. ඔහු වරලත් ඉංජිනේරුවෙකු වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකයෙකි. ගුණසිංහ මහතා එක්සත් රාජධානියේ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (IET) සාමාජිකයෙකු ද වේ.



**රුවනි ගුණරත්න මිය**
**කොමිෂන් සභා ලේකම්**

රුවනි ගුණරත්න මහත්මිය 1998 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය.

ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී (LL. B) උපාධිය ලබා ඇති අතර නීති ක්ෂේත්‍රයේ වසර 30 ක පළපුරුද්දක් ඇති නීතිඥවරියකි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඇයගේ අත්දැකීම් වසර 26 ක් වන අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වන ලද ප්‍රසිද්ධ විභාග දෙකක සාමාජිකාවක් ලෙසත්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සාමාජිකාවක් ලෙසත්, දැනට පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීම සඳහා වන අභ්‍යන්තර කමිටුවේ සාමාජිකාවක් ලෙසත් සේවය කරයි.

2024 වර්ෂයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම සාර්ථකව සම්බන්ධීකරණය කර සම්පූර්ණ කිරීමේ වගකීම ද ඇය වෙත පැවරිණි.



**ආර්.ආර්. සමන් කිත්සිරි මහතා**
**අභ්‍යන්තර විගණක**

කිත්සිරි මහතා 2014 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට සම්බන්ධ වී ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සහ කැලණිය විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධිය ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු වන අතර, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ උසස් ඩිප්ලෝමාධාරියෙකි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වීමට පෙර, කිත්සිරි මහතා ශ්‍රී ලංකාවේ කීර්තිමත් නිෂ්පාදන, වෙළඳ සහ සේවා ආයතන රැසක සමූහ ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක සහ මූල්‍ය කළමනාකරු වැනි ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හොබවමින් අභ්‍යන්තර විගණනය, මූල්‍ය සහ බදු පිළිබඳ වසර 17 කට අධික පළපුරුද්දක් ලබා ඇත.

## විධායක කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| එයාර් වයිස් මාර්ෂල් බන්දුල හේරත් මහතා | අධ්‍යක්ෂ ජනරාල් |
| ආර්.එම්.ටී.කේ.පී. ලිවේරා මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (නියාමන කටයුතු) |
| කේ.එස්.එම්. විශාඛා මෙනෙවිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) |
| ඊ.එන්.පී.කේ. රත්නපාල මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රතිපත්ති සහ සැලසුම්) |

### බලපත්‍ර කළමනාකරණ අංශය

| | |
|---|---|
| එල්. ගනේෂමූර්ති මහතා | අධ්‍යක්ෂ |
| ටී.ජී. ප්‍රේමරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ආර්. සුතර්ශන් මහතා | සහකාර අධ්‍යක්ෂ |

### ජාල අංශය

| | |
|---|---|
| එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය | අධ්‍යක්ෂ |
| අයි.එම්. ජවුසි මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ඩබ්.එම්.එන්.ජේ. විජේරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ |
| එස්.ඩබ්.එම්.ආර්.එල්.බී. සේනාධීර මහතා | සහකාර අධ්‍යක්ෂ * |
| එස්.බී. බුලත්ගම මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ඩී.එම්.එස්.ඒ. දිසානායක | සහකාර අධ්‍යක්ෂ |
| එච්.පී.එස්. රත්නායක මහත්මිය | සහකාර අධ්‍යක්ෂ |
| ඒ.පී. මුහන්දිරම්ගේ මහත්මිය | ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරි |

### සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය

| | |
|---|---|
| ජේ.ඒ.එස්. ගුණානන්දන මහතා | අධ්‍යක්ෂ |
| එම්.සී.එම්. ෆාරුක් මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ * |
| ඩබ්.ඒ.ඩී.ටී. මධුශංක මහතා | සහකාර අධ්‍යක්ෂ * |
| ජී.එච්.පී. ඉමාලි ප්‍රශාන්තිකා මහත්මිය | සහකාර අධ්‍යක්ෂ |
| එම්.ඊ.ජේ.එස්. මුනසිංහ මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ටී.එම්.ජේ. පෙරේරා මහතා | සහකාර අධ්‍යක්ෂ |
| අයි.යූ. විජේසිංහ මහතා | සහකාර අධ්‍යක්ෂ |
| පී.ඩී.එම්.පී. ධර්මසේන මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ජේ.එල්.සී.ඩී. ලියනගේ මහත්මිය | පරිපාලන නිලධාරි |
| ටී.පී.ටී. ප්‍රනාන්දු මහතා | ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරි |
| ඩී.එස්.එස්. ජයවර්ධන මහත්මිය | ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරි |

** විදේශගතව 'වැටුප් රහිත නිවාඩු' ලබා සිටින නිලධාරීන්*

### අනුකූලතා සහ විමර්ශන අංශය

| | |
|---|---|
| එච්.පී.එච්.එම්. පතිරණ මහත්මිය | අධ්‍යක්ෂ |
| ඩී.එන්. විජේසිංහ මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ටී.ඩී.එච්. කුමාරසිරි මහත්මිය | සහකාර අධ්‍යක්ෂ |
| එම්.එච්.ඒ.ආර්. ජයසේන මහත්මිය | සහකාර අධ්‍යක්ෂ |
| වයි. මතනන් මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ආර්.පී.සී.එස්. ජිනදාස මහත්මිය | පරිපාලන නිලධාරී |

### තරඟකාරිත්ව අංශය

| | |
|---|---|
| එච්.ඩබ්.කේ. ඉන්ද්‍රජිත් මහතා | අධ්‍යක්ෂ |
| එච්.එම්. ශ්‍රියානි මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| එස්.කේ.ටී.අයි. ප්‍රභාත් මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ජී.සී.එස්. ප්‍රනාන්දු මහතා | සහකාර අධ්‍යක්ෂ |

### නීති අංශය

| | |
|---|---|
| ජී.සී.පී. මොරගොඩ මහත්මිය | අධ්‍යක්ෂ |
| එල්.එස්.පී. රොද්‍රිගු මෙනෙවිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| අයි.එන්. මැතිව් මහතා | සහකාර අධ්‍යක්ෂ |

### විශේෂ ව්‍යාපෘති අංශය

| | |
|---|---|
| සී.එන්. පලිහවඩන මහතා | අධ්‍යක්ෂ |

### ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

| | |
|---|---|
| එම්.පී. ගුණසිංහ මහතා | අධ්‍යක්ෂ |
| ටී.ජී.ජේ. රවීන්ද්‍ර මහතා | සහකාර අධ්‍යක්ෂ |

### තොරතුරු තාක්ෂණ අංශය

| | |
|---|---|
| එස්.ට්. වාකිෂ්ට මහතා | අධ්‍යක්ෂ |

### පාලන හා ආයතනික කටයුතු අංශය

| | |
|---|---|
| එම්.ජේ.එස්. රවිසිංහ මහතා | අධ්‍යක්ෂ |
| වයි.එස්.පී.පී ගුණරත්න මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| කේ.එස්.එන්. විජේරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ශ්‍යාමිලා රත්නායක මෙනෙවිය | පරිපාලන නිලධාරී |

## මූල්‍ය අංශය


| | |
|---|---|
| එම්.කේ. ජයන්ත මහතා | අධ්‍යක්ෂ |
| එල්.ඩී. ජයවික්‍රම මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ |
| ඩී.පී.සී.යූ.කේ. හේමපාල මහතා | සහකාර අධ්‍යක්ෂ |

## කොමිෂන් සභා ලේකම් කාර්යාලය

| | |
|---|---|
| ආර්.එස්. ගුණරත්න මහත්මිය | කොමිෂන් සභා ලේකම් |

## අභ්‍යන්තර විගණන අංශය

| | |
|---|---|
| ආර්.ආර්.එස්. කිත්සිරි මහතා | අභ්‍යන්තර විගණක |
| ඩී.බී.එන්. ප්‍රියදර්ශනී මහත්මිය | අභ්‍යන්තර විගණන නිලධාරී |




★★ නි. අධ්‍යක්ෂ/ස. අධ්‍යක්ෂ මූල්‍ය විමර්ශන ඇතුළුව ★ නි. අධ්‍යක්ෂ/ස. අධ්‍යක්ෂ තාක්ෂණික විමර්ශන ඇතුළුව

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් 2024 වසර සඳහා සමාලෝචන වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම බෙහෙවින් සතුටු වෙමි. ආර්ථිකය යළි ප්‍රකෘතිමත් තත්ත්වයට පත්වීම, ඩිජිටල් තාක්ෂණ භාවිතය වේගයෙන් වර්ධනය වීම සහ පරිණාමය වෙමින් පවතින ගෝලීය තාක්ෂණික ප්‍රමිතීන් නිර්මාණය වූ පසුබිමක් තුළ, සියලුම පුරවැසියන් සඳහා දැරිය හැකි, විශ්වාසදායක සහ උසස් තත්ත්වයේ විදුලි සංදේශ සේවා සැපයීම සහතික කිරීමෙහි ලා සිය වගකීම ඉටු කිරීමට කොමිෂන් සභාව නිරන්තරයෙන් කැපවී සිටියි.

අපගේ ජයග්‍රහණ මගින් විදුලි සංදේශ කර්මාන්තයේ ස්ථායීතාවය සහ නම්‍යශීලී බව ප්‍රදර්ශනය කරන අතර, එමගින් ශ්‍රී ලංකාවට අනාගත අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට සුදුසු පසුබිමක් නිර්මාණය වේ.

## විදුලි සංදේශ කර්මාන්තය

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශයේ ජංගම දුරකථන දායකත්වය 2024 වර්ෂය තුළ 2.6% කින් පහත වැටීමක් පෙන්නුම් කළ අතර, එමඟින් මුළු ජංගම දුරකථන දායකත්වය මිලියන 28.82 දක්වා පහළ වැටුණි. එමෙන්ම ස්ථාවර ප්‍රවේශ දායකත්වයන් ද සුළු අඩුවීමක් පෙන්නුම් කළේය. එසේ තිබියදීත්, රට 131.5% ක ජංගම දුරකථන ඝනත්වයක් පවත්වා ගෙන ගිය අතර එය දකුණු ආසියාවේ ඉහළම අගය වන අතර ස්ථාවර ප්‍රවේශ දුරකථන ඝනත්වය 15.7% කි. බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සඳහා ඇති ඉල්ලුම අඛණ්ඩව පිළිබිඹු කරමින් බ්‍රෝඩ්බෑන්ඩ් දායකත්වයන් මිලියන 23.14 දක්වා වර්ධනය විය. කෙසේ වෙතත්, ඩිජිටල් පරිවර්තන සැලැස්මට දායක වීම සඳහා රටේ භූගෝලීය ආවරණය තවදුරටත් පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ.

2024 වර්ෂයේදී කොමිෂන් සභාවේ මුළු ආදායම රුපියල් මිලියන 35,344 ක් වූ අතර, එයින් රුපියල් මිලියන 25,349 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී.

## සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය

ඉදිරි වසර පහ (2024-2029) සඳහා වර්ණාවලි සැලැස්ම සකසා අවසන් කර ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සැලැස්ම තුළින් 5G තාක්ෂණය ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇති අතර සංඛ්‍යාත වර්ණාවලි වෙන් කිරීම සඳහා උපායමාර්ගික රාමුවක් ගෙනහැර දක්වයි. මෙම නව තාක්ෂණය සාම්ප්‍රදායික බ්‍රෝඩ්බෑන්ඩ් සීමාවන්ට අභියෝග කරමින් අනාගත ජංගම සේවාවන් සඳහා මූලික සහ ප්‍රධාන භූමිකාවක් ඉටු කරනු ඇති අතර, එම සේවාවන් අතර අති විශ්වසනීය අඩු ප්‍රමාද සන්නිවේදන (URLLC) සහ විශාල යන්ත්‍රාත්මක සන්නිවේදන (mMTC) ඇතුළත් වේ. මෙම විවිධ පරාසවල සංඛ්‍යාත වර්ණාවලිය නිසි පරිදි ලබාගැනීමේ වැදගත්කම මෙම සැලැස්ම මගින් ගෙන හැර දක්වයි. එමෙන්ම, වේගයෙන් පරිණාමය වන විදුලි සංදේශ ක්ෂේත්‍රයට සරිලන ලෙස වරින් වර යාවත්කාලීන කිරීම් සිදු කිරීම සඳහා සමාලෝචන ක්‍රමවේද ද ඇතුළත් වේ.

මේ අතර, ජාත්‍යන්තර රාමු සහ කලාපීය සංඛයාත වර්ණාවලි වෙන් කිරීම් සමඟ අනුකූලතාවය සහතික කරමින්, ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුව (NFAT) අවසන් කර ප්‍රකාශයට පත් කරන ලදී. ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර රීති (RFSL) ද සම්පූර්ණ කර ඇත.

කොමිෂන් සභාව විසින් 4G සහ 5G සේවා සඳහා වත්මන් සහ අනාගත ඉල්ලුම, ඇති විය හැකි ආර්ථික අභියෝග සහ ශ්‍රී ලංකාවේ පරිණාමය වෙමින් පවතින වෙළඳපල පරිසරය තුළ 5G යෙදවීම සඳහා ප්‍රශස්ත උපාය මාර්ග පිළිබඳව කර්මාන්ත පාර්ශ්වකරුවන්ගෙන් අදහස් ලබා ගැනීම සඳහා 5G පිළිබඳ උපදේශන පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කළේය. මෙම උපදේශනමය ක්‍රියාවලිය මඟින් සංඛ්‍යාත වර්ණාවලිය ඵලදායී ලෙස භාවිත කිරීම සහතික කිරීම සහ නවීන බ්‍රෝඩ්බෑන්ඩ් සේවාවන් වර්ධනය කිරීමෙහි ලා සැලසුම් කිරීමට අපේක්ෂා කෙරේ.

## නියාමන ප්‍රතිසංස්කරණ

### විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම

2024 වසරේ දී ලත් සුවිශේෂී ජයග්‍රහණයක් වූයේ වසර 28 කට පසු වැදගත් නීතිමය සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් බලාත්මක කිරීමයි. මෙම සංශෝධනය මගින්, කොමිෂන් සභාවේ නියාමන බලතල තවදුරටත් ශක්තිමත් කරමින් නව බලපත්‍ර කාණ්ඩ තුනක් හඳුන්වා දී ඇත. විශේෂයෙන්ම මෙම පනත මගින්, සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කිරීම සඳහා තරඟකාරිත්වය පදනම් කරගත් රාමුවක් භාවිත කරයි, මෙම හිඟ ජාතික සම්පත වෙන් කිරීමේදී විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරයි. එය කර්මාන්ත තරඟකාරිත්වය සහ යටිතල පහසුකම් බෙදා ගැනීම පාලනය කරන, වඩාත් සමාන තරඟකාරිත්වයක් ඇති කරන සහ ආයෝජන දිරිමත් කරන පැහැදිලි විධිවිධාන තවදුරටත් ස්ථාපිත කරයි.

මෙම සංශෝධනය මගින් අධිභාර පැනවීමට, දඩ මුදල් වැඩි කිරීමට සහ ශ්‍රී ලංකාවේ ජල සීමාව තුළ ආරක්ෂිත සබ්මැරීන් කේබල් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට කොමිෂන් සභාවට බලය ලබා දී ඇත. මෙම ප්‍රතිසංස්කරණ මගින් විදුලි සංදේශ අංශයට නව ව්‍යාපාරික අවස්ථා විවෘත වන අතර, ආර්ථික හා සමාජීය සංවර්ධනය මෙන්ම ඩිජිටල් පරිවර්තනය සඳහා එහි දායකත්වය ශක්තිමත් කරයි.

### ඒකාබද්ධ බලපත්‍රකරණ රාමුව

සේවා සහ තාක්ෂණික ඒකාබද්ධතාවය ඇති කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සමඟ එක්ව සංවර්ධනය කරන ලද ඒකාබද්ධ බලපත්‍ර රාමුව හඳුන්වාදීම කෙරෙහි සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. මෙම නව රාමුව විදුලි සංදේශ සේවා සපයන්නන්ට තනි බලපත්‍රයක් යටතේ විවිධ සේවාවන් ලබා දීමට, බලපත්‍ර ක්‍රියාවලිය විධිමත් කිරීමට සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමට ඉඩ සලසයි. ඒකාබද්ධ බලපත්‍රය සඳහා පුළුල් සැලැස්මක් සකස් කර ඇති අතර, මහජන උපදේශනය සඳහා විධිවිධාන සකස් කර ඇත. මෙම මූලපිරීම හඬ, දත්ත, වීඩියෝ සහ අගය එකතු කළ සේවාවන් සැපයීමේ ක්‍රියාවලිය වඩා සරල කිරීම සඳහා සකසා ඇති අතර, එමගින් කර්මාන්තය සඳහා වඩාත් කාර්යක්ෂම හා නම්‍යශීලී නියාමන පරිසරයක් සහතික කරයි.

### විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතය

2024 වසරේ දී සිදු කරන ලද තවත් වැදගත් මූලපිරීමක් වන්නේ, ක්‍රියාකරුවන්ට සිය අතිරික්ත යටිතල පහසුකම් අනෙකුත් ක්‍රියාකරුවන් සමඟ හවුලේ භාවිත කිරීමට රාමුවක් සපයන යටිතල පහසුකම් බෙදා ගැනීමේ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමයි. යටිතල පහසුකම් හවුලේ භාවිතය විදුලි සංදේශ කර්මාන්තයට සුවිශාල ප්‍රතිලාභ ගෙන දෙන අතර, සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් කළමනාකරණය කිරීමට හැකිවීම මින් ලැබෙන ප්‍රධාන වාසියයි. යටිතල පහසුකම් හවුලේ භාවිතයෙන් ලැබෙන තවත් ධනාත්මක බලපෑම් ලෙස, ප්‍රවේශ ජාල අතර සාධාරණ තරඟකාරිත්වය ඇති කිරීම, ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ප්‍රදේශවල සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, යටිතල පහසුකම් ව්‍යාප්තිය අඩු කිරීමෙන් පරිසරය ආරක්ෂා කිරීම සහ ක්‍රියාකරුවන්ට ඔවුන් සපයන සේවාවන්හි තරඟකාරිත්වය කෙරෙහි අවධානය යොමු කිරීම ඇතුළත් වේ.

### තරඟකාරිත්ව රීති

2024 ජූලි මාසයේදී, කොමිෂන් සභාව විසින් 2024 අංක 1 දරන තරඟකාරිත්ව රීති ප්‍රකාශයට පත් කිරීමට පියවර ගත් අතර විදුලි සංදේශ වෙළඳපොළ තරඟකාරී සහ සාධාරණව පවතින බව සහතික කිරීම සඳහා තරඟකාරිත්ව රීති වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ජංගම, බ්‍රෝඩ්බෑන්ඩ් සහ යටිතල පහසුකම් ඇතුළු විදුලි සංදේශ සේවා ආර්ථික හා සමාජීය සංවර්ධනය සඳහා සාධාරණ ආකාරයකින් නියාමනය කළ යුතු බැවින්, තරඟකාරිත්ව රීති ඒකාධිකාරය සහ වෙළඳපල නීතිවිරෝධී වෙළඳපල හැසිරීම් වැළැක්වීම, පාරිභෝගික අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ අත්‍යවශ්‍ය පහසුකම් සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා උපකාරී වේ.

## විදුලි සංදේශ සම්බන්ධතා පුළුල් කිරීමේ ව්‍යාපෘති

"ගමට සන්නිවේදනය" ව්‍යාපෘතියේ රට පුරා සන්නිවේදන ආවරණය පුළුල් කිරීමේ ප්‍රගතියට ආර්ථික අර්බුදය දැඩි බලපෑමක් ඇති කළේය. මෙම මුහුණ දුන් අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, කොමිෂන් සභාව ක්‍රියාකරුවන්ට වෙන් කර ඇති සහනාධාරය වැඩි කිරීමෙන් සහ ප්‍රතිපූරණය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමෙන් ව්‍යාපෘති රාමුව ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගත් අතර, මෙම ක්‍රියාමාර්ග මගින් ක්‍රියාකරුවන් මුහුණ දෙන මූල්‍ය බාධාවන් අවම කිරීම, අඛණ්ඩව යටිතල පහසුකම් ස්ථාපනය කිරීම සහතික කිරීම සහ රට පුරා සන්නිවේදන ආවරණ ඉලක්ක සපුරා ගැනීමේ වේගය පවත්වා ගැනීමේ අරමුණ ඉටු කිරීමට උපකාරී විය.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා 2023 වසරේ දී දියත් කරන ලද පාසල් ෆයිබර් සම්බන්ධතා ව්‍යාපෘතිය මගින්, පාසල් 500කට අධික සංඛ්‍යාවකට අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය සපයා ඇති අතර, රට පුරා පාසල් 1,000කට සම්බන්ධතාවය සැපයීම අරමුණ වේ. විශේෂ ෆයිබර් ගාස්තු පැකේජයක් අනුමත කරන ලද අතර, නව ජාල පහසුකම් සැලසුම් කිරීමේදී, ගොඩනැගීමේදී, ස්ථාපනය කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී දරන ලද මුළු පිරිවැයෙන් කොටසක් බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකරුවන් සමඟ එක්ව ආවරණය කරන ලදී.

අ. පො. ස (උසස් පෙළ) විභාග සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය උගන්වන පාසල් සඳහා තාක්ෂණික සම්පත් සැපයීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම අරමුණු කරගත් සුහුරු පාසල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය සහ චීන ආධාර ව්‍යාපෘතිය සමඟ එක්ව, මෙම වැඩසටහන ක්‍රියාත්මක වීමෙන් රට පුරා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය සහ ඩිජිටල් පරිවර්තනයට සහාය වේ.

## නියාමන අනුකූලතාව

සේවා ගුණාත්මකභාවය (QoS) පිළිබඳ ප්‍රමිතීන් සහතික කිරීම සහ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සැලකිය යුතු ප්‍රයත්නයක් දරන ලදී. ස්ථාවර සහ ජංගම සේවා සැපයීම සඳහා බලපත්‍රලාභී ක්‍රියාකරුවන් පස් දෙනෙකුගේ සේවා තත්ත්ව මට්ටම් නිරීක්ෂණය කිරීමට සහ ඔවුන්ට නියම කර ඇති ඉලක්කවලට අනුකූල වීම පරීක්ෂා කිරීමට කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී. පාරිභෝගික සේවා සහ හඬ සහ පුළුල් පරාස සේවා සඳහා ජාල පරාමිතීන් පිළිබඳ ජාල විගණන සිදු කරන ලදී. බලපත්‍ර අනුකූලතාව

නිරීක්ෂණය කිරීම සඳහා පරීක්ෂණ 52 ක් සිදු කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදී. තවද, සිම් කාඩ්පත් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සත්‍යාපනය කිරීම සඳහා විගණන 64 ක් සම්පූර්ණ කරන ලද අතර, ගාස්තු පැකේජ 50 ක් පරීක්ෂා කරන ලද අතර, අයක්‍රම පැකේජ 18 ක් සඳහා විගණනයන් සිදු කර ඇත.

එමෙන්ම, ඇමතුම් වාර්තා විශ්ලේෂණය කිරීමෙන් සහ අනවසර කේබල් රූපවාහිනී සේවා ඇතුළු නීති විරෝධී විදුලි සංදේශ ක්‍රියාකාරකම් විමර්ශනය කිරීමෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට සහාය ලබා දෙන ලදී. කොමිෂන් සභාව සමාජ මාධ්‍ය ආශ්‍රිත පැමිණිලි 149 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

මාදිලි අනුමැති උපාංග මිලදී ගැනීම පිණිස පාරිභෝගිකයින් දැනුවත් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. සයිබර් හිරිහැර වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරමින්, විදුලි සංදේශ සහ සමාජ මාධ්‍යවල සදාචාරාත්මක භාවිතය පිළිබඳව හමුදාව, පොලිසිය සහ අනෙකුත් ආයතන සඳහා පවත්වන ලද සැසි 39 ක් මෙම මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් වලට ඇතුළත් විය. ගුවන්විදුලිය, රූපවාහිනිය සහ සමාජ මාධ්‍ය ඔස්සේ වැඩිදුර දැනුවත් කිරීමේ වැඩසටහන් 25 ක් ක්‍රියාත්මක කරන ලදී.

2024 වර්ෂයේදී කොමිෂන් සභාව විසින් පාරිභෝගික පැමිණිලි 2933ක් සම්බන්දයෙන් කටයුතු කර ඇති අතර, බිල්පත්, සංඥා ආවරණය, අන්තර්ජාල/දත්ත සේවා සහ හිරිහැර/කරදරකාරී ඇමතුම් ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම සඳහා විදුලි සංදේශ ක්‍රියාකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා පොලිසියේ iNeed පද්ධතිය ඔස්සේ නැතිවූ ජංගම දුරකථන ආශ්‍රිත පැමිණිලි 20,259ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට පහසුකම් සැලසීය. කොමිෂන් සභාව විසින් සිම්කාඩ්පත් ලියාපදිංචි කිරීමේ මාර්ගෝපදේශ සංශෝධනය කිරීම ආරම්භ කළ අතර බ්‍රෝඩ්බෑන්ඩ් සේවා ගුණාත්මකභාවය පිළිබඳ පරාමිතීන් සඳහා නව මාර්ගෝපදේශයක් හඳුන්වා දුන්නේය. මෙම ප්‍රයත්නයන් මගින් විදුලි සංදේශ අංශයේ සේවා ගුණාත්මකභාවය සහ පාරිභෝගික ආරක්ෂාව වැඩි දියුණු කිරීමෙහි ලා කොමිෂන් සභාවේ කැපවීම පිළිබිඹු කරයි.

## ඩිජිටල් පරිවර්තනය සහ සයිබර් ආරක්ෂාව

සමාලෝචනයට බඳුන් වන වසර තුළ කොමිෂන් සභාව සිය ඩිජිටල් පරිවර්තන මුලපිරීම් ඉදිරියට ගෙන යාමේදී කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත. ක්‍රියාකාරීත්වය, ප්‍රවේශ්‍යතාව සහ සමස්ත පරිශීලක අත්දැකීම වැඩි දියුණු කිරීම සඳහා නිල වෙබ් අඩවිය නැවත සැලසුම් කරන ලදී.

තවද, තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) සමඟ අවබෝධතා ගිවිසුමකට (MoU) එළැඹෙන ලදී. මෙම අවබෝධතා ගිවිසුමෙන් අනතුරුව, ආයතනයේ තොරතුරු තාක්ෂණ පද්ධති පිළිබඳ පුළුල් සයිබර් ආරක්ෂණ ඇගයීමක් සාර්ථකව සිදු කරන ලද අතර, එය තොරතුරු වත්කම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රශස්ත භාවිතයන් අනුගමනය කිරීමේ ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

එළැඹෙන වසර තුළ ආයතනයේ ඩිජිටල් යටිතල පහසුකම්වල ශක්තිමත්භාවය, ආරක්ෂාව සහ ස්ථායීතාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යුහගත තොරතුරු තාක්ෂණ අවදානම් ඇගයීම, ආරක්ෂක සමාලෝචන සහ ප්‍රතිපත්ති මත පදනම් වූ මාර්ගෝපදේශ හඳුන්වා දීමට නියමිතය.

## පර්යේෂණ සහ සංවර්ධන

රාජ්‍ය විශ්ව විද්‍යාල සහ රජයේ පර්යේෂණ ආයතන සඳහා මූල්‍ය ආධාර ලබා දෙමින් කොමිෂන් සභාව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. 2023 පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන යටතේ, ප්‍රධාන අධ්‍යයන දෙකක් සාර්ථකව අවසන් කරන ලදී. යාපනය විශ්වවිද්‍යාලය විසින් 5G සඳහා සුහුරු ඇන්ටෙනා නිර්මාණය පිළිබඳ අධ්‍යයනයක් සිදුකර ඇති අතර, රුහුණ විශ්වවිද්‍යාලය විසින් බ්ලොක්චේන් තාක්ෂණයෙන් සක්‍රීය ගුවන්විදුලි විකිරණ මිනුම් පිළිබඳ අධ්‍යයනයක් සිදුකර ඔවුන්ගේ අවසන් වාර්තා ඉදිරිපත් කරන ලදී. පර්යේෂකයින්ට අවශ්‍ය මූලික සම්පත් ලබාගැනීම පහසු කරමින් සහ උපාධි අපේක්ෂකයන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට වටිනා අවස්ථා සපයන බැවින්, මෙම වැඩසටහන ප්‍රශංසාවට ලක්ව ඇත.

මෙම ප්‍රවණතාවය මත පදනම්ව, කොමිෂන් සභාව විසින් 2024 වසර සඳහා නව පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනක් දියත් කළ අතර, රට පුරා විශ්ව විද්‍යාල වලින් නව පර්යේෂණ ව්‍යාපෘති පහක් තෝරා ගන්නා ලදී. තෝරාගත් ව්‍යාපෘති පහත සඳහන් විෂයයන් පිළිබඳව මූලික අවධානය යොමු කළ අතර, මෙම ව්‍යාපෘති වල ආරම්භක ඉදිරිපත් කිරීම් දෙසැම්බර් මාසයේදී සිදු කල අතර, සාර්ථක ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සහාය ද ලබා දෙන ලදී. මෙම මුලපිරීම් මගින්, කොමිෂන් සභාව පර්යේෂණ මූලික නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමේ සහ රට තුළ තිරසාර තාක්ෂණික කුසලතා ගොඩනැගීමේ සිය කැපවීම නැවතත් තහවුරු කළේය.

- ශබ්දය තුළ පුද්ගලාරෝපිත කථන බුද්ධිය වැඩි දියුණු කිරීම සඳහා අවකාශීය ශබ්ද පටිගත කිරීම සහ ප්‍රතිනිෂ්පාදනය,
- ස්වාධීන ජීවන සහාය සඳහා IoT-පාදක නින්ද නිරීක්ෂණ මෙවලම,
- දිගු කාලීන පරිණාමය - කාල විබෙදුම් ද්විත්ව සන්නිවේදන (LTE-TDD) ජාලවල වායුගෝලීය නාලිකා බාධා අවම කිරීම සඳහා යන්ත්‍ර ඉගෙනුම් - සක්‍රීය ජාල ප්‍රශස්තිකරණය.
- දෘශ්‍යාබාධිත පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික සහභාගීත්වය සහ ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම සඳහා නව්‍ය මෘදුකාංග විසඳුම්
- නගර සංගණනය කොළඹ: කොළඹ සඳහා සුහුරු සංවේදන ජාලය.

- මෙම ව්‍යාපෘති සඳහා මූලික ඉදිරිපත් කිරීම් දෙසැම්බර් මාසයේදී පවත්වන ලද අතර, ඒවායේ ප්‍රගතිය පහසු කිරීම සඳහා මූල්‍යමය සහාය ලබා දෙන ලදී.

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම

දිවයිනේ විවිධ ප්‍රදේශවල පාසල් සිසුන් අතර ඩිජිටල් සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා ආයතනයේ අඛණ්ඩ කැපවීමේ කොටසක් ලෙස, කොමිෂන් සභාව මොරටුව විශ්ව විද්‍යාලය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. මොරටුව විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ උපාධි වැඩසටහනට ඇතුළත් වූ සිසුන් 35 දෙනෙකු පුහුණු කිරීම සහ රට පුරා පාසල්වලට අනුයුක්ත කිරීම තුළින් ග්‍රාමීය සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට කොමිෂන් සභාව පියවර ගත්තේය.

දුරස්ථ ප්‍රදේශවල සිසුන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීමට සහ ඒ සමගම ස්වේච්ඡා සේවකයින්ට ප්‍රායෝගික ඉගැන්වීමේ අත්දැකීම් සහ පළපුරුද්ද ලබා දීමෙන් ඔවුන්ගේ අනාගත වෘත්තීය අපේක්ෂාවන් ඉහළ නැංවීමට මෙම වැඩසටහන සැලකිය යුතු ලෙස දායක විය. තවද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වන කැපවීම අවධාරණය කරමින්, කොමිෂන් සභාව විසින් කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය සමඟ සහයෝගයෙන් කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය (NIA) - ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) ලෝක මිත්‍රත්ව කොරියානු තොරතුරු තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන පැවැත්වීය. මෙම වැඩසටහන ඌව පළාතේ ගුරුවරුන් සහ සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දුන් අතර කලාපීය මට්ටමින් ඩිජිටල් නිපුණතාවය සහ දැනුම හුවමාරුව වැඩි දියුණු කිරීමට දායක විය. ගෝලීය ඩිජිටල් පරතරය පියවීමට සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනයේ ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමේදී ස්වේච්ඡා සේවකයින්ගේ මහඟු දායකත්වය අවධාරණය කරමින්, සමාජ මාධ්‍ය ප්‍රවර්ධනය සඳහා වූ විශිෂ්ටතා සම්මානයෙන් මෙම වැඩසටහන පිදුම් ලැබීය.

මෙම මුලපිරීම්, ශ්‍රී ලංකාව පුරා ඩිජිටල් පරතරය තුරන් කිරීම, ඩිජිටල් සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම අරමුණු කරගත් කොමිෂන් සභාවේ පුළුල් උපාය මාර්ගයේ කොටසක් විය.

### ආයතනික කළමනාකරණය

කාර්ය මණ්ඩල උසස්වීම් සහ බඳවා ගැනීම් මගින් ආයතනයේ මානව සම්පත ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලද අතර එමගින් විදුලි සංදේශ නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සහකාරවරුන් සහ රියදුරන් ඇතුළු විධායක නොවන පුරප්පාඩුවලින් 42% ක් පිරවීමට හැකි විය. මෙය 2024 වර්ෂයේදී ලබා ගත් සැලකිය යුතු ජයග්‍රහණයකි. මීට අමතරව, ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් සිව් දෙනෙකු බඳවා ගන්නා ලද අතර, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා දීම සඳහා මාස 6 ක පුහුණු වැඩසටහනක් සඳහා විශ්ව විද්‍යාල සහ වෘත්තීය ආයතනවලින් සිසුන් 33 දෙනෙකු බඳවා ගන්නා ලදී. ආයතනික ව්‍යුහයේ සහ කළමනාකරණයේ අනාගත වැඩිදියුණු කිරීම් සඳහා නව බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR) සකස් කර අවසන් කිරීමට ද කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

අනිවාර්ය වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරමින්, කොමිෂන් සභාව විසින් මූල්‍ය ප්‍රකාශන ඇතුළුව 2023 වාර්ෂික වාර්තාවේ කෙටුම්පත ජාතික විගණන කාර්යාලයට ඉදිරිපත් කළේය. අවසන් අනුමත වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම උදෙසා එය ඩිජිටල් ආර්ථික කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. මීට අමතරව, 2025-2027 කාල සීමාව සඳහා යාවත්කාලීන කරන ලද ආයතනික සැලැස්ම සහ 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සියලුම අංශ ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර සංවර්ධනය කරන ලද අතර අදාළ බලධාරීන්ට ඉදිරිපත් කිරීමට නියමිතය.

රජයේ වියදම් සීමාකිරීම් තිබියදීත්, ආයතනය සිය සේවක හැකියාවන් වර්ධනය කිරීමෙහි ලා කටයුතු කළ අතර, ඒ අනුව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) හා ආසියා-ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සමඟ සහයෝගයෙන් පැවැත්වූ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 59 දෙනෙකු සහභාගී විය.

ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පූර්ණ ලෙස අනුගත වෙමින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් 19 ක් මගින් මුළු ප්‍රසම්පාදන 50 ක් සාර්ථකව නිම කරන ලද අතර, එමගින් විනිවිදභාවය සහ ක්‍රියා පටිපාටි අනුකූලතාව සහතික කෙරේ. රජයේ රෙගුලාසි සහ සම්මත ක්‍රියා පටිපාටිවලට අනුකූලව 2023 වසර සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය නිසි ලෙස කටයුතු කළ අතර, මහජන වෙන්දේසිය මගින් ඉවත් කිරීමට යෝග්‍ය ලෙස හඳුනාගත් භාණ්ඩ සඳහා නිසි ක්‍රමවේදයන් අනුව කටයුතු කරන ලදී.


අදාළ ආදායම් බදු රෙගුලාසි සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවල පූර්ණ අනුකූලතාවය සහතික කරමින්, කොමිෂන් සභාව සිය වාර්ෂික අයවැය සහ මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි සාර්ථකව සකස් කර ඉදිරිපත් කරන ලදී. සියලුම ගෙවිය යුතු බදු නිවැරදිව එකතු කර වහාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සහ රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී.

අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන ලද්දේ පාලනය, අවදානම් කළමනාකරණය සහ නියාමන අනුකූලතාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමිනි. ඊට අමතරව, අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සහ මූල්‍ය පාඩු සහ වංචා මගින් සිදු විය හැකි ව අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂ විගණන සමාලෝචන සිදු කරන ලදී.

## නිගමනය

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය නවීකරණය කිරීම, නියාමන රාමුව ශක්තිමත් කිරීම, හිතකර තරඟකාරිත්වයක් ඇති කිරීම සහ රටේ ඩිජිටල් පරිවර්තනය ප්‍රවර්ධනය කිරීම උදෙසා කොමිෂන් සභාව දරන අඛණ්ඩ ප්‍රයත්නයන් මෙම වාර්තාවෙන් විග්‍රහ කෙරේ.

ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා, ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු කොමිෂන් සභා සාමාජිකයින්, කොමිෂන් සභා කාර්ය මණ්ඩලය මෙන්ම විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන් ලබාදුන් අගනා සහාය වෙනුවෙන් ඔවුන්ට මාගේ ප්‍රණාමය පිරිනැමීමට කැමැත්තෙමි. අපි සියලුම දෙනා එක්ව, එළැඹෙන වසර තාක්ෂණික ප්‍රගතිය, නවෝත්පාදනය සහ සමාජයේ සියලුම දෙනා අන්තර්ගත වේගවත් තිරසාර සංවර්ධනයක් නිර්මාණය කරන වඩාත් ඵලදායී වූ වසරක් වේවා යි ප්‍රාර්ථනා කරමු.



**එයාර් වයිස් මාර්ෂල් බන්දුල හේරත් (විශ්‍රාමික)**
**අධ්‍යක්ෂ ජනරාල්**

## තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 2024

වර්තමානයේ දී සංවර්ධනය පිළිබඳ ගෝලීය අවබෝධය සමෘද්ධිමත්භාවය, ආර්ථික අවස්ථා, පරිසරය සුරැකීම සහ ප්‍රශස්ත සමාජ යහපැවැත්ම ප්‍රවර්ධනය කරන තිරසාර සංවර්ධනය කරා ගමන් කරමින් සිටී. මෙම සන්දර්භය තුළ, තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වන සාධකයක් ලෙස විදුලි සංදේශ/තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) සැලකේ.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක තුළින්, ගෝලීය අන්තර් සම්බන්ධතාවය හා බැදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාප්තිය මගින් මානව ප්‍රගතිය වේගවත් කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාප්ති විෂමතාවය තුරන් කිරීමෙහි ලා සුවිශාල පිටුවහලක් ලැබෙන බව හඳුනා ගෙන ඇත. විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම කඩිනම් කිරීම පිණිස 2024 වසර සඳහා අපගේ ක්‍රියාකාරී සැලසුම්වලට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වැඩසටහන් ඇතුළත් කළෙමු.

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| 8 DECENT WORK AND ECONOMIC GROWTH<br>තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) 8 සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය | **ඉලක්ක 8.3:** ඵලදායී ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම. | තරඟකාරිත්වය පිළිබඳ රෙගුලාසි අනුමත කිරීම | 100% |
| | | විදුලි සංදේශ වෙළඳපොළේ තරඟකාරීත්වය නියාමනය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම. | 100% |
| | **ඉලක්ක 8.6:** අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන, රැකියාවක් නොමති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩුකිරීම. | දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන | 75% |

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE<br>තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) 9 කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් | **ඉලක්ක 9.1:** ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | ඒකාබද්ධ බලපත්‍රකරණය සඳහා බලපත්‍ර ආකෘති සකස් කිරීම<br>- ස්ථාවර/ජංගම | 100% |
| | | 5G සඳහා සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කිරීම | 90% |
| | | සංඛ්‍යාත වර්ණාවලි ගාස්තු පිළිබඳ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීම | 95% |
| | | ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීති (RTTE) සංශෝධනය කිරීම | 99% |
| | | ජාත්‍යන්තර ජංගම විදුලි සංදේශ (IMT) සංඛ්‍යාත වර්ණාවලි ස්පර්ශභාවය නැවත සකස් කිරීම | 100% |
| | | 5G ඇතුළු උසස් පුළුල් පරාස දත්ත (Broadband) සේවා සඳහා සංඛ්‍යාත වර්ණාවලිය පැවරීම පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම. | 100% |

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) 9 කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් | ඉලක්ක 9.1: ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | යටිතල පහසුකම් හවුලේ භාවිතය (IS) පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම | 95% |
| | | දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම | 56% |
| | | යටිතල පහසුකම් හවුලේ භාවිතය පිළිබඳ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම | 100% |
| | ඉලක්ක 9.5: විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇතුළු සියලු රටවල කර්මාන්ත අංශයන්හි තාක්ෂණික ධාරිතාවන් ඉහළ නැංවීම. නවෝත්පාදනය දිරිගැන්වීම සහ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියුතු ශ්‍රමිකයන් සංඛ්‍යාව ජනගහනයට සාපේක්ෂව ප්‍රමානිකව ඉහළ නැංවීම සහ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වූ වියදම් වැඩි කිරීම. | පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම 2024 | 60% |
| | ඉලක්ක 9.1: ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br><br>ඉලක්ක 9.c: තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයට ප්‍රවේශවීමේ හැකියාව කැපී පෙනෙන ආකාරයට වර්ධනය කිරීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට අඩු මිලට සහ සැමටම අන්තර්ජාලය වෙත ප්‍රවේශවීමේ අවස්ථාව සැලසීමට ප්‍රයත්න දැරීම. | පාසල් 1000කට ෆයිබර්/රැහැන් රහිත පුළුල් පරාස දත්ත (broadband) සම්බන්ධතා සැපයීම | 50% |
| | | රටපුරා 4G ෆයිබර් බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණය සපුරාලන "ගමට සන්නිවේදනය" ("Connect Sri Lanka") ව්‍යාපෘතිය | 34.92% |

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) 16 සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන | ඉලක්ක 16.6: සියලුම මට්ටම්වලදී ඵලදායී වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම. | වෙනස්වන නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම | 100% |


# විදුලි සංදේශ සංඛ්‍යාලේඛන සහ තොරතුරු

**28.8 මිලියන**
සෙලියුලර් ජංගම දුරකථන

**3.4 මිලියන**
ස්ථාවර ප්‍රවේශ දුරකථන

**131.5%**
ජනගහනයෙන් සෙලියුලර් ජංගම දුරකථන

**15.7%**
ජනගහනයෙන් ස්ථාවර ප්‍රවේශ දුරකථන



**20.6 මිලියන**
ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් සේවා (3G/4G)

**2.5 මිලියන**
ස්ථාවර බ්‍රෝඩ්බෑන්ඩ් සේවා

**21.9 මිලියන**
2024 වසර මැද භාගයේ ජනගහනය

**23**
පද්ධති බලපත්‍ර


| | | |
|---|---|---|
| ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකත්ව | ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකවීම් (හඬ පමණි) | 892,995 |
| | ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකවීම් (හඬ සහ දත්ත) | 1,228,565 |
| | ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකවීම් (දත්ත පමණි) | 1,314,683 |
| | මුළු ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකවීම් | 3,436,243 |

| | | |
|---|---|---|
| සෙලියුලර් ජංගම දුරකථන දායකත්ව | සෙලියුලර් ජංගම දුරකථන දායකවීම් (හඬ පමණි) | 6,831,107 |
| | සෙලියුලර් ජංගම දුරකථන දායකවීම් (හඬ සහ දත්ත) | 20,545,811 |
| | සෙලියුලර් ජංගම දුරකථන දායකවීම් (දත්ත පමණි) | 1,443,327 |
| | මුළු සෙලියුලර් ජංගම දුරකථන දායකවීම් | 28,820,245 |


| | | |
|---|---|---|
| දුරකථන ඝනත්වය | ස්ථාවර ප්‍රවේශ හඬ දුරකථන ඝනත්වය (පුද්ගලයන් 100 දෙනෙකුට) | 9.7 |
| | ස්ථාවර ප්‍රවේශ දුරකථන ඝනත්වය (පුද්ගලයන් 100 දෙනෙකුට) | 15.7 |
| | සෙලියුලර් ජංගම හඬ දුරකථන ඝනත්වය (පදිංචිකරුවන් 100 දෙනෙකුට) | 124.9 |
| | සෙලියුලර් ජංගම ඝනත්වය (පුද්ගලයන් 100 දෙනෙකුට) | 131.5 |


| | | |
|---|---|---|
| බ්‍රෝඩ්බෑන්ඩ් | ස්ථාවර බ්‍රෝඩ්බෑන්ඩ් සේවා දායකවීම් | 2,543,248 |
| | ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් සේවා දායකවීම් (3G, 4G) | 20,606,132 |

පද්ධති බලපත්‍ර සංඛ්‍යාව




## 1. දුරකථන සහ බ්‍රෝඩ්බෑන්ඩ් ග්‍රාහක වර්ධනය








ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකත්වයන්


| | 2022 - 2023 | 2023 - 2024 |
|---|---|---|
| ජංගම | -3% | -1% |
| ස්ථාවර | -7% | -3% |

ස්ථාවර සහ ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් දායකත්වයන්


| | 2022 - 2023 | 2023 - 2024 |
|---|---|---|
| ජංගම | 7% | 1% |
| ස්ථාවර | -5% | -1% |




| | කොපර් රැහැන් | ADSL | ෆයිබර් | LTE |
|---|---|---|---|---|
| 2022 | 0.56 Mn | 0.29 Mn | 0.42 Mn | 2.28 Mn |
| 2023 | 0.48 Mn | 0.24 Mn | 0.44 Mn | 2.12 Mn |
| 2024 | 0.41 Mn | 0.16 Mn | 0.46 Mn | 1.79 Mn |





| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| එකතුව | 143 | 147.9 | 142 | 147.4 | 147.2 |
| ජංගම | 131.1 | 135 | 130 | 131.5 | 131.5 |
| ස්ථාවර | 11.9 | 12.9 | 12 | 15.9 | 15.7 |






| | බස්නාහිර | දකුණ | මධ්‍යම | ඌව | නැගෙනහිර | උතුරු මැද | වයඹ | උතුර | සබරගමුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම දුරකථන ග්‍රාහකයින් (VLR පදනම) | 7.32 Mn | 2.22 Mn | 2.37 Mn | 0.94 Mn | 1.33 Mn | 1.28 Mn | 2.23 Mn | 1.14 Mn | 1.56 Mn |
| ස්ථාවර ප්‍රවේශ ග්‍රාහකයින් | 1.71 Mn | 0.32 Mn | 0.33 Mn | 0.11 Mn | 0.14 Mn | 0.11 Mn | 0.32 Mn | 0.13 Mn | 0.21 Mn |


## 2. ජංගම උපකරණ භාවිතය




## 3. භාවිත සංඛ්‍යාලේඛන


















## 5. අය බදු සහ ගාස්තු








## 6. ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ



# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

## බලපත්‍ර කළමනාකරණය

### සමාලෝචනය

*ජාතික සහ ජාත්‍යන්තර දුරකථන සේවාවන් සඳහා ඇති සියලු සාධාරණ ඉල්ලීම් විශ්වාසදායකව සහ කාර්යක්ෂමව සපුරාලීම තහවුරු කිරීමේ වගකීම ශ්‍රී ලංකා දුරකථන නියාමන කොමිෂන් සභාව (TRCSL) වෙත පැවරී ඇත. පනතේ 17 වැනි වගන්තිය අනුව, කොමිෂන් සභාවේ නිර්දේශ මත අමාත්‍යවරයා විසින් ලබාදෙන බලපත්‍රයක් යටතේ හැර, කිසිදු තැනැත්තෙකුට ශ්‍රී ලංකාව තුළ දුරකථන ක්‍රමයක් ක්‍රියාත්මක කළ නොහැක. එසේම 18 වැනි වගන්තිය අනුව, පවතින බලපත්‍ර සඳහා සංශෝධන යෝජනා කිරීමට කොමිෂන් සභාවට බලය පවතී. ජාතික හා ජාත්‍යන්තර දුරකථන සේවාවන් සඳහා පවතින සියලු සාධාරණ ඉල්ලීම් විශ්වාසනීය හා කාර්යක්ෂම ලෙස ඉටු වන බව සහතික කිරීමේ වගකීම ශ්‍රී ලංකා දුරකථන නියාමන කොමිෂන් සභාව (TRCSL) වෙත පැවරී ඇත.*

*පනතේ 17 ආ වගන්තිය අනුව, කොමිෂන් සභාව විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ හැර, තැනැත්තකු විසින් විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත රීති මගින් නිශ්චිතව දක්වනු ලබන යටිතල පහසුකම් සේවා සැපයීම, රීති මගින් නිශ්චිතව දක්වනු ලබන විදුලි සංදේශ සේවා සැපයීම හෝ කේබල් ගොඩබිම්ට සම්බන්ධ කරන ස්ථාන පහසුකම් සැපයීමේ කටයුතු වල නිරත නොවිය යුතුය.*

*පනතේ මෙම විධිවිධාන මගින් පොදුවේ ශ්‍රී ලංකාවේ සියලුම විදුලි සංදේශ ක්‍රම නියමිත නියාමන රාමුවක් යටතේ ක්‍රියාත්මක වන බව තහවුරු කරයි.*

### කාර්යයන්

විදුලි සංදේශ පනත, අදාළ රීති, මාර්ගෝපදේශ සහ ගැසට් කරන ලද විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ බලපත්‍ර නියාමනය කිරීම සහ පරිපාලනය කිරීම බලපත්‍ර කළමනාකරණ අංශයේ වගකීම වේ. එහි ප්‍රධාන කාර්යයන් වන්නේ:

- 17 වගන්තිය යටතේ පද්ධති බලපත්‍ර නිකුත් කිරීම
- 17 ආ වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම
- 17 සහ 17 ආ වගන්ති යටතේ පද්ධති බලපත්‍ර අලුත් කිරීම
- බලපත්‍ර නියාමන රාමුව පාලනය කිරීම

### 17 වගන්තිය යටතේ පද්ධති බලපත්‍ර නිකුත් කිරීම

මෙම කාර්යයට අදාළ පනතේ 17 වන වගන්තිය යටතේ විදුලි සංදේශ පද්ධති ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහ සේවා සැපයීමට අවසර ඉල්ලා සිටින ක්‍රියාකරුවන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සැකසීම සහ ඇගයීම ඇතුළත් වේ. අයදුම්කරුවන්ගේ තාක්ෂණික, මූල්‍ය, විකුණුම් සහ අලෙවිකරණය, පාරිභෝගික සේවා සහ ආරක්ෂාව, සංවිධානාත්මක සහ කළමනාකරණ සහ අනෙකුත් නියාමන අනුකූලතාව තක්සේරු කිරීම සහ අංක 2355/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුකූලව බලපත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි සකස් කිරීම ද එයට අයත් වේ.

### 17 ආ වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම

මෙම කාර්යයට පනතේ 17ආ වගන්තිය යටතේ සේවා සහ පහසුකම් සැපයීමට අවසර ඉල්ලා සිටින ක්‍රියාකරුවන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සමාලෝචනය සහ තක්සේරු කිරීම ඇතුළත් වේ. මෙමගින් අයදුම්කරුවන්ගේ තාක්ෂණික, මූල්‍ය, විකුණුම් සහ අලෙවිකරණය, පාරිභෝගික සේවා සහ ආරක්ෂාව, ආයතනික සහ කළමනාකරණ සහ අනෙකුත් නියාමන අනුකූලතාව ඇගයීම මෙන්ම අංක 2395/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ දක්වා ඇති නිර්ණායකයන්ට අනුකූලව බලපත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි සකස් කිරීම ආවරණය කරයි.

### 17 සහ 17 ආ වගන්ති යටතේ පද්ධති බලපත්‍ර නවීකරණය / අලුත් කිරීම

බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලිය තුළින් බලපත්‍රලාභීන්ගේ මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කරනු ලබන්නේ, වත්මන් බලපත්‍ර හිමියන් ඔවුන්ගේ බලපත්‍රයේ නියමයන් හා කොන්දේසි සම්පූර්ණයෙන්ම පිළිපදින්නේද යන්න ඇගයීම මගිනි. මෙම ක්‍රියාවලියට අලුත් කිරීමේ දැනුම්දීම් නිකුත් කිරීම, අවශ්‍ය ලේඛන එකතු කිරීම, නියාමන හා තාක්ෂණික සමාලෝචන සිදු කිරීම, සහ කාලෝචිත ලෙස අලුත් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සඳහා සැකසීම් සිදු කිරීම ඇතුළත් වේ.

### බලපත්‍ර නියාමන රාමුව පාලනය කිරීම

කර්මාන්ත අවශ්‍යතා අනුව බලපත්‍ර ක්‍රියාවලිය පාලනය කරන නියාමන රාමුව පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම මෙම කාර්යයට ඇතුළත් වේ. විදුලි සංදේශ පනතේ සහ අනුබද්ධ නීති සම්පාදනයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම ද මෙහි කොටසකි. තවද, මෙම අංශය බලපත්‍ර ප්‍රතිපත්ති සමාන හා සාධාරණ ලෙස ක්‍රියාත්මක වන බව සහතික කරන අතර, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්ත ප්‍රමිතීන් සංවර්ධනයට දායක වේ.

### කාර්යසාධනය

2024 වර්ෂය තුළ අංශය විසින් සිදු කරන ලද ප්‍රධාන නියාමන සහ උපායමාර්ගික මුලපිරීම් පහත පරිදි වේ:

- බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයට අදාළ නීතිමය සංශෝධන (පනත) ආරම්භ කිරීම.
- 17 වගන්තිය යටතේ නව අතිවිශේෂ ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත් කිරීම.
- 17 ආ වගන්තිය යටතේ අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම.
- ඒකාබද්ධ බලපත්‍රකරණ සැලැස්මක් සංවර්ධනය කිරීම.
- කේබල් වැඩ නියාමනය කිරීම සඳහා 22අ වගන්තිය යටතේ බලපත්‍ර රාමුවක් සකස් කිරීම.
- 17 වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම.
- 17 ආ වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම.

### නීති සංශෝධන (පනත) ආරම්භ කිරීම

2024 අංක 39 දරන පනත බලාත්මක කිරීමත් සමඟ සංශෝධිත බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. විශේෂයෙන්ම විදුලි සංදේශ යටිතල පහසුකම් හා කේබල් අධීක්ෂණයට අදාළව උද්ගතව ඇති නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා නියාමන රාමුව ශක්තිමත් කිරීම අරමුණු කරගත් 17 වන සහ 22අ වගන්ති සඳහා යාවත්කාලීන කිරීම මෙම සංශෝධනවලට ඇතුළත් විය.

### 17 වගන්තිය යටතේ බලපත්‍ර සඳහා නව අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම

2023.10.25 දිනැති අංක 2355/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කර ඇති අතර එය 2024.09.01 සිට ක්‍රියාත්මක විය. මෙම ගැසට් පත්‍රය මඟින් පෙර පැවති අංක 1435/20 ගැසට් පත්‍රය ප්‍රතිස්ථාපනය කරමින්, පනතේ 17 සහ 18 වගන්ති යටතේ පද්ධති බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, හිමිකාරිත්වය පැවරීම, සංශෝධනය කිරීම සහ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි හඳුන්වා දෙන ලදී.

### 17 ආ වගන්තිය යටතේ අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම

සංශෝධිත පනතේ 17 ආ වගන්තිය යටතේ සැපයුම්කරු බලපත්‍ර රීති හඳුන්වා දෙමින් 2024.07.31 දිනැති අංක 2395/34 දරන නව අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කරන ලදී. මෙම ගැසට් පත්‍රයේ, විදුලි සංදේශ සේවා, යටිතල පහසුකම් සේවා සහ කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන පහසුකම් සැපයීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා බලපත්‍ර රීති නිශ්චිතව දක්වා ඇත.

### ඒකාබද්ධ බලපත්‍රකරණ සැලැස්ම සංවර්ධනය කිරීම

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වේගවත් වර්ධනයට ප්‍රතිචාර වශයෙන් බලපත්‍ර කළමනාකරණ අංශය ඒකාබද්ධ බලපත්‍ර පාලන ක්‍රමයක් සංවර්ධනය කිරීම ආරම්භ කළේය. මෙම උපායමාර්ගික වැඩසටහන මඟින් තාක්ෂණික අභිසාරීතාවය හා සේවා නම්‍යශීලීභාවය සඳහා සහාය වන විධිමත් රාමුවක් තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ ඒකාබද්ධ කිරීම අරමුණු කරනු ඇත. නවෝත්පාදනය දිරිගැන්වීම, නීති, රීති සහ මාර්ගෝපදේශ වඩාත් තේරුම්ගත හැකි, විනිවිද පෙනෙන සහ පුරෝකථනය කළ හැකි බවට පත් කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සහ බලපත්‍රලාභීන් අතර සාධාරණ හා ඵලදායී තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ඒකාබද්ධ ප්‍රවේශය සැලසුම් කර ඇත.

### කේබල් වැඩ නියාමනය කිරීම සඳහා 22අ වගන්තිය යටතේ බලපත්‍ර රාමුවක් සකස් කිරීම

කේබල් වැඩ සඳහා 22අ වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම සරල කිරීම අරමුණු කර ගනිමින්, නියාමන අනුකූලතාව, විධිමත් ක්‍රියාවලීන් සහ ජාතික විදුලි සංදේශ ප්‍රමිතීන්ට අනුකූලතාව සහතික කරන ප්‍රමිතිගත හා පුළුල් ක්‍රියාපටිපාටියක් ආරම්භ කරන ලදී.

### 17 වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම

2024 වර්ෂයේදී, ටෙලිපෝට් සේවා සහ දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ සේවා යන කාණ්ඩ යටතේ නව බලපත්‍ර දෙකක් අමාත්‍යවරයා විසින් ප්‍රදානය කරන ලදී. එසේම, කේබල් බෙදාහැරීමේ ජාල ක්‍රියාකරු සේවා කාණ්ඩය යටතේ තවත් නව බලපත්‍ර දෙකක් අලුත් කරන ලදී.

| 17 වන වගන්තිය යටතේ නව බලපත්‍ර නිකුත් කිරීම - 2024 | |
|---|---|
| **බලපත්‍ර කාණ්ඩය** | **ප්‍රමාණය** |
| ටෙලිපෝට් සේවා ක්‍රියාකරුවන් | 01 |
| දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ සේවා ක්‍රියාකරුවන් | 01 |
| | |
| **17 වන වගන්තිය යටතේ බලපත්‍ර අලුත් කිරීම - 2024** | |
| **කේබල් බෙදාහැරීමේ ජාල ක්‍රියාකරුවන්** | 02 |

*වගුව 1: 17 වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම*

### 17 ආ වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම

පනතේ 17 ආ වගන්තිය යටතේ, විදුලි සංදේශ සේවා කාණ්ඩයට අදාළව, ගැසට් නිවේදන අංක 2395/34 හි සඳහන් විධිවිධාන අනුව, කොමිෂන් සභාව විසින් එක් බලපත්‍රයක් ප්‍රදානය කරන ලදී.

| 17 ආ වගන්තිය බලපත්‍රය නිකුත් කිරීම - 2024 | |
|---|---|
| **බලපත්‍ර කාණ්ඩය** | **ප්‍රමාණය** |
| විදුලි සංදේශ සේවා සපයන්නන් | 01 |

*වගුව 2: 17 ආ වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම*

2023 වර්ෂය දක්වා, සේවා වර්ගය අනුව වර්ගීකරණය කර ඇති 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද වත්මන් බලපත්‍ර ලැයිස්තුව පහත වගුවේ දක්වා ඇත.

| 17 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභීන් | |
|---|---|
| **බලපත්‍ර කාණ්ඩය** | **ප්‍රමාණය** |
| ස්ථාවර ක්‍රියාකරුවන් | 03 |
| ජංගම දුරකථන ක්‍රියාකරුවන් | 04 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන් (EGO) | 05 |
| දත්ත සන්නිවේදන ක්‍රියාකරුවන් | 01 |
| කේබල් බෙදාහැරීමේ ජාල ක්‍රියාකරුවන් | 03 |
| අන්තර්ජාල සේවා සපයන්නන් | 03 |
| සෘජු ගෘහස්ථ චන්ද්‍රිකා විකාශන ක්‍රියාකරුවන් | 02 |
| කල්බදු පරිපථ ක්‍රියාකරුවන් | 01 |
| චන්ද්‍රිකා සේවා ක්‍රියාකරුවන් | 01 |
| **එකතුව** | **23** |

*වගුව 3: 17 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභීන්*

## ජාල

### සමාලෝචනය

*අංක, නාමයන්, කේත සහ හඳුන්වනයන් භාවිත කිරීම කළමනාකරණය කිරීමට බලතල පැවරී ඇති පරම අධිකාරිය කොමිෂන් සභාව වන අතර, පනතේ 10අ වගන්තිය යටතේ අංක, නාමයන්, කේත සහ හඳුන්වනයන් කාර්යක්ෂමව බෙදාහැරීම ප්‍රවර්ධනය කිරීමේ වගකීමද කොමිෂන් සභාව වෙත පැවරී ඇත. තවද, පනතේ 21 වගන්තිය අනුව, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රාජ්‍ය සහ පෞද්ගලික විදුලි සංදේශ ජාල සහ විදුලි සංදේශ උපකරණ විකුණුම්කරුවන් සම්බන්ධ කරුණු පාලනය කිරීමේ හා නියාමනය කිරීමේ වගකීමද කොමිෂන් සභාවට ඇත.*

*පනතේ 22අ වගන්තියට අනුව, කොමිෂන් සභාව විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ භූමිය මතුපිට හෝ භූමියට යටින්, මාර්ගවල හෝ භෞමික ජල තීරය තුළ කිසිදු පරිශ්‍රයක කේබල් වැඩ සිදු නොකළ යුතුය.*

*පනතේ 22අඅ සහ 22 අආ වගන්ති මගින් සබ්මැරීන් කේබල් ආරක්ෂා කිරීමේ වගකීම කොමිෂන් සභාවට පවරා ඇත.*

*කොමිෂන් සභාව වෙත පැවරී ඇති ඉහත සඳහන් වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය නියාමන කාර්යයන් ඉටු කිරීම සඳහා ජාල අංශය (Network Division) වගකියනු ලැබේ.*

### කාර්යයන්

ජාල අංශයේ විෂය පථය යටතේ විවිධ ක්ෂේත්‍ර යටතේ සිදු කරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

- ජාතික අංකන සම්පත කළමනාකරණය කිරීම.
- ජාතික සහ ජාත්‍යන්තර සංඥා ලක්ෂ්‍ය කේත සහ වස්තු හඳුනාගැනීම් (Object Identifiers – OID) වෙන් කිරීම.
- විදුලි සංදේශ ක්‍රියාකරුවන්ට ජාල කේත පැවරීම.
- අන්තර්ජාල යෙදුම් ජාල ඔස්සේ හඬ සම්ප්‍රේෂණ අවහිරතා ඉවත් කිරීමට විදුලි සංදේශ ක්‍රියාකරුවන්ට අනුමැතිය නිකුත් කිරීම.
- තඹ හෝ දෘශ්‍ය තන්තු ජාල, මුහුදු සංදාම කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන සහ විදුලි සංදේශ ඇන්ටෙනා ව්‍යුහයන් වැනි විදුලි සංදේශ යටිතල පහසුකම් ස්ථාපනය කිරීමට පහසුකම් සැලසීම.
- විදුලි සංදේශ කුලුණු ආශ්‍රිත ගැටළු පිළිබඳව ලැබෙන මහජන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- විදුලි සංදේශ කුලුණු ආශ්‍රිත ගැටළු මගහරවා ගැනීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- අවශ්‍ය කොන්දේසි සපුරාලීමෙන් පසු වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම
- රැහැන්ගත විදුලි සංදේශ ජාල උපකරණ සඳහා මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය නිකුත් කිරීම.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නිර්දේශ හා මාර්ගෝපදේශ වල සඳහන් තාක්ෂණික ප්‍රමිතීන්ට අනුව උපකරණවල අනුකූලතාවය තහවුරු කිරීම.
- පොලිසිය/අපරාධ විමර්ශන අංශය (CID) ආදී ආයතන විසින් සිදු කරන විමර්ශන සඳහා අවශ්‍ය සහාය ලබාදීම.

### කාර්යසාධනය

### අංකනය සහ නව සේවා

#### දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය

ජාල අංශයේ නායකත්වය යටතේ අභ්‍යන්තර කමිටුව විසින් දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරු වීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය නීති සහ මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම සම්පූර්ණ කළේය. දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය පිළිබඳ නීති කෙටුම්පත සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලදී. සියලුම බලපත්‍රලාභී ස්ථාවර සහ ජංගම ක්‍රියාකරුවන්ගේ සාමාජිකයින්ගෙන් සමන්විත 'සීමාසහිත ලංකා දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ සේවා සමාගම' (Lanka Number Portability Services Ltd.) නමින් ඇපකර සමාගමක් අංක මාරු කිරීමේ පරිපාලන සේවා සහ කාර්යයන් සිදු කිරීම සඳහා ස්ථාපනය කරන ලදී. පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රයක් මෙම සමාගමට නිකුත් කරන ලදී. අවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා සුදුසු අළෙවිකරුවකු තෝරා ගැනීම සඳහා සීමාසහිත ලංකා දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ සේවා සමාගම විසින් යෝජනා ඉල්ලීම් කැඳවා ඇති අතර යෝජනාවල මූල්‍ය ඇගයීම අඛණ්ඩව සිදුවෙමින් පවතී. ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සියලුම ස්ථාවර සහ ජංගම විදුලි සංදේශ ක්‍රියාකරුවන් සහ නිලධාරීන්ගෙන් නියෝජිතයින්ගෙන් සමන්විත කාර්ය කණ්ඩායමක් පිහිටුවන ලදී.

#### ගාස්තු රහිත අංකන පද්ධතිය

වාණිජමය ආයතනවල සිය ව්‍යවසායන් සඳහා ගාස්තු රහිත අංක යොදා ගැනීමේ ඉහළ ඉල්ලුමක් පවතී. එබැවින් මෙම සේවාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ජාල අංශය විසින් ආරම්භ කරන ලදී. ජාත්‍යන්තර භාවිතයන්ට අනුකූලව, මෙම සේවාව සඳහා අංක 800 මට්ටමක් හඳුනාගෙන ඇත. ගාස්තු රහිත අංකයක් 800 XXX XXXX යනාදී වශයෙන් 800 මට්ටමේ ඉලක්කම් 10 අංකයක් වනු ඇත. පොදු ස්විචීකරණ ජාල ක්‍රියාකරුවන් සඳහා සංඛ්‍යා පරාස ඒවායේ පවතින ලක්ෂණ සැලකිල්ලට ගනිමින් හඳුන්වා දී ඇත. ගාස්තු රහිත අංක පරාස සඳහා සුදුසු ගාස්තු තීරණය කිරීම පිණිස පත් කරන ලද අභ්‍යන්තර කමිටුව, අයකිරීමේ ව්‍යුහය සකස් කර අවසන් කර ඇත. මෙම අංක කොටස් නිකුත් කිරීම සඳහා මාර්ගෝපදේශ ද අවසන් කර ඇත. ක්‍රියාකරුවන්ට ඔවුන්ගේ ඉල්ලීම මත මෙම පරාසයෙන් අංක කොටස් නිකුත් කළ හැකිය.

#### අංකන රීති

පනතේ 10අ වගන්තියට අනුව ජාතික අංකන සම්පත කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ අරමුණින් අංකන රීති සකස් කිරීමට කටයුතු ආරම්භ කරන ලදී.

## අන්තර්ජාල යෙදුම් ජාල ඔස්සේ හඬ සම්ප්‍රේෂණ (VOIP) අවහිරතා ඉවත් කිරීම

දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් ලබා ගන්නා අන්තර්ජාල සම්බන්ධතාවල අන්තර්ජාල යෙදුම් ජාල ඔස්සේ හඬ සම්ප්‍රේෂණ කිරීමේ මාර්ග යෙදුම් සහ භාවිත අවහිරතා ඉවත් කිරීමට ඉල්ලා සිටින පාර්ශ්වයන්ට ජාල අංශය විසින් අවශ්‍ය අනුමැතිය ලබා දෙයි. 2024 වර්ෂය තුළ, අන්තර්ජාල යෙදුම් ජාල ඔස්සේ හඬ සම්ප්‍රේෂණ සම්බන්ධතා, සම්මුති සහ යෙදුම් අවහිරතා ඉවත් කිරීම සඳහා අනුමැතීන් දෙකක් (02) ලබා දී ඇත.

## IPv6 මාර්ග සිතියම

සංක්‍රාන්තිය සඳහා වන මාර්ග සිතියම කෙටුම්පත් කිරීමේ ආරම්භක පියවරක් ලෙස, IPV6 වෙත සංක්‍රමණය වීමට ඇති සූදානම සහ ඒ වෙත රට තුළ බලපත්‍රලාභී අන්තර්ජාල සේවා සපයන්නන්ගේ ක්‍රියාවලියේ ප්‍රගතිය පරීක්ෂා කරන ලදී. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ සේවා සහාය ලබාදීමේ වැඩසටහන යටතේ බඳවා ගන්නා ලද ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විශේෂඥයකු විසින් IPv6 සඳහා සාර්ථකව මාරුවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපාය මාර්ග ඇතුලත් කෙටුම්පත් සකස් කළේය.

# යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම

## යටිතල පහසුකම් හවුලේ භාවිතය පිළිබඳ රීති

විදුලි සංදේශ යටිතල සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, පනතේ නියමයන් අනුව යටිතල පහසුකම් හවුලේ භාවිතය පිළිබඳ අංක 1 දරන රීති ප්‍රකාශයට පත් කර ඇත.

පනතේ 22අඅ වගන්තිය යටතේ ජාතික සබ්මැරීන් කේබල් කමිටුව ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.

## අනුමත නොකළ කුලුණු පිළිබඳව සමාලෝචනය කිරීම

ජාල අංශය විසින්, දුරකථන ක්‍රියාකරු සමාගම්වල ක්‍රියාත්මක වන ගුවන් සේවා අඩවි ලැයිස්තුව සහ ඇන්ටනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියේ පවතින දත්ත අතර සමාලෝචන ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කර ඇත. අදාල රාජ්‍ය ආයතනවල නිර්දේශ මත කොමිෂන් සභාව වෙත නව අයදුම්පත් ඉදිරිපත් කරන ලද, දැනටමත් ඉදිකර ඇති අනුමත නොකළ කුලුණු සඳහා අනුමැතිය ලබා දී ඇත. එක් ක්‍රියාකරුවෙකුගේ දත්ත සම්බන්ධ සමාලෝචන ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.

**විදුලි සංදේශ කුලුණු ආශ්‍රිත සංඛ්‍යාලේඛන**

| විස්තර | 2024 |
|---|---|
| අනුමත කරන ලද සමුච්චිත කුලුණු සංඛ්‍යාව | 8643 |
| ලැබුණු මුළු කුලුණු පැමිණිලි සංඛ්‍යාව | 41 |
| නිරාකරණය කරන ලද මුළු කුලුණු පැමිණිලි සංඛ්‍යාව | 41 |
| සිදු කරන ලද මුළු තාක්ෂණික විමර්ශන සංඛ්‍යාව (කුලුණු ආශ්‍රිත) | 91 |
| කුලුණු සම්බන්ධ මුළු අධිකරණ නඩු සංඛයාව | 04 |

*වගුව 4: විදුලි සංදේශ කුලුණු ආශ්‍රිත සංඛ්‍යාලේඛන*

## පද්ධති ක්‍රියාකරුවන්ගේ ජාල පිරික්සීම

ජාල අංශය විසින් ක්‍රියාකරුවන්ගේ ජාල සම්බන්ධ ඉහත තොරතුරු කාර්තුමය වශයෙන් රැස්කර, බලපත්‍ර කළමනාකරණ අංශය සමඟ සම්බන්ධීකරණයෙන් භෞතික පරීක්ෂණ සිදු කරමින් එම තොරතුරු සත්‍යාපනය කරයි.

# වෙළඳ බලපත්‍ර ලබා දීම

වෙළඳ බලපත්‍රවලට අදාළ සංඛ්‍යාලේඛන පහත වගුවේ දක්වා ඇත.

| විස්තරය | 2024 |
|---|---|
| නව වෙළඳ බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාව | 300 |
| අලුත් කිරීම් ඇතුළුව නිකුත් කරන ලද මුළු වෙළඳ බලපත්‍ර සංඛ්‍යාව | 1064 |
| ගෙවීම්/MOD අනුමත කිරීම්/ලේඛන ඉදිරිපත් කිරීම සඳහා අපේක්ෂිත මුළු අයදුම්පත් සංඛ්‍යාව | 94 |

*වගුව 5: වෙළඳ බලපත්‍ර*

### කෙටි කේත අංක

2024 වසරේ දී, කෙටි කේත අංක හතරක් (4) රාජ්‍ය ආයතන වෙත පවරා ඇති අතර, 13xx පරාසයේ කෙටි කේත අංක එකොළහක් (11) පෞද්ගලික අංශයේ ආයතන වෙත පවරා ඇත. ආයතන සහ ඒවාට පවරා ඇති අදාළ කෙටි කේත අංක පහත වගුවේ ලැයිස්තුගත කර ඇත.

| කෙටි කේතය | ආයතනය | අංශය |
|---|---|---|
| 1966 | කුසලතා සංවර්ධන සහ වෘත්තීය අධ්‍යාපන අංශය - අධ්‍යාපන අමාත්‍යාංශය | රාජ්‍ය |
| 1949 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | රාජ්‍ය |
| 1916 | පොල් වගා කිරීමේ මණ්ඩලය | රාජ්‍ය |
| 1917 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | රාජ්‍ය |
| 1380 | සීමාසහිත බ්‍රිත් ශ්‍රී ලංකා සමාගම | පුද්ගලික |
| 1303 | HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් | පුද්ගලික |
| 1305 | සීමාසහිත සෙරන්ඩිබ් ලොජිස්ටික්ස් වර්ල්ඩ්වයිඩ් පුද්ගලික සමාගම | පුද්ගලික |
| 1377 | සීමාසහිත ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සංස්ථාව | පුද්ගලික |
| 1383 | සීමාසහිත මැලිබන් බිස්කට් නිෂ්පාදන පුද්ගලික සමාගම | පුද්ගලික |
| 1317 | LOLC ෆිනෑන්ස් පීඑල්සී | පුද්ගලික |
| 1327 | LOLC හෝල්ඩින්ග්ස් පීඑල්සී | පුද්ගලික |
| 1396 | රයිනෝ රූෆින් ප්‍රොඩක්ට්ස් පුද්ගලික සමාගම | පුද්ගලික |
| 1369 | ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් ලිමිටඩ් | පුද්ගලික |
| 1322 | ප්‍රයිම් ලෑන්ඩ්ස් පුද්ගලික සමාගම | පුද්ගලික |
| 1350 | ග්‍රීන්වේ ඒජන්සීස් පුද්ගලික සමාගම | පුද්ගලික |

*වගුව 6: 2024 වර්ෂය තුළ පවරන ලද කෙටි කේත අංක*

### මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය

ජාල අංශය විසින් ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා මාදිලි අනුමැතිය ලබාදීම සහ නිෂ්කාශන ලිපි නිකුත් කිරීමට අදාළව කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමෙහි ලා අංශය වෙත පැවරී ඇති නියාමන කාර්යයන් අඛණ්ඩව සිදු කරන ලදී.ජාල අංශයට පවරා ඇති නියාමන කාර්යභාරය අනුව, ජාල සම්බන්ධ උපකරණ ආනයනය කිරීම සඳහා මාදිලි අනුමැතිය ලබාදීම සහ නිශ්කාශන ලිපි නිකුත් කිරීම සඳහා ලැබුණු ඉල්ලීම් සම්බන්ධ කටයුතු ජාල අංශය විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

| විස්තරය | 2024 දී නිකුත් කරන ලද නිෂ්කාශන සංඛ්‍යාව |
|---|---|
| උපකරණ නිෂ්කාශනය | 3316 |
| මාදිලි අනුමැතීන් | 05 |

*වගුව 7: මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය*

## සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ

### සමාලෝචනය

*ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය යනු ඉහළ ආර්ථික හා උපායමාර්ගික වටිනාකමක් ඇති සීමිත ස්වාභාවික සම්පතක් වන අතර එය විදුලි සංදේශ, විකාශන, ආරක්ෂක සහ සෞඛ්‍ය, අධ්‍යාපනය සහ ප්‍රවාහනය වැනි සමාජ-ආර්ථික සේවාවන් සඳහා අත්‍යවශ්‍ය වේ. කාර්යක්ෂම වර්ණාවලි කළමනාකරණය මඟින් ප්‍රශස්ත භාවිතය සහ පරිශීලකයින් අතර අවම මැදිහත්වීමක් සහතික කෙරේ. පනතේ 10(1) වගන්තිය යටතේ, වර්ණාවලි කළමනාකරණය සඳහා වගකිව යුතු එකම අධිකාරිය වන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවයි. ඒ සඳහා පනතේ 22 වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවේ භෞමික ජල තීරයේ ඕනෑම කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති ඕනෑම නෞකාවක හෝ ගුවන් යානයක කිසිදු ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ ඕනෑම ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචක උපකරණයක් කිසිදු පුද්ගලයෙකු භාවිතා නොකළ යුතුය.*

*ගුවන්විදුලි සන්නිවේදන ස්ථාපනයන් මගින් නිපදවන විද්‍යුත් චුම්භක බාධා අවම කිරීම සඳහා නීතිරීතිවලට අනුකූල වීම බලාත්මක කිරීමේ බලය කොමිෂන් සභාවට පවරා ඇත.*

*රේඩියෝ සන්නිවේදන ස්ථාපන මගින් නිපදවන විද්‍යුත්–චුම්බක බාධා (electromagnetic disturbances) අවම කිරීම සඳහා නියමයන්ට අනුකූලතාවය බලපැවැත්වීමේ අධිකාරිය කොමිෂන් සභාවට පැවරී ඇත.*

### කාර්යයන්

- විවිධ සේවාවන් සඳහා ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීම හා වෙන් කිරීම.
- ජාතික අවශ්‍යතාවයන් සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නියමයන් අනුව විවිධ සේවාවන් සඳහා සංඛ්‍යාත පවරා දීම.
- පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව ගුවන්විදුලි සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම
- 22 වන වගන්තිය යටතේ නිකුත් කළ බලපත්‍ර කොන්දේසි පිරික්සීම හා බලාත්මක කිරීම.
- ගුවන්විදුලි සංඛ්‍යාත අවහිරතා අවම කිරීම.
- ගුවන්විදුලි සන්නිවේදන උපකරණ සඳහා මාදිලි අනුමැතිය සහ ආනයන නිෂ්කාශන අනුමැතිය ලබාදීම.
- සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණයට අදාළ කරුණු පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ප්‍රධාන සංඛ්‍යාත ලේඛනය (Master Frequency Register) පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.

### කාර්යසාධනය

#### සංඛ්‍යාත වර්ණාවලි මාර්ග සිතියම (2024–2029)

විදුලි සංදේශ ක්ෂේත්‍රය වේගයෙන් විකාශනය වෙමින් පවතින අතර, බහු කලාපයන් තුළ නව වර්ණාවලි සඳහා ඇති ඉල්ලුම 5G තාක්ෂණය ඔස්සේ තවදුරටත් වර්ධනය වෙමින් පවතී. මෙම ප්‍රවණතාවට අනුකූලව, 2024–2029 කාලය සඳහා වර්ණාවලි මාර්ග සිතියම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සකස් කර ප්‍රකාශයට පත් කර ඇති අතර, එය සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කිරීම හා අනාගත සැලසුම් ක්‍රියාවලිය සඳහා පැහැදිලි හා විනිවිද පෙනෙන මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කරයි. මෙම මාර්ග සිතියම ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන් සමඟ සමානව සැලසුම් කර ඇති අතර, ජාතික 5G යෙදවීම් ශක්තිමත් කිරීමට දායක වේ. තවද, ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුව (NFAT) ද යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කර ඇති අතර, වර්තමානයේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ප්‍රධාන ධාවකයක් ලෙස 5G තාක්ෂණය ක්‍රියා කරමින් පවතී.

#### ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍රකරණ රීති (RFSL)

බලපත්‍රයක් යනු ගුවන්විදුලි සන්නිවේදන උපකරණයක් ක්‍රියාත්මක කිරීමට හෝ ගුවන්විදුලි සන්නිවේදනයක් ක්‍රියාත්මක කිරීමට ඒකපාර්ශ්විකව අවසර ලබා දීමක් වන අතර එය කොන්ත්‍රාත්තුවක් හෝ ද්විපාර්ශ්වික ගිවිසුමක් ලෙස නොසැලකිය යුතුය. පනතේ 22(2)(b) වගන්තිය යටතේ පරිශීලක කාණ්ඩය බලපත්‍රයෙන් නිදහස් කර නොමැති නම්, සුදුසු ගාස්තුවක් ගෙවීමෙන් පසු ගුවන්විදුලි උපකරණ භාවිතය සඳහා බලපත්‍රයක් අවශ්‍ය වේ. ගුවන්විදුලි සංඛ්‍යාත බලපත්‍රයක් ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍රකරණ රීතිවල (RFSL) දක්වා ඇත. ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර රීති (RFSL) කෙටුම්පත් කිරීම මෙම වසර තුළ ආරම්භ කරන ලදී.

#### 5G සඳහා සංඛ්‍යාත වර්ණාවලිය පැවරීම

වත්මන් වෙළඳපල පසුබිම, එහි ආපසු වර්ධනය විය හැකි හැකියාව, සහ ස්ථාවර හා ජංගම සේවා දෙකම සඳහා 4G සහ 5G සේවාවල වර්තමාන හා අනාගත ඉල්ලුම පිළිබඳව සිය අදහස් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටී. එමෙන්ම, පවතින වෙළඳපල තත්ත්වයන් තුළ 5G සේවා ක්‍රියාත්මක කිරීමට සුදුසුම ප්‍රවේශයන්, වර්තමාන වර්ණාවලි පැවරුම්වල ඇති අසමතුලිතතා සහ ඒවා විසඳීමට යෝජිත ක්‍රම, සහ සියලුම ක්‍රියාකරුවන්ට යාබද වර්ණාවලි කොටස් සකස් කිරීම සඳහා වර්ණාවලි නැවත පැවරීමේ හැකියාව පිළිබඳව ද අදහස් ලබාදෙන ලෙස ඉල්ලා ඇත. මෙම පසුබිම යටතේ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 5G යෙදවීම සම්බන්ධ උපදේශන පත්‍රිකාවක් නිකුත් කර ඇත. එමඟින් වෙළඳපල තත්ත්වයන්, 4G/5G සේවාවල ඉල්ලුම, සහ වර්ණාවලියට සම්බන්ධ ගැටළු පිළිබඳව පාර්ශ්වකරුවන්ගේ අදහස් රැස් කිරීම අරමුණ කරයි. එසේම, සංඛ්‍යාත වර්ණාවලි මිලකරණය, ඉල්ලුම පුරෝකථන, සහ යාබද වර්ණාවලි කොටස් නිර්මාණය කිරීම සඳහා වර්ණාවලිය නැවත පැවරීම සම්බන්ධ යෝජනා පිළිබඳවද සියලුම ක්‍රියාකරුවන් සහ පාර්ශ්වකරුවන්ට තම අදහස් ඉදිරිපත් කරන ලෙස ආරාධනා කර ඇත. එමගින් ලැබෙන ප්‍රතිපෝෂණය අනාගත 5G ප්‍රතිපත්ති සහ තීරණ සකස් කිරීම සඳහා මාර්ගෝපදේශකයක් වනු ඇත.

### සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර නිකුත් කිරීම

| සේවා කාණ්ඩය | වර්ෂය | | |
|---|---|---|---|
| | 2022 | 2023 | 2024 |
| ස්ථාවර සේවාව | 45 | 43 | 41 |
| විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන්විදුලි) | 44 | 30 | 40 |
| දත්ත / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවාව | 24/33 | 28/19 | 28/18 |
| සෙලෙයුලර් සේවාව (ජංගම ක්‍රියාකරුවන්) | 05 | 04 | 03 |
| ගුවන් සේවා | | | |
| (i) ගුවන් යානා මධ්‍යස්ථාන | 71 | 75 | 63 |
| (ii) ගුවන් යානා ජංගම | 08 | 11 | 06 |
| සමුද්‍රීය සේවා | | | |
| (i) සමුද්‍රීය ජංගම | 834 | 1192 | 786 |
| (ii) නාවික මධ්‍යස්ථාන | 71 | 110 | 93 |
| පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව | 143 | 300 | 146 |
| ආධුනික ගුවන් විදුලිය | 66 | 52 | 77 |

*වගුව 8: සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර නිකුත් කිරීම*

### ලැබුණු පැමිණිලි සහ මෙහෙයවන ලද විමර්ශන කටයුතු

| සේවාව | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2022 | 2023 | 2024 |
| රූපවාහිනී සහ ශබ්ද විකාශනය | 3 | 1 | 01 |
| වෙනත් සේවාවන් | 14 | 17 | 02 |

*වගුව 9: ලැබුණු පැමිණිලි සහ මෙහෙයවන ලද විමර්ශන කටයුතු*

### නිෂ්කාශන ලිපි නිකුත් කිරීම

| සේවා කාණ්ඩය | වර්ෂය | | |
|---|---|---|---|
| | 2022 | 2023 | 2024* |
| සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) ඇතුළු ස්ථාවර සේවාව | 650 | 464 | 163 |
| විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන්විදුලිය) | 50 | 40 | 65 |
| සෙලෙයුලර් ජංගම සේවා | | | |
| (i) බෙදාහැරීමේ බලපත්‍ර | 5340 | 5858 | 7525 |
| (ii) ජංගම ක්‍රියාකරුවන් | 1695 | 1602 | 1173 |
| (iii) පුද්ගලික ජංගම ගුවන් විදුලිය | 69 | 38 | 84 |
| දත්ත සේවාව/ ගුවන්විදුලි ටෙලිමෙට්‍රි | 12/1 | 28/0 | 40/02 |
| චන්ද්‍රිකා සේවාව | 86 | 84 | 194 |
| ආධුනික ගුවන්විදුලි | 15 | 32 | 15 |
| අඩු බල උපාංග | 1840 | 1311 | 1617 |
| (i) වෙළඳ බලපත්‍රලාභීන් | 887 | 1051 | 1336 |
| (ii) තනි පාරිභෝගිකයන් | 953 | 260 | 281 |
| සමුද්‍රීය සන්නිවේදනය / නාවික මධ්‍යස්ථාන | 87 | 65 | 119 |
| රාජ්‍ය තාන්ත්‍රික සේවය | - | - | 58 |
| ගුවන්විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා මාදිලි අනුමැතිය | - | - | 775 |

*වගුව 10: නිෂ්කාශන ලිපි නිකුත් කිරීම*

* *තාවකාලික දත්ත*

## අනුකූලතා සහ විමර්ශන කටයුතු

### සමාලෝචනය

*ශ්‍රී ලංකාව තුළ විශ්වාසදායක සහ කාර්යක්ෂම ජාතික සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීම සහතික කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණු වලින් එකකි. මේ සඳහා, විදුලි සංදේශ සේවා සපයන්නන් විශ්වාසදායක, කාර්යක්ෂම සහ ගුණාත්මක විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා ඔවුන්ගේ නියාමන බැඳීම්වලට අනුකූල වන බව සහතික කිරීම සඳහා නියාමන පියවර ගත යුතුය. මේ සඳහා අඛණ්ඩ නිරීක්ෂණ, විමර්ශන, කර්මාන්තය පිළිබඳ බුද්ධි තොරතුරු සහ සුදුසු නියාමන පියවර බලාත්මක කිරීම අවශ්‍ය වේ. පාරිභෝගික පැමිණිලි විධිමත්ව සැකසීම සහ ඔවුන්ගේ ගැටළු සඳහා සාධාරණ විසඳුම් ලබා දීම මගින් පාරිභෝගික තෘප්තිය සහ විශ්වාසය වැඩිදියුණු කිරීම ද සිදු වේ. මෙම සියලු වගකීම් ඉටු කිරීම සඳහා අනුකූලතා සහ විමර්ශන අංශය ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි.*

### කාර්යයන්


- බිල්පත්, සේවා ආවරණය සහ අන්තර්ජාල ගැටළු ඇතුළු විදුලි සංදේශ සේවා ආශ්‍රිත පාරිභෝගික පැමිණිලි විමර්ශනය කිරීම සහ නිරාකරණය කිරීම.
- රැස්වීම් සහ තාක්ෂණික ස්ථානීය පරීක්ෂාව මගින් පැමිණිලි නිරාකරණය කිරීමට පහසුකම් සැලසීම පිණිස විදුලි සංදේශ ක්‍රියාකරුවන් සහ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- සේවා සපයන්නන් හඬ සහ පුළුල් පරාස සේවා සඳහා නියාමන කාර්ය සාධන ප්‍රමිතීන් සපුරාලන බව සහතික කිරීම පිණිස සේවා ගුණාත්මකභාවය (QoS) පිළිබඳ නිරීක්ෂණය සහ විගණන පැවැත්වීම.
- වැඩමුළු, මාධ්‍ය සහ අධ්‍යාපනික වැඩසටහන් මගින් විදුලි සංදේශනයේ සදාචාරාත්මක සහ වගකිවයුතු භාවිතය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම.
- පනතේ 17 සහ 21 වගන්ති යටතේ බලපත්‍ර කොන්දේසි වලට අනුකූල වීම සහතික කිරීම සඳහා නිරීක්ෂණ සහ පරීක්ෂණ සිදු කිරීම.
- අනවසර හෝ වංචනික විදුලි සංදේශ භාවිතය වැළැක්වීම සඳහා සිම් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතා නිරීක්ෂණය කිරීම සහ බලාත්මක කිරීම.
- සේවා මිලකරණය සහ මිල ආකෘතිවල විනිවිදභාවය සහ සාධාරණත්වය තහවුරු කිරීම සඳහා අයක්‍රම විගණන සහ තාක්ෂණික ඇගයීම් ක්‍රියාත්මක කිරීම.
- සයිබර් හිරිහැර, නීතිවිරෝධී උපකරණ භාවිතය සහ බලපත්‍ර රහිත විදුලි සංදේශ ක්‍රියාකාරකම් වැනි ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නීති ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන ආයතන සමඟ සම්මුතිකව සහයෝගයෙන් කටයුතු කිරීම.

### කාර්යසාධනය

### පාරිභෝගික පැමිණිලි

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලැබෙන පාරිභෝගික පැමිණිලි බොහෝ විට බිල්පත් ආරවුල්, සංඥා හෝ ආවරණ දුර්වලතා, තාක්ෂණික දෝෂ, සම්බන්ධතා අඩුපාඩු, දත්ත/අන්තර්ජාල ගැටළු සහ අගය එකතු කළ සේවාවන්ට අදාළ කරුණු සම්බන්ධ වේ. අනුකූලතා අංශය විසින් සෑම පැමිණිල්ලක්ම සලකා බලමින්, ඒවා විසඳීම පිණිස අදාළ සේවා සපයන්නා වෙත යොමු කර, සාමාන්‍යයෙන් දින 14ක කාල සීමාවක් තුළ ප්‍රගතිය පසු විපරම් කරයි. නිරාකරණය නොවූ හෝ සංකීර්ණ ගැටළු සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයා සහ සේවා සපයන්නා සමඟ සෘජු රැස්වීම් සංවිධානය කරන අතර, අවශ්‍ය නම් පාරිභෝගික පරිශ්‍ර වෙත තාක්ෂණික ස්ථානීය පරීක්ෂා කිරීම්ද සිදු කරයි. තවද, සමාජ මාධ්‍ය හිරිහැර, කරදරකාරී ඇමතුම්, සහ මුහුණුපොත සම්බන්ධ ගැටළු වැනි, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සෘජු විෂය පථයෙන් පිටත වන පැමිණිලි, ශ්‍රී ලංකා පොලීසිය සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය වැනි අදාළ ආයතන හෝ වේදිකා වෙත යොමු කරනු ලැබේ.

2024 වසර තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සමස්ත පැමිණිලි 2,933ක් මෙහෙයවන ලද අතර, ඒවා අතරින් වැඩිම කොටස "වෙනත්" කාණ්ඩයට (1,801) අයත් විය. එයට අමතරව, බිල්පත් ආශ්‍රිත පැමිණිලි 395ක් සහ අන්තර්ජාල ගැටළු සම්බන්ධ පැමිණිලි 176ක් වාර්තා විය.




*ප්‍රස්ථාර 1: පාරිභෝගික පැමිණිලි - 2024*

### 2024 දී මෙහෙයවන ලද පැමිණිලි


| පැමිණිලි වර්ගය | මෙහෙයවන ලද පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| බිල්පත්කරණය | 395 |
| දුරකථන දෝෂ | 130 |
| දුරකථන සම්බන්ධතා | 64 |
| අගය එකතු කළ සේවා | 9 |
| දත්ත | 83 |
| අන්තර්ජාලය | 176 |
| සංඥා සහ සේවා ආවරණය | 275 |
| වෙනත් | 1801 |

*වගුව 11: 2024 දී මෙහෙයවන ලද පැමිණිලි*


## සේවාවේ ගුණාත්මකභාවය (QoS)

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සේවා ගුණාත්මකභාවය (QoS) නිරීක්ෂණය කිරීම මගින් දුරකථන හඬ, පුළුල් පරාස (broadband) සහ දත්ත සේවාවන් විශ්වාසනීය ලෙස ක්‍රියාත්මක වන බව තහවුරු කරයි. සේවා ගුණාත්මකභාවය පිළිබඳ විගණන ක්‍රියාවලිය පාරිභෝගික සේවා මට්ටම් සහ තාක්ෂණික මිනුම් දෙකම ආවරණය කරයි. සේවා සපයන්නන් විසින් මාසිකව සේවා ගුණාත්මකභාවය පිළිබඳ වාර්තා ඉදිරිපත් කරන අතර, ඒවා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කාර්තුමය වශයෙන් සිදු කරන ස්වාධීන විගණන මගින් පරීක්ෂා කර සනාථ කරනු ලැබේ. වාර්තාගත දත්ත සහ විගණන ප්‍රතිඵල අතර වෙනස්කම් ඇත් නම්, ඒවා නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කරනු ලබන අතර, එම අනාවරණයන් සේවා තත්ත්ව උපකරණ පුවරුවක් ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය ඔස්සේ ජනතාවට ප්‍රකාශයට පත් කෙරේ. එමෙන්ම, පුළුල් පරාස සේවාවන් සඳහා විශේෂිත සේවා තත්ත්ව පරාමිතීන් සම්බන්ධ නව මාර්ගෝපදේශයක් 2024 දී හඳුන්වාදීම ආරම්භ කරන ලදී.

2024 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් හඬ සේවා සඳහා විගණන 44 ක් සහ පුළුල් පරාස සේවා සඳහා විගණන 20 ක් සිදු කරන ලදී. එසේම, සේවා ප්‍රමිතීන් අඛණ්ඩව පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා මුළු සේවා තත්ත්ව වාර්තා 120 ක් සමාලෝචනය කර ඇගයීමට ලක් කෙරිණි.




*රූපසටහන 1: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලද පාරිභෝගික සේවා පිළිබඳ සේවා තත්ත්ව උපකරණ පුවරුවල නියැදිය*




*රූපසටහන 2: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති තාක්ෂණික පරාමිතීන් පිළිබඳ සේවා තත්ත්ව උපකරණ පුවරු වල නියැදිය*

## මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්



Hathweni Peya - 2024-02-22













ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුකූලතා අංශය විසින් විදුලි සංදේශ හා සමාජ මාධ්‍යවල සදාචාරාත්මක භාවිතය පිළිබඳව යුද හමුදාව, පොලිසිය, පාසල්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉලක්ක කරගෙන දැනුවත් කිරීමේ වැඩසටහන් 39ක් සංවිධානය කර පවත්වන ලදී. එමෙන්ම, විදුලි සංදේශ ගැටළු සම්බන්ධයෙන් ගුවන් විදුලි, රූපවාහිනී සහ සමාජ මාධ්‍ය ඔස්සේ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් ක්‍රියාත්මක කර ඇති අතර, මුද්‍රිත මාධ්‍ය මගින්ද මහජනතාව දැනුවත් කිරීම සිදු කර ඇත. තවද, සයිබර් හිරිහැර සහ අවහිරතා සම්බන්ධ පැමිණිලි මහජන අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා විසඳා ගැනීමටද කටයුතු කර ඇත.

## ආවේක්ෂණ කටයුතු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආවේක්ෂණ ක්‍රියාකාරකම් මඟින් පනතේ 17 සහ 21 වගන්ති යටතේ බලපත්‍ර කොන්දේසි වලට අනුකූලතාවය තහවුරු කරනු ලැබේ. ඒ අනුව, අනවසර විදුලි සංදේශ ක්‍රියාකරුවන්, අළෙවිකරුවන් මෙන්ම නීති විරෝධී විදුලි සංදේශ උපකරණ හඳුනා ගැනීම සහ ඒවාට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිතිපතා පරීක්ෂණ සිදු කෙරේ. එසේම, මියගිය පුද්ගලයින්ගේ නමින් නිකුත් වී ඇති සිම් කාඩ්පත් ඇතුළුව, සිම් කාඩ්පත් ලියාපදිංචි කිරීමේ මාර්ගෝපදේශ ක්‍රියාකරුවන් විසින් නිසි ලෙස අනුගමනය කරන බව තහවුරු කිරීම සඳහා සිම් කාඩ්පත් ලියාපදිංචිය පිළිබඳ විගණන සිදු කරනු ලැබේ. අනුමත මිල ගණන් හා සේවා විනිවිදභාවය සත්‍යාපනය කිරීම සඳහා ක්‍රියාකරු වෙබ් අඩවි මත අයක්‍රම විගණන සහ අහඹු පරීක්ෂණද ක්‍රියාත්මක කරනු ලැබේ.

අනුකූලතා අංශය යටතේ සඳහන් කර ඇති එක් එක් උපවගන්ති වලට අදාළ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය.

| ක්‍රියාකාරකම් | 2024 පළමු කාර්තුවේ සිට හතරවන කාර්තුව දක්වා |
|---|---|
| හඬ සහ පුළුල් පරාස (Broadband) සේවාවන් සඳහා මාසික QoS වාර්තා භාරගැනීම සහ සත්‍යාපනය කිරීම | වාර්තා 120ක් ලබාගෙන සත්‍යාපනය කරනු ලැබීය. |
| හඬ සහ පුළුල් පරාස සේවා සඳහා QOS විගණන පැවැත්වීම | විගණන 69ක් සම්පූර්ණ කරන ලදී. |
| TRCSL විසින් 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි පිළිපැදීම පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා සිදු කරන ලද විමර්ශන. | විමර්ශන 52ක් සිදු කරන ලදී. |
| SIM ලියාපදිංචි කිරීමේ විගණන පැවැත්වීම | විගණන 64ක් සම්පූර්ණ කරන ලදී |
| අයක්‍රම පැකේජ පරීක්ෂාව සිදු කිරීම. | අයක්‍රම පැකේජ 50ක් පරීක්ෂා කරන ලදී |
| අයක්‍රම පැකේජ ආකෘති විගණන සිදු කිරීම | පැකේජ ආකෘති විගණන 18ක් සම්පූර්ණ කරන ලදී. |
| සමාජ මාධ්‍ය පැමිණිලි සඳහා උපදෙස් දීම | සමාජ මාධ්‍ය පැමිණිලි 149ක් සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත. |
| යුධ හමුදාව/පොලිසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පාසල්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | දැනුවත් කිරීමේ වැඩසටහන් 39ක් පවත්වන ලදී. |
| ගුවන්විදුලිය, රූපවාහිනිය සහ සමාජ මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් පවත්වන ලදී. |
| පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම | පාරිභෝගික පැමිණිලි 2933ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී. |
| මාර්ගගතව ලැබුණු අස්ථානගත වූ ජංගම දුරකථන පැමිණිලි | පැමිණිලි 20259 කට ප්‍රතිචාර දැක්වීමට කටයුතු සම්පාදනය කරන ලදී. |

*වගුව 12: කාර්ය සාධනය පිළිබඳ සාරාංශය*

## *නීති*

### *සමාලෝචනය*

*නීති අංශය, කොමිෂන් සභාවේ කටයුතු සඳහා පුළුල් නීතිමය හා නියාමන උපදේශ ලබාදෙමින් වැදගත් භූමිකාවක් ඉටු කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සම්බන්ධ සියලු නඩු කටයුතු කළමනාකරණය කිරීම සඳහා මෙම අංශය වගකිව යුතු අතර, එහි සමස්ත නියාමන ක්‍රමවේදයට ද එය අත්‍යවශ්‍ය දායකත්වයක් සපයයි. එමෙන්ම, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතට, 2004 අංක 11 දරන මුදල් පනතට සහ 2011 අංක 8 දරන විදුලි සංදේශ බදු පනත ඇතුළු අදාළ නීතිවලට අනුකූලව නීති උපදේශ ලබාදීම ද මෙම අංශයේ ප්‍රධාන කාර්යයක් වේ.*

### කාර්යයන්

- අධිකරණ ක්‍රියාමාර්ග ගොනු කිරීම සහ පෙනී සිටීම.
- අධිකරණ නඩු සම්බන්ධ කටයුතු සංවිධානය හා මෙහෙයවීම, ශ්‍රී.ල.වි.ස.නි.කො. සභා නිලධාරීන් හා නීති උපදේශකයින් සමඟ සම්බන්ධීකරණයෙන් නීතිඥයින්ට උපදෙස් සැපයීමට අවශ්‍ය සාරාංශ සහ විග්‍රහ සකස් කිරීම, අදාළ ලේඛන ඉදිරිපත් කිරීම හා ගොනු කිරීම.
- නීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම / සමාලෝචනය කිරීම.
- අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම
- ගිවිසුම්/කොන්ත්‍රාත් ආදිය සමාලෝචනය කිරීම.
- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභා නිලධාරීන් සඳහා වාහන සහ ආපදා ණය සම්බන්ධයෙන්, නිකුත් කර ඇති චක්‍රලේඛ සම්බන්ධයෙන් අනුකූලතාව පරීක්ෂා කිරීම සහ එම ලේඛන සහතික කිරීම

### කාර්යසාධනය

- නීති අංශය විසින් විදුලි සංදේශ පද්ධති බලපත්‍රවල 17(2) වගන්තියට අදාළ කරුණු, සැපයුම්කරුවන්ගේ බලපත්‍ර, ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි, ජාල මෙහෙයුම් සහ විදුලි සංදේශ ක්‍රියාකරුවන් සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් නීතිමය උපදේශ ලබා දීම.
- පාරිභෝගික පැමිණිලි, සිම් කාඩ්පත් ලියාපදිංචි කිරීම, වෙබ් අඩවි සම්බන්ධ ගැටළු සහ නියාමන අනුකූලතාවයට අදාළ අනෙකුත් වැඩසටහන් ඇතුළු අනුකූලතා කටයුතු සඳහා නීති අංශය සාර්ථකව උපදේශ සහ සහාය ලබා දී ඇත. එමෙන්ම, පාලන හා මානව සම්පත් සම්බන්ධ කරුණු සඳහාද මෙම අංශය මහ පෙන්වීමක් සපයයි.
- ජංගම දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, සිම් කාඩ්පත් ලියාපදිංචි කිරීම සහ පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පිහිටුවීම ඇතුළු ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ වැඩසටහන් රැසකට මෙම අංශය ක්‍රියාකාරීව සහභාගී විය.
- 2024 වසරේදී, අධිකරණ නියෝග සැකසීමේ වැඩිවීමක් දක්නට ලැබුණු අතර, අපරාධ පරීක්ෂණ සම්බන්ධයෙන් අධිකරණ නියෝග 869ක් නිකුත් කරමින් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගේ විමර්ශන කටයුතු සඳහා සහාය ලබා දී ඇත.
- විවිධ නියාමන ක්‍රියාකාරකම්වලට අංශය සක්‍රියව සහභාගී වීම හේතුවෙන් 2024 වසර විශේෂයෙන් ඵලදායී වසරක් ලෙස සලකුණට ලක් විය.

### නඩු පැවරීම

- බලපත්‍ර කොන්දේසි පැහැර හැර ඇති බලපත්‍රලාභීන්ගෙන් ව්‍යවස්ථාපිත හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීති අංශය නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.
- කොමිෂන් සභාව සහ ක්‍රියාකරුවන් අතර අභියාචනාධිකරණ නඩු ඇතිවීමට හේතු වූ වර්ණාවලි නැවත වෙන්කිරීම, තරඟ විරෝධී ක්‍රියා, සහ ගුවන්විදුලි ප්‍රවේශ ජාල (RAN) සම්බන්ධ ගැටළු වැනි නොවිසඳුණු කරුණු විසඳමින්, ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව සහ ක්‍රියාකරුවන් අතර කාර්මික ගිවිසුම් ස්ථාපිත කිරීම මඟින් නියාමන ආරවුල් ඵලදායී ලෙස විසඳා ගන්නා ලදී.
- විනිශ්චය සභා සහ බේරුම්කරණ අභියාචනා ඉදිරියේ කොමිෂන් සභා සේවකයින් සම්බන්ධයෙන් ගොනු කර ඇති සියලුම නඩු සඳහා අංශය කාර්යක්ෂමව සහ ක්‍රියාකාරීව කටයුතු කරන ලදී.

### රෙගුලාසි

- 2024 වසරේදී, නව නීති රීති හඳුන්වාදීම සහ පවතින නීති සංශෝධනය කිරීම සඳහා මූලපිරීම් ආරම්භ කරනු ලැබිය. ඒ අනුව, ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ නීති සහ ග්‍රාහක අනන්‍යතා මොඩියුල (සිම්කාඩ්පත්) ලියාපදිංචි කිරීමේ රෙගුලාසි, සේවා තත්ත්ව රීති සංශෝධනය කිරීම ඇතුළත් විය. අදාළ ප්‍රධාන අංශ සමඟ සහයෝගයෙන් තරඟ විරෝධී නීති සමාලෝචනය කිරීම සහ යටිතල පහසුකම් හවුලේ භාවිතය පිළිබඳ රෙගුලාසි සකස් කිරීමද එයට ඇතුළත් විය.
- ඩයලොග් ආසිආටා පීඑල්සී සහ භාරති එයාර්ටෙල් ලංකා (පුද්ගලික) සමාගම් ඒකාබද්ධ කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, 2024 වසර තුළ එම ඒකාබද්ධ කිරීම සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

## විශේෂ ව්‍යාපෘති අංශය

### *සමාලෝචනය*

*ජාතික ප්‍රමුඛතාවයෙන් යුතු ව්‍යාපෘති සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති අංශය වගකියනු ලැබේ. අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපිත කිරීමෙන් විදුලි සංදේශ කර්මාන්තය වැඩිදියුණු කිරීම කෙරෙහි මෙම අංශය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි. ඊට අමතරව, සේවා නොලබන සහ අඩු සේවා සපයන ප්‍රදේශවලට සම්බන්ධතාවය පුළුල් කිරීම, විදුලි සංදේශ සේවා සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා එය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.*

*මෙම අංශයේ ප්‍රධාන වගකීම්වලින් එකක් වන්නේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීමයි. නිම කරන ලද ව්‍යාපෘතිවල අඛණ්ඩ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම පිණිස ඒ සඳහා අඛණ්ඩ පරීක්ෂණ සහ අධීක්ෂණ ක්‍රියාවලියක් අවශ්‍ය වේ.*

### කාර්යසාධනය

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ලට දිගුවක් ලෙස නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සහ සංවර්ධනය කිරීම.
- කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය නවීකරණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (පාසල් ෆයිබර් සම්බන්ධතා ව්‍යාපෘතිය, සුහුරු පාසල් ව්‍යාපෘතිය, ගමට සන්නිවේදනය (Connect Sri Lanka) ව්‍යාපෘතිය)
- කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම

### කාර්යසාධනය

2024 වසර මුළුල්ලේම, විශේෂ ව්‍යාපෘති අංශය පහත දැක්වෙන ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සක්‍රියව කැපවී සිටියේය:

1. කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය
2. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ නව ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම.
3. කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය නවීකරණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.
4. පාසල් ෆයිබර් සම්බන්ධතා ව්‍යාපෘතිය.
5. සුහුරු පාසල් ව්‍යාපෘතිය.
6. "ගමට සන්නිවේදනය" (Connect Sri Lanka) ව්‍යාපෘතිය

### 1. කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය

කොළඹ නෙළුම් කුලුන ශ්‍රී ලංකාවේ අහස් ගැබ සිසාරා නව ආකර්ශනීය හැඩයක් එක් කිරීමට සැලසුම් කළ බහුකාර්ය සන්ධිස්ථානයක් වන අතර, රටේ ආර්ථිකය, සංචාරක ව්‍යාපාරය සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයට දායකත්වයක් සපයයි. එහි නැරඹුම් මැදිරියක්, භෝජන සංග්‍රහ ශාලා, අවන්හල්, ඩිජිටල් කලාගාරයක් සහ සාප්පු සවාරි ප්‍රදේශ වැනි ආකර්ෂණීය පහසුකම් සමඟම විකාශන හා සන්නිවේදන සේවා සඳහා අවශ්‍ය පහසුකම්ද අන්තර්ගත වේ. වාණිජ භාවිතයන් මගින් තිරසාර ආදායමක් උපයා ගැනීම එහි මූලික අරමුණක් වන අතර, එය ශ්‍රී ලංකාවේ ඩිජිටල් විකාශන මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කර ඇත. මහජන හා ආරක්ෂක සන්නිවේදන අවශ්‍යතා සපුරාලීම සඳහා එහි භාවිතය වැඩිදියුණු කිරීමට ද ඒකාබද්ධ ප්‍රයත්නයන් ගෙන ඇත. විශේෂයෙන්, එහි ඉදිකිරීම් සඳහා චීනයේ EXIM බැංකුවෙන් ලබාගත් ණය මුදල 2024 ජූලි 18 වන දින සම්පූර්ණයෙන්ම පියවා අවසන් කිරීම, වැදගත් මූල්‍ය සාර්ථකත්වයක් ලෙස සැලකේ.

### 2. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ නව ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම.

වර්ධනය වෙමින් පවතින අවකාශ අවශ්‍යතා සපුරාලීම සඳහා, මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකය විසින් සැලසුම් කරන ලද මහල් පහක වාහන ව්‍යුහමය අතිරේක ගොඩනැගිල්ලක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිය ප්‍රධාන කාර්යාලයට එක් කිරීම ආරම්භ කර ඇත. පවතින ගොඩනැගිලි සමඟ සම්බන්ධ කර ඉදිකරන මෙම නව ගොඩනැගිල්ල මගින් සේවා සැපයීම වැඩිදියුණු කිරීම, කාර්ය මණ්ඩල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ මහජන සම්බන්ධතාව ශක්තිමත් කිරීම අරමුණු කරයි. තවද, එය ජාතික ප්‍රතිලාභ සඳහා ප්‍රශස්ත ඉඩම් භාවිතයට ද දායක වේ. ව්‍යාපෘතිය මේ වනවිට අවසන් අදියරට ළඟා වී ඇති අතර, ඉදිකිරීම් වැඩ බහුතරයක් සම්පූර්ණ කර ඇත. අධීක්ෂණය සහ ඉදිකිරීම ඇතුළුව භාරදීමේ ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. අභ්‍යන්තර සැලසුම් කටයුතු අවසන් කර ඇති අතර, කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේ (ප්‍රසම්පාදන) ක්‍රියාවලිය ද ක්‍රියාත්මක වෙමින් පවතී.

### 3. කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය නවීකරණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.

කදිරාන සංවර්ධන ව්‍යාපෘතිය 2019 පෙබරවාරි මාසයේ ආරම්භ වී 2024 වන විට සම්පූර්ණ කර ඇත. ආසන්න වශයෙන් වර්ග අඩි 4,960ක ප්‍රමාණයකින් යුත් ප්‍රධාන ගොඩනැගිල්ල මේ වනවිට ඵලදායී ලෙස භාවිතයට සූදානම් කරමින් පවතී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන පහසුකම තුළ තොරතුරු තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇත. තවද, ප්‍රාදේශීය කාර්යාලයක් සහ සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයක් ලෙස භාවිතයට ගන්නා අතිරේක ගොඩනැගිලිද සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය තාක්ෂණික මෙන්ම පරිපාලන ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා වැදගත් දායකත්වයක් සපයයි.



*රූපසටහන 3: කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය නවීකරණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.*

## 4. පාසල් ෆයිබර් සම්බන්ධතා ව්‍යාපෘතිය

2023 වසරේ ආරම්භ කරන ලද පාසල් ෆයිබර් සම්බන්ධතා ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාව පුරා පාසල්වලට අධිවේගී අන්තර්ජාල පහසුකම් ලබාදීම තුළින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය ඉහළ නැංවීම අරමුණු කරයි. ආරම්භයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ සහාය ඇතිව පාසල් 1,000ක් ඉලක්ක කර ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය තුළින් බලපත්‍රලාභී ක්‍රියාකරුවන් දෙදෙනෙකුගේ සහයෝගය මත විශේෂ ගාස්තු ක්‍රමයක් සහ දැරිය හැකි සේවාවක් සපයයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් යටිතල පහසුකම් සඳහා දරන ලද පිරිවැයෙන් කොටසක් සහනාධාර වශයෙන් ලබාදී ඇත. මේ වනවිට පාසල් 500කට වැඩි සංඛ්‍යාවකට සම්බන්ධතාවය ලබා දීම අවසන් කර ඇති අතර, රටපුරා තවත් පාසල් වෙත බාධාවකින් තොරව ඩිජිටල් ප්‍රවේශය ලබාදීම පිණිස මෙම ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කරමින් පවතී.

## 5. සුහුරු පාසල් ව්‍යාපෘතිය

උසස් පෙළ විභාගය සඳහා විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උගන්වන පාසල්වලට අවශ්‍ය තාක්ෂණික සම්පත් සැපයීම මගින් ශ්‍රී ලංකාවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම සුහුරු පාසල් ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මෙම වැඩසටහන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම තුළින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සමස්ත සංවර්ධනයටද දායකත්වය සපයයි. චීන ආධාර ව්‍යාපෘතියට සමගාමීව ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කළේය.

## 6. “ගමට සන්නිවේදනය” (Connect Sri Lanka) ව්‍යාපෘතිය

“ගමට සන්නිවේදනය” ව්‍යාපෘතිය 2020 වසරේ ආරම්භ වූ අතර, රටපුරා 4G සහ ෆයිබර් බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණය පුළුල් කිරීම තුළින් තාක්ෂණය මත පදනම් වූ සමාජයක් ගොඩනැගීම එහි අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය කොමිෂන් සභාවේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වන අතර, ඩිජිටල් පරතරය අවම කිරීම සඳහා නව ජංගම කුලුණු ඉදිකිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි. 2024 අවසන් වන විට නව කුලුණු 65ක් ස්ථාපනය කිරීම ආරම්භ කර ඇති අතර, එමගින් ප්‍රධාන ප්‍රදේශවල සම්බන්ධතාවය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇත. දිස්ත්‍රික් කිහිපයක කැපීපෙනෙන ප්‍රගතියක් අත්කරගෙන තිබුණද, වසංගත තත්ත්වය, අයහපත් කාලගුණය, ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු සහ ඉදිකිරීම් වියදම් ඉහළ යාම වැනි අභියෝග හේතුවෙන් ඇතැම් ප්‍රදේශ සඳහා සම්බන්ධතා සැපයීමේ ප්‍රමාදයන් ඇතිවී ඇත. මෙම බාධක ජය ගැනීම සඳහා යාවත්කාලීන මාර්ගෝපදේශ සහ ක්‍රියාකරුවන් සමඟ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදු කරමින්, රටපුරා ඩිජිටල් සම්බන්ධතාවය ක්‍රමයෙන් ශක්තිමත් කරමින් පවතී.

## ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා

### *සමාලෝචනය*

පනතේ 4 (c) වගන්තිය මගින් නියම කර ඇති පරිදි, රාජ්‍ය විදුලි සංදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබාදීමේ බලය කොමිෂන් සභාවට හිමි වේ.

පනතේ 5(i) සහ 5(j) වගන්ති මගින් කොමිෂන් සභාවට විදුලි සංදේශ සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ එහි අනුබද්ධ ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට බලය පවරනු ලැබේ.

4(g) සහ 5(s) වගන්තිවලට අනුව, දේශීය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් විදුලි සංදේශ සම්බන්ධ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ වගකීම කොමිෂන් සභාවට පැවරී ඇත. මෙම කාර්යය ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර, පර්යේෂණ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, අධ්‍යයන කටයුතු උත්තේජනය කිරීම සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා පර්යේෂණ ප්‍රතිඵල භාවිතයට ගැනීම එහි ප්‍රධාන අරමුණු වේ.

ඉහත සඳහන් රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය නියාමන කාර්යයන් ඉටු කිරීම පිණිස ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා (P & IR) අංශය වගකිව යුතුය.

තවද මෙම අංශය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා-ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමන සංගමය (SATRC) වැනි ජාත්‍යන්තර නියාමන ආයතන සඳහා සම්බන්ධීකරණ කේන්ද්‍රස්ථානයක් ලෙසද ක්‍රියා කරයි.

### කාර්යයන්

- විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම.
- දේශීය විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ සහයෝගීතාවයෙන් විදුලි සංදේශ ආශ්‍රිත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- විදුලි සංදේශ ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයනයන් සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවලට මූල්‍ය ආධාර සැපයීම.
- දුරස්ථ ප්‍රදේශවල සිසුන් සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධාරිතා වර්ධනය, විශේෂඥ හා තාක්ෂණික සහාය, විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ ගැටළු, දේශසීමා සම්බන්ධීකරණය සහ ජාත්‍යන්තර දැනුම්දීම් ඇතුළු කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය (SATRC) මෙන්ම අනෙකුත් රටවල කලාපීය විදුලි සංදේශ නියාමන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ජාත්‍යන්තර සංවිධානවලින් ලැබෙන තොරතුරු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහ අදාළ සංවිධාන අතර බෙදා හැරීම.
- ප්‍රශ්නාවලි මගින් විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යාලේඛන සහ ආයතනික තොරතුරු එකතු කර, ඒවා සකස් කර සම්පාදනය කිරීමෙන් පසු ජාත්‍යන්තර සංවිධාන සමඟ බෙදා ගැනීම.

### කාර්යසාධනය

2024 වසරේදී, විදුලි සංදේශ ප්‍රතිපත්ති වැඩසටහන්, සංවර්ධන ව්‍යාපෘති, පර්යේෂණ ක්‍රියාකාරකම් සහ ජාත්‍යන්තර සහයෝගීතාව ඉදිරියට ගෙන යාම පිණිස ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළේය.

එමගින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන හතක් සඳහා අරමුදල් සැපයීම සහ ඒවා අධීක්ෂණය කිරීම සඳහා පහසුකම් සලසා ඇත. එමෙන්ම දේශීය හා ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන් සඳහා ද සහාය ලබා දී ඇත. විශේෂඥ සහාය වැඩසටහන්ද සම්බන්ධීකරණය කර ඇත. තවද, මෙම අංශය ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් 49ක් සඳහා පහසුකම් සලසා ඇති අතර, එමගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයතනික ධාරිතාව සහ ගෝලීය හවුල්කාරිත්වයන් සැලකිය යුතු ලෙස ශක්තිමත් කර ඇත.

### විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධනය

යාපනය විශ්වවිද්‍යාලය විසින් *"5G සහ අනාගත රැහැන් රහිත තාක්ෂණයන් සඳහා යන්ත්‍ර ඉගෙනුම් මත පදනම් කරගත් සුහුරු ඇන්ටෙනා නිර්මාණය"* සහ රුහුණු විශ්වවිද්‍යාලය විසින් *"ජංගම ජාල තුළ බ්ලොක්චේන් තාක්ෂණය භාවිතයෙන් ගුවන්විදුලි සංඛ්‍යාත විකිරණ නිරාවරණ මට්ටම් මැනීම"* යන ප්‍රධාන පර්යේෂණ අධ්‍යයන 2023 සිට 2024 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.

2024 මාර්තු මාසයේදී, අවසන් ඉදිරිපත් කිරීම් හා වාර්තා ඉදිරිපත් කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, යාපනය සහ රුහුණු විශ්වවිද්‍යාල දෙකටම අවසාන ගෙවීම් සිදු කරන ලදී.

පර්යේෂකයින්, විශ්වවිද්‍යාල සිසුන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා නිලධාරීන් සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ විශේෂඥයින් එක්රැස් කරමින්, පහත සඳහන් තෝරාගත් අධ්‍යයනයන්හි මූලික ඉදිරිපත් කිරීම් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී. මෙම පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන මගින් 2024 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර, මොරටුව, කැලණිය සහ රුහුණු විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණ දායකත්වයන් ප්‍රදර්ශනය කර ඇති අතර, එහි නවතම පර්යේෂණ අධ්‍යයනයන් ද ඇතුළත් වේ:

- ශබ්දය තුළ පුද්ගලාරෝපිත කථන බුද්ධිය වැඩි දියුණු කිරීම සඳහා අවකාශීය ශබ්ද පටිගත කිරීම සහ ප්‍රතිනිෂ්පාදනය
- ස්වාධීන ජීවන සහාය සඳහා අන්තර්ජාලයේ දෑ - පාදක නින්ද නිරීක්ෂණ මෙවලම්
- දිගු කාලීන පරිණාමය - කාල විබෙදුම් ද්විත්ව සන්නිවේදන (LTE-TDD) ජාලවල වායුගෝලීය නාලිකා බාධා අවම කිරීම සඳහා යන්ත්‍ර ඉගෙනුම් - සක්‍රිය ජාල ප්‍රශස්තිකරණය.
- දෘශ්‍යාබාධිත පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික සහභාගීත්වය සහ ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම සඳහා නව්‍ය මෘදුකාංග විසඳුම්.

- කොළඹ නාගරික ජනගහනය: කොළඹ සඳහා සුහුරු සංවේදන ජාලය.

මූලික ඉදිරිපත් කිරීම් මූලික ඉදිරිපත් කිරීම් අවසන් වූ අනතුරුව, 2024 දෙසැම්බර් මාසයේදී ඉහත සඳහන් පර්යේෂණ අධ්‍යයන සඳහා මූල්‍ය සහාය ලබා දීමට අදාලව ගෙවීම්වල පළමු වාරිකය නිකුත් කරන ලදී. මෙම ක්‍රියාමාර්ගය මගින් අත්‍යවශ්‍ය සම්පත් සැපයීමත්, ශාස්ත්‍රීය සහ කර්මාන්ත ක්ෂේත්‍ර අතර සහයෝගීතාවය ශක්තිමත් කිරීමත් මගින් පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමෙහි ලා කොමිෂන් සභාවේ අඛණ්ඩ කැපවීම පැහැදිලි වේ.

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2024

2024 වර්ෂයේ දී, කොමිෂන් සභාව, මොරටුව විශ්වවිද්‍යාලය සහ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහනක් ආරම්භ කර ක්‍රියාත්මක කළ අතර, එහි දී මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ උපාධි අපේක්ෂකයින් 35 දෙනෙකු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡාදායකයින් ලෙස තෝරා ගන්නා ලදී.

තෝරාගත් තොරතුරු තාක්ෂණ ස්වේච්ඡාදායකයින් මොරටුව විශ්ව විද්‍යාලයේ පැවැත්වූ සතියක ආරම්භක පුහුණු කඳවුරකට සහභාගී වූ අතර, ඒ සඳහා විශ්ව විද්‍යාලය, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සහ විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ සම්පත් දායකයින් සහභාගී විය. මෙම කඳවුර තුළ, ස්වේච්ඡා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, පාසල්වල සේවය කිරීමේදී මතුවන අභියෝගවලට මුහුණ දීම, පරිගණකමය චින්තනය, දත්ත විද්‍යාවට හැඳින්වීම, ඉගැන්වීම හා ඉගෙනීම සඳහා කෘතිම බුද්ධිය භාවිතය, වෙබ් හා ජංගම යෙදුම් සංවර්ධනයට මූලික හැඳින්වීම, ස්මාර්ට් අධ්‍යාපනය, ජාවා භාෂාවෙන් වැඩසටහන්කරණය, පරිගණක ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය සහ සමාජ මාධ්‍ය ආරක්ෂිත භාවිතය වැනි විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් අධ්‍යාපනික පුහුණු සැසි සංවිධානය කරන ලදී.

ආරම්භක පුහුණු කඳවුර අවසන් වීමෙන් අනතුරුව, 2024 ඔක්තෝබර් මාසයේදී දිස්ත්‍රික්ක 13 ක රජයේ පාසල්වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අධ්‍යාපනය ශක්තිමත් කිරීම හා ඩිජිටල් කුසලතා වර්ධනය සඳහා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡාදායකයින් 35 දෙනෙකු මාස දෙකක කාලයක් සඳහා යොදවා තිබුණි.



*රූපසටහන 5: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2024 හි ආරම්භක කඳවුරේ සමාරම්භක උත්සවයේදී ගන්නා ලද සමූහ ඡායාරූපය*

### කොරියානු ජනරජයේ ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය - ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (NIA-APT) සහයෝගීත්වයෙන් කොරියානු ලෝක මිත්‍රත්ව තොරතුරු තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2024

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහ ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කළ "කොරියානු ජනරජයේ ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය - ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සහයෝගීත්වයෙන් පවත්වන ලද කොරියානු ලෝක මිත්‍රත්ව තොරතුරු තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2024" මගින්, ඌව පළාතේ ගුරුවරුන්ට සහ ශිෂ්‍යයන්ට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පුහුණු අවස්ථා සපයන ලදී. කොරියානු තොරතුරු තාක්ෂණ ස්වේච්ඡාදායකයින් විසින් වැලිමඩ බ/බෝගහකුඹුර මහා විද්‍යාලය කේන්ද්‍ර කරගනිමින්, 2024 ජූලි 8 සිට 19 දක්වා මාර්ගගත පුහුණු සැසිද, 2024 ජූලි 23 සිට අගෝස්තු 2 දක්වා ස්ථානීය පුහුණු වැඩසටහන්ද ක්‍රියාත්මක කරන ලදී.






*රූපසටහන 4: 2024 කොරියානු ලෝක මිත්‍රත්ව ස්වේච්ඡා වැඩසටහනේ සමාරම්භක උත්සවයේ ඡායාරූප*



*රූපසටහන 7: 2024 කොරියානු ලෝක මිත්‍රත්ව ස්වේච්ඡා වැඩසටහනේ සමාප්ති උත්සවයේ ඡායාරූප*




*රූපසටහන 6: දකුණු කොරියාවේ සෝල් නුවර පැවති WFK ICT ස්වේච්ඡා වැඩසටහනේ කාර්ය සාධන වාර්තා සමුළුව 2024*

### *ජාත්‍යන්තර සබඳතා*

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) දිගුකාලීන ස්ථාවර සාමාජිකයෙකි. විදුලි සංදේශ නියාමන කටයුතු පිළිබඳ සියලුම ආනුෂාංගික කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය හෝ එහි අනුබද්ධ ආයතන සමඟ සාකච්ඡා කිරීමට නීත්‍යානුකූල බලය හිමි එකම ආයතනය වන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවයි (TRCSL).

ඉහත සඳහන් ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්වය ලබා තිබීම හේතුවෙන්, විදුලි සංදේශ හා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික හා විශේෂඥ සහාය, සහයෝගීතා ව්‍යාපෘති, විවිධ වැඩසටහන් සහ ශිෂ්‍යත්ව අවස්ථා ලබා ගැනීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට (TRCSL) හැකියාව සැලසේ.

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරයි.

### ජාත්‍යන්තර සංවිධාන සහ කලාපීය නියාමන ආයතන සමඟ සහයෝගීතාවය පවත්වා ගැනීම

#### 1. විශේෂඥ සහාය වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය වැනි ජාත්‍යන්තර සංවිධානවල ඉල්ලීම් අනුව සාමාජික රටවලට තාක්ෂණික සහාය ලබාදීම සඳහා, ප්‍රතිපත්ති හා ජත්‍යන්තර සබඳතා අංශය විශේෂඥ බඳවා ගැනීම්, රැස්වීම් සංවිධානය, මහජන උපදේශන, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ සැපයුම් ක්‍රියාවලීන් සම්බන්ධීකරණය කිරීම තුළින් මෙම ක්‍රියාවලියට දායක වේ.

ලෝක බැංකුවේ ඩිජිටල් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම (DPO) යටතේ, ශ්‍රී ලංකාවේ ජාතික ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය ශක්තිමත් කිරීම සහ බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත විශේෂඥ සහාය ලබාදෙන ලදී.

ලෝක බැංකුවේ විශේෂඥ සහාය වර්ණාවලි කළමනාකරණය, තරඟකාරිත්ව රීති සහ විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම (2024 ජූලි 17 වන දින සහතික කරන ලද 2024 අංක 39 දරන විදුලි සංදේශ පනත සංශෝධනය) වැනි ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, යටිතල පහසුකම් හවුලේ භාවිතය සඳහා රාමුවක් සංවර්ධනය කිරීම පිණිස ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහාය ලබා දෙන ලදී.

## 2. ඉහළ මට්ටමේ රැස්වීම් සහ සම්මන්ත්‍රණ වලදී රටේ නියෝජනයන් සම්බන්ධීකරණය කිරීම

මෙම අංශය අදාළ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය සම්බන්ධීකරණය කරමින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විධායක කාර්ය මණ්ඩලයට පහත සඳහන් ඉහළ මට්ටමේ රැස්වීම්/සම්මේලනවලට සහභාගී වීමට පහසුකම් සැලසීය.

- දකුණු ආසියානු විදුලි සංදේශ නියාමන කවුන්සිලයේ 25 වන රැස්වීම (SATRC -25)
- ආසිය ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ (MC-48) කළමනාකරණ කමිටුවේ 48 වන සැසිය

## 3. ධාරිතා ගොඩනැගීම සහ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ දැනුම හුවමාරුව සඳහා පශ්චාත් පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා මෙම අංශය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, අසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය කළ අතර, උසස් පුහුණු කමිටුවේ (ATC) අනුමැතියට අනුව ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සහභාගී වීමට අදාළ නිලධාරීන් නම් කිරීමද සිදු කරන ලදී.

| වැඩසටහන් කාණ්ඩය | ITU | APT | වෙනත් | මුළු වැඩසටහන් ප්‍රමාණය | සහභාගිවන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පුහුණුවීම් | 02 | 15 | 01 | 18 | **22** |
| සම්මන්ත්‍රණ | 01 | - | 02 | 03 | **03** |
| සමුළු | - | - | 05 | 05 | **11** |
| රැස්වීම් | 09 | 07 | 01 | 17 | **19** |
| සංසද | - | 01 | 01 | 02 | **02** |
| වැඩමුළු | 04 | - | - | 04 | **04** |
| **මුළු එකතුව** | **16** | **23** | **10** | **49** | **61** |

*වගුව 13: උසස් පුහුණු කමිටුව විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර වැඩසටහන් වල සාරාංශය - 2024*

| අයිතමය | ITU | APT | වෙනත් | එකතුව |
|---|---|---|---|---|
| සාමාජිකත්ව වැඩසටහන් | 16 | 23 | 10 | 49 |
| TRCSL අරමුදල් සපයන වැඩසටහන් | - | - | - | - |
| **මුළු ජාත්‍යන්තර වැඩසටහන් සංඛ්‍යාව** | 16 | 23 | 10 | 49 |

*වගුව 14: අනුමත ජාත්‍යන්තර වැඩසටහන් සඳහා අරමුදල් සපයන ආකාරය - 2024*

තවද, ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය, ගෝලීය ජංගම සන්නිවේදන පද්ධති සංගමය (GSMA) සහ අන්තර්ජාල සංගමය (ISOC) සමඟ එක්ව සංවිධානය කළ පහත සඳහන් මාතෘකා යටතේ පැවැත්වූ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ දේශීය පුහුණු වැඩසටහන් පහකට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා නිලධාරීන් 25 දෙනෙකුගේ සහභාගීත්වය සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදී.

## 4. ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය 2024

ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) වාර්ෂිකව සමරනු ලබන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ප්‍රතිලාභ හා ඩිජිටල් පරතරය තුරන් කිරීමේ දී එහි වැදගත්කම පිළිබඳව ගෝලීය දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහාය. ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2024 මඟින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය ආරම්භයට මූලික වූ පළමු ජාත්‍යන්තර ටෙලිග්‍රාෆ් සම්මුතියේ 159 වැනි සංවත්සරය ද සිහිපත් කෙරේ.

2024 වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය සැමරීම සඳහා, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් සාමාජික රටවලට 'තිරසාර සංවර්ධනය සඳහා ඩිජිටල් නවෝත්පාදනය' යන තේමාව ප්‍රවර්ධනය කරන ලෙස ආරාධනා කරන ලදී. ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා අංශය විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2024 ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දින පණිවුඩ කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කළ අතර, එමඟින් මහජනතාව අතර තේමාව පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කරන ලදී. එසේම, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකු විසින් මෙහෙයවූ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්ගගත සහ මාර්ගගත නොවන ආකාරයෙන් කාර්ය මණ්ඩල සහභාගීත්වයෙන් කොමිෂන් සභාවේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

## 5. විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත සමීක්ෂණ සහ අදාළ ප්‍රශ්නාවලිය

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ /තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක ප්‍රශ්නාවලිය 2024**

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ තොරතුරු ඇතුළත් කරමින් 2024 වසර සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ දර්ශක කෙටි හා දිගු ප්‍රශ්නාවලිය සම්පූර්ණ කර නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීම සහතික කළේය. ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක 70ක් ආවරණය කළ දිගු ප්‍රශ්නාවලිය සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී අදාළ පැහැදිලි කිරීම්ද ලබා දෙන ලදී.

මෙම දත්ත රජයන්, ජාත්‍යන්තර සංවිධාන සහ මූල්‍ය ආයතන විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන දර්ශක ගණනය කිරීම සහ ගෝලීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විශ්ලේෂණය සඳහා භාවිතා කරයි. එමෙන්ම, ලෝක විදුලි සංදේශ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක දත්ත සමුදාය, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සංඛ්‍යාලේඛන වාර්තා සහ ලෝක බැංකු ප්‍රකාශන යාවත්කාලීන කිරීමටද මෙම දත්ත දායක වේ.

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන සමීක්ෂණය 2024**

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විදුලි සංදේශ සංවර්ධන කාර්යාංශය විසින් සාමාජික රටවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සහ නියාමන තොරතුරු රැස් කිරීමේ අරමුණින් ලෝක විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන සමීක්ෂණය වාර්ෂිකව පවත්වයි. 2024 සඳහා මෙම සමීක්ෂණය අනෙකුත් අංශ සමඟ සම්බන්ධීකරණයෙන් නියමිත කාලය තුළ සාර්ථකව නිම කරන ලදී.

ඩිජිටල් ප්‍රතිපත්ති හා නියාමනය සඳහා ගෝලීය මට්ටමේ මිණුම් සලකුණු මෙවලමක් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) නියාමන ට්‍රැකර් යාවත්කාලීන කිරීම සඳහා දත්ත සහාය ලබා දෙන ලදී. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) විසින් සංවර්ධනය කරන ලද මෙම සාක්ෂි පදනම් වූ අන්තර්ක්‍රියාකාරී මෙවලම ලෝක ව්‍යාප්ත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නීතිමය හා නියාමන රාමු වල වේගවත් වෙනස්වීම් නිරීක්ෂණය කිරීම, සසඳා බැලීම සහ විශ්ලේෂණය කිරීම සඳහා භාවිතා වේ. සහයෝගී ඩිජිටල් නියාමනයේ ප්‍රගතිය ප්‍රදර්ශනය කරමින්, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ පස්වන පරම්පරාවේ සහයෝගී නියාමන (G5) මිණුම් ලකුණ යටතේ—ඩිජිටල් යුගයේ ප්‍රතිපත්ති සම්පාදකයින් හා නියාමකයින් සඳහා මඟපෙන්වීම සපයන රාමුවක්—ශ්‍රී ලංකාව ඩිජිටල් නියාමන සූදානම සම්බන්ධයෙන් "උසස්" ශ්‍රේණිගත කිරීමක් හිමිකර ගත්තේය.

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය / ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රශ්නාවලිය, නිර්දේශ සහ අනෙකුත් සමීක්ෂණ**

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය, පහත සඳහන් සමීක්ෂණ, ප්‍රශ්නාවලිය සහ නිර්දේශ සම්පාදන කටයුතු සාර්ථකව නිම කිරීම සඳහා අනෙකුත් අංශ, විදුලි සංදේශ ක්‍රියාකරුවන් සහ රජයේ ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කරන ලදී.

## 6. ජාත්‍යන්තර සංවිධානවල වාර්ෂික දායකත්වයන්

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, ආසියානු ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ සාමාජිකත්වය තුළින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය, නව තාක්ෂණයන් අනුගමනය කිරීම සහ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය විශේෂඥ සහාය, පුහුණු අවස්ථා සහ ශිෂ්‍යත්ව යනා දී ප්‍රතිලාභ ලබා ගැනීමට අවකාශ සැලසිණි. 2024 මූල්‍ය වර්ෂය තුළ මෙම සංවිධාන සඳහා සාමාජික දායක ගෙවීම් සිදු කිරීමට කොමිෂන් සභාව කටයුතු කළ අතර, 2024 පළමු කාර්තුවේදී ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය වෙත ස්විස් ෆ්‍රෑන්ක් (CHF) 79,500ක් ප්‍රේෂණය කරන ලදී. එසේම, 2024 පළමු සහ තෙවන කාර්තුවලදී පිළිවෙලින් ආසියානු ශාන්තිකර විදුලි සංදේශ සංගමය සඳහා ඇමරිකානු ඩොලර් 15,420ක් සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය සඳහා ඇමරිකානු ඩොලර් 15,000ක් බැගින් දායක ගෙවීම් සම්පූර්ණ කරන ලදී.

## තොරතුරු තාක්ෂණය

### සමාලෝචනය

*අත්‍යවශ්‍ය පාර්ශවකරුවන් අතර හිතකර වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංග, විසඳුම් සහ වේදිකා ඒකාබද්ධ කරමින්, තොරතුරු තාක්ෂණ (IT) අංශය කොමිෂන් සභාව තුළ ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. මෙමගින් කොමිෂන් සභාවේ අභ්‍යන්තර හා බාහිර ක්‍රියා පටිපාටි විධිමත් කරමින්, කාර්ය මණ්ඩලයට සහ ගනුදෙනුකරුවන්ට තාක්ෂණය සම්පූර්ණයෙන් උපයෝගී කර ගැනීමට අවස්ථාව සලසයි. එසේම, නවතම තාක්ෂණ ප්‍රවණතා සමඟ අනුකූලව අභ්‍යන්තර හා බාහිර ක්‍රියාවලීන් සිදු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් වූ විසඳුම් කොමිෂන් සභාවේ සේවකයින්ට සහ ගනුදෙනුකරුවන්ට ලබා දීමට මෙම වැඩපිළිවෙළ උපකාරී වේ.*

### කාර්යයන්

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සහ පාලන රාමුව සකස් කිරීම හා නඩත්තු කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාලය කළමනාකරණය කිරීම සඳහා ආරක්ෂක උපාය මාර්ගයක් නිර්වචනය කිරීම.
- ආයතනයේ ඩිජිටල් පරිවර්තනය වැඩිදියුණු කිරීම සඳහා නව තාක්ෂණයන් පිළිබඳ උපායමාර්ගික තක්සේරුව.
- වැඩ සංස්කෘතිය, ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා උපායමාර්ග සංවර්ධනය කරමින්, මෘදුකාංග පද්ධති, දත්ත සමුදා සහ යටිතල පහසුකම් යෙදවීම හා කළමනාකරණය කිරීම සිදු කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වත්කම් ලේඛනය සංවර්ධනය කර පවත්වාගෙන යාම සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
- ඩිජිටල් පරිවර්තනය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා වර්ධනය සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම.
- තොරතුරු තාක්ෂණ අංශය සහ කොමිෂන් සභාව තුළ කාර්යක්ෂම වැඩ සංස්කෘතියක් සංවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

### කාර්යසාධනය

ආරම්භ කරන ලද ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍ර පහත පරිදි වේ:

1. යටිතල පහසුකම් සංවර්ධනය
2. පද්ධති සහ ක්‍රියාවලි සංවර්ධනය
3. තොරතුරු තාක්ෂණ පාලනය
4. සේවක දැනුවත්භාවය සහ පුහුණුව ලබාදීම

### 1. යටිතල පහසුකම් සංවර්ධනය

බාධාවකින් තොර සන්නිවේදනය සහ සහයෝගී වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම අරමුණු කරගනිමින්, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නවතම තාක්ෂණයන් භාවිතා කරමින් කොමිෂන් සභාවේ ජාල හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත. වැඩිදියුණු කළ ප්‍රවේශය සහ ආරක්ෂාව ලබා ගැනීම සඳහා පරිශ්‍රයේ ක්‍රියාකාරී නාමාවලිය ක්ලවුඩ (cloud) පද්ධතියට සංක්‍රමණය කිරීමත්, සයිබර් ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ අවදානම් අවම කිරීම සඳහා ජාල ඛණ්ඩනය ක්‍රියාත්මක කිරීමත් ප්‍රධාන මුලපිරීම් ලෙස ඇතුළත් වේ.

යල්පැන ගිය පුද්ගලික සහ ලැප්ටොප් පරිගණක නවීකරණය කර ඇති අතර, කාර්ය මණ්ඩලයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා නව ලැප්ටොප් ලබා දීමද සිදු කර ඇත. තොරතුරු තාක්ෂණ අංශය විසින් පරිගණක හා ලැප්ටොප් අලුත්වැඩියා කිරීම ආයතනය තුළම සිදු කිරීම ආරම්භ කළ අතර, ඒ මගින් අක්‍රිය කාලය සහ නඩත්තු වියදම් සාර්ථක ලෙස අඩු කර ඇත. මෙම සියලු සංවර්ධන එකට ගත්විට, කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ පද්ධතිය වඩාත් ආරක්ෂිත, කාර්යක්ෂම සහ සම්බන්ධීකරණයෙන් යුතු පරිසරයක් බවට පත් වී ඇත.

### 2. පද්ධති සහ ක්‍රියාවලි සංවර්ධනය

2024 වසරේ දී කොමිෂන් සභාව නව නිල වෙබ් අඩවිය සාර්ථකව ආරම්භ කරමින් වෙබ් අඩවි ප්‍රතිනිර්මාණයේ පළමු අදියර සම්පූර්ණ කළේය. මෙම වෙබ් අඩවිය ක්ලවුඩ පදනමක් මත ක්‍රියාත්මක වන අතර, විශේෂාංග හා පරිශීලක අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව සංවර්ධනය කෙරේ. මහජනතාව සහ පාර්ශවකරුවන් සමඟ ආරක්ෂිත සන්නිවේදනය තහවුරු කිරීම සඳහා, වෙබ් අඩවිය SSL සහතිකයක් සහ වෙබ් ෆයර්වෝල්යක් මගින් ආරක්ෂා කර ඇත.

ප්‍රතිලාභීන්ට ලබාදෙන ඩිජිටල් සේවා වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විසින් නව පද්ධති හා ක්‍රියාවලි කිහිපයක් ක්‍රියාත්මක කිරීමට ආරම්භ කළේය. එහිදී මූල්‍ය පද්ධතියේ නියමු අනුවාදය හඳුන්වාදීම, ඇන්ටෙනා ව්‍යුහ කළමනාකරණ පද්ධතිය (ASMS) ක්ලවුඩ වෙත මාරු කිරීම සහ ගුවන් යානා මෙහෙයුම් වඩා විධිමත් කිරීමට ප්‍රවාහන කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම ප්‍රධාන මුලපිරීම් ලෙස කැපී පෙනේ.

තවද, මූල්‍ය අංශ ස්වයංක්‍රියකරණ ක්‍රියාවලිය දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, තෝරාගත් අංශවල වැඩ ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීමට සහ ක්‍රියාකාරී පරිවර්තනයට සහාය වීම සඳහා අදාළ පියවර ගෙන ඇත.

### 3. තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහය

ආයතනයේ තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති අනුකූලතාව තහවුරු කිරීමේ අරමුණින්, තොරතුරු තාක්ෂණ අංශය විසින් තොරතුරු ආරක්ෂණ මාර්ගෝපදේශ සකස් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මෙම ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශේෂඥ උපදේශන සහාය ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කර ඇත. එම සහයෝගීතාවය විධිමත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) සමඟ අවබෝධතා ගිවිසුමක් (MOU) ද සකස් කර ඇත.

මෙම ප්‍රයත්නයේ කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka Computer Emergency Readiness Team - SLCERT) විසින් විස්තීර්ණ සයිබර් ආරක්ෂණ තක්සේරුවක් සාර්ථකව සිදු කර ඇත. සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය පදනම් කරගනිමින්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති යොදා ගැනීමේ දී ප්‍රශස්ත භාවිතයන් අනුගමනය කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කරනු ලැබේ. අවබෝධතා ගිවිසුම (MOU) අත්සන් කිරීමෙන් අනතුරුව, ආරක්ෂක පියවරයන්

වඩාත් ශක්තිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳ සාමාන්‍ය පාලන සමාලෝචන, තාක්ෂණික දෝෂ විනිශ්චය සමාලෝචන සහ ක්‍රියාවලි-මූලික තොරතුරු තාක්ෂණ අවදානම් තක්සේරු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මීට අමතරව, ජාල ආරක්ෂාව හා ප්‍රවේශ පාලන ක්‍රමයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, තොරතුරු තාක්ෂණ අංශය විසින් ෆයර්වෝල් සැකසුම් සහ ක්‍රියාකාරී නාමාවලි ප්‍රතිපත්ති යාවත්කාලීන කර කාර්යක්ෂමතාව වැඩි දියුණු කර ඇත.

### 4. කාර්ය මණ්ඩල හා පුහුණු වැඩසටහන්

තොරතුරු තාක්ෂණ අංශය විසින් කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ දැනුවත් කිරීමේ සැසි කිහිපයක් සහ පුහුණු වැඩසටහන් කිහිපයක් වසර පුරා පවත්වන ලද අතර එමඟින් නවතම තොරතුරු තාක්ෂණ ආශ්‍රිත තාක්ෂණයන් පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලදී. මෙම මූලපිරීම්වල කොටසක් ලෙස, නවීන ඩිජිටල් මෙවලම් භාවිතයෙන් ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා සියලුම කාර්ය මණ්ඩලයට Microsoft 365 හි නව විශේෂාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙන ලදී.

## පාලන සහ ආයතනික කටයුතු අංශය

### සමාලෝචනය

*ආයතනයේ සමස්ත ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව සහ සුමටව පවත්වාගෙන යාම සඳහා මෙම අංශය මූලික හා වැදගත් භූමිකාවක් ඉටු කරයි. එහි වගකීම් සහ කාර්යයන් විශාල පරාසයක පැතිර ඇති අතර, මානව සම්පත් හා ආයතනික කටයුතු සම්බන්ධ පරිපාලනය, කළමනාකරණය සහ සංවර්ධනය මෙහි ප්‍රධාන වගකීම් ලෙස පවතී.*

*කොමිෂන් සභාවේ කටයුතු සැලසුම් කිරීම හා ඒවායේ ක්‍රියාත්මක වීම අධීක්ෂණය කිරීමත්, සේවකයින්ගේ කාර්ය සාධනය උසස් කිරීමට සුදුසු සහ හිතකර භෞතික වැඩ පරිසරයක් සකස් කර පවත්වාගෙන යාමත්, එසේම ආයතනය තුළත් වෙනත් ආයතන සමඟත් කාර්යක්ෂම සම්බන්ධීකරණයක් ස්ථාපිත කිරීමත් මෙම අංශයේ වගකීම් පරාසයට අයත් වේ.*

*තවද, කාර්ය මණ්ඩලය සඳහා කාර්යාල අවශ්‍යතා සහ ආධාරක පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩලයේ සුභසාධනය සහතික කිරීම, පුස්තකාල පහසුකම් සැපයීම සහ ආයතනයේ වැදගත් සිදුවීම් මාධ්‍ය ආවරණය කිරීම මෙම අංශය විසින් කළමනාකරණය කරනු ලැබේ.*

### කාර්යයන්

- කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, සේවකයන් ස්ථිර කිරීම, උසස්වීම් කළමනාකරණය, නිවාඩු සහ පැමිණීමේ වාර්තා පවත්වා ගැනීම, විනය සම්බන්ධ පරීක්ෂණ ක්‍රියාත්මක කිරීම සහ විශ්‍රාම ගැන්වීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය ගමන් සැලසුම්, ලියාපදිංචි ක්‍රියාවලිය සහ අනෙකුත් සම්බන්ධිත කටයුතු ක්‍රියාත්මක කිරීම.
- කොන්ත්‍රාත් සේවා, ප්‍රසම්පාදන, නඩත්තු කටයුතු, වාහන සංචිත කළමනාකරණය සහ සුභසාධන ක්‍රියාකාරකම් ඇතුළුව කොමිෂන් සභාවේ පොදු පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව සහ වාර්ෂික වාර්තාව සකස් කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- කොමිෂන් සභාවේ සාමාන්‍ය කාර්යයන් සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය, භාණ්ඩාගාරය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධීකරණය කිරීම.

### කාර්ය සාධනය

#### පොදු පරිපාලනය

මානව සම්පත් කළමනාකරණය, යටිතල පහසුකම් කළමනාකරණය සහ කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා සැපයුම් ලබාදීම ඇතුළුව, කොමිෂන් සභාවේ පොදු පරිපාලන කටයුතු පරිපාලන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලදී.

අභ්‍යන්තර උසස්වීම් යෝජනා ක්‍රමය යටතේ උසස්වීම් 06ක් ලබාදී ඇති අතර, නව බඳවා ගැනීම් 24ක් ද සිදුකර ඇත. එසේම, රජයේ විශ්වවිද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතනවලින් සිසුන් 33 දෙනෙකු මාස 06ක පුහුණු කාලයක් සඳහා අභ්‍යාසලාභීන් ලෙස ඇතුළත් කර, ඔවුන්ට විදුලි සංදේශ ක්ෂේත්‍රයට පිවිසීමට අවස්ථා සලසා දී ඇත.

#### ආයතනික කටයුතු සහ කාර්ය මණ්ඩල කළමනාකරණය

කොමිෂන් සභාවේ මඟපෙන්වීම යටතේ, යෝජිත බඳවා ගැනීම් පටිපාටිය (SOR) සම්බන්ධ කටයුතු අංශය විසින් වසර පුරා අඛණ්ඩව සිදු කර ඇත. ඒ අනුව, අදාළ අංශ සඳහා යෝජිත සංවිධාන ව්‍යුහය සත්‍යාපනය කිරීම සඳහා සාකච්ඡා අඛණ්ඩව පවත්වා ඇත. සේවක බඳවා ගැනීම් පටිපාටියේ (SOR) සංශෝධන කටයුතු කඩිනම් කිරීම සඳහා 2024 වසර අවසානයේදී රැස්වීම් ද පවත්වා ඇති අතර, එය ඉදිරි වසර තුළ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග සාර්ථකව පවත්වන ලදී.

#### 2023 වාර්ෂික වාර්තාව

වාර්ෂික වාර්තාව යනු විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ද ඇතුළුව ආයතනයේ මෙහෙයුම් කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සපයමින් වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන අනිවාර්ය ප්‍රකාශනයකි. ඒ අනුව, කොමිෂන් සභාව විසින් 2023 වාර්ෂික වාර්තාව කෙටුම්පත් කිරීම සහ මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත සමඟ 2024.02.28 වන දින විගණකාධිපති කාර්යාලය සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇත. තවද, එම වාර්ෂික වාර්තාව 2024.12.19 වන දින ජාතික විගණන කාර්යාලය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය වෙතද ඉදිරිපත් කර ඇත.

#### 2025 -2027 ආයතනික සැලැස්ම සහ 2025 ක්‍රියාකාරී සැලැස්ම

ආයතනික සැලසුම් ක්‍රියාවලිය මඟින් සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින්, ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශක්තිමත් මාර්ගයක් ස්ථාපිත කෙරේ. ඵලදායී නියාමන පරිසරයක් වර්ධනය කිරීම අරමුණු කරගත් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු උපාය මාර්ගද මෙයට ඇතුළත් වේ. ඒ අනුව, 2025 සිට 2027 දක්වා කාලය සඳහා ආයතනික සැලැස්ම යාවත්කාලීන කර ඇත.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ අංශ ප්‍රධානීන් සමඟ පැවැත්වූ සාකච්ඡා මඟින් 2025 වසර සඳහා ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

#### 2024 ක්‍රියාකාරී සැලැස්මේ කාර්තුමය සමාලෝචනය

ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා කොමිෂන් සභාව වාර්ෂිකව ප්‍රගති සමාලෝචන රැස්වීම් හතරක් පැවැත්විය යුතුය. ඒ අනුව, 2024 වසර තුළ කාර්තුමය සමාලෝචන රැස්වීම් තුනක් සාර්ථකව පවත්වා ඇති අතර, සිව්වන කාර්තුමය රැස්වීම ඊළඟ වසරේ ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිතව තිබුණි. එසේම, ස්ථාපිත මාර්ගෝපදේශ අනුව කොමිෂන් සභාව ප්‍රගති වාර්තා රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ ජාතික විගණන කාර්යාලය වෙත නියමිත වේලාවට ඉදිරිපත් කර ඇත.

## නිල ලිපි හුවමාරුව

වර්ෂය තුළ ආයතනික ක්‍රියාකාරකම්වල ක්‍රියාත්මකභාවයට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය, කැබිනට් ලේකම් කාර්යාලය, භාණ්ඩාගාරය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අධිකාරීන් සමඟ සම්බන්ධ කටයුතු කොමිෂන් සභාව විසින් සම්බන්ධීකරණය කර මෙහෙයවන ලදී. එසේම, ජාතික විගණන කාර්යාලය, රේඛීය අමාත්‍යාංශය සහ පාර්ලිමේන්තු කාරක සභා සම්බන්ධ කටයුතු වලටද වසර පුරා සහභාගී විය.

## පුහුණුව

කොමිෂන් සභාව කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්ප වැඩිදියුණු කර ගනිමින් කාර්යාල පරිසරය තුළ ඒවා ක්‍රියාත්මක කිරීමට දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සපයා දී ඇත. රජයේ වියදම් පාලන ප්‍රතිපත්තිය හේතුවෙන් වර්ෂය තුළ දේශීය පුහුණු අවස්ථා සැලකිය යුතු ලෙස සීමා වී ඇත. ඒ අනුව, නිලධාරීන් 08 දෙනෙකු දේශීය පුහුණුව සඳහා සහභාගී වූ අතර, නිලධාරීන් 59 දෙනෙකු පූර්ණ අරමුදල් සහිත විදේශීය පුහුණු වැඩසටහන් සහ අනෙකුත් පුහුණු අවස්ථාවලට සහභාගී වී ඇත.

### 2024 වසරේ දී විදේශීය සහ දේශීය පුහුණු වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය

### විදේශ පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම

| අංකය | විදේශ වැඩසටහන | අරමුදල් වර්ගය | කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) තාක්ෂණයන් සහ සේවාවන් භාවිතයෙන් නවීන ඩිජිටල් ජාල සාක්ෂාත් කර ගැනීම සඳහා වන APT පුහුණු පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 10 | 01 |
| 02 | ඩිජිටල් පරිවර්තන යුගයේ සහ 5G හි ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය සහ අධීක්ෂණය පිළිබඳ APT පුහුණු පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 09 | 01 |
| 03 | රැහැන් රහිත සන්නිවේදන තාක්ෂණයේ ගුවන්විදුලි සංඛ්‍යාත කලාප සහ ප්‍රවණතා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා සැලසුම් කිරීම පිළිබඳ APT පුහුණු පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 04 | IIC හි වාර්ෂික විදුලි සංදේශ සහ මාධ්‍ය සංසදය | ශිෂ්‍යත්ව | දින 03 | 01 |
| 05 | ITU – T අධ්‍යයන කණ්ඩායම 17 | ශිෂ්‍යත්ව | දින 10 | 01 |
| 06 | APT රැහැන් රහිත සමූහයේ (AWG-32) 32 වන රැස්වීම | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 07 | ITU-T අධ්‍යයන කණ්ඩායම 13 | ශිෂ්‍යත්ව | දින 12 | 01 |
| 08 | ආසියා පැසිෆික් සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ සමුළුව | ශිෂ්‍යත්ව | දින 02 | 01 |
| 09 | සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ SATRC ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම | ශිෂ්‍යත්ව | දින 03 | 02 |
| 10 | ITU අධ්‍යයන කණ්ඩායමේ 16 වන රැස්වීම | ශිෂ්‍යත්ව | දින 12 | 01 |
| 11 | ලෝක විදුලි සංදේශ ප්‍රමිතිකරණ රැස්වීම WTSA-24 සඳහා APT සූදානම් කිරීමේ කණ්ඩායමේ 03 වන රැස්වීම (APT WTSA24-3) | ශිෂ්‍යත්ව | දින 03 | 01 |
| 12 | ප්‍රතිපත්ති, නියාමනය සහ සේවා පිළිබඳ SATRC ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම | ශිෂ්‍යත්ව | දින 03 | 02 |
| 13 | ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා සූදානම් වීම පිළිබඳ APT පුහුණු පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 04 | 01 |
| 14 | ITU - T අධ්‍යයන කණ්ඩායමේ රැස්වීම 11 | ශිෂ්‍යත්ව | දින 10 | 01 |
| 15 | 36 වන APT ප්‍රමිතිකරණ වැඩසටහන් සංසදය (ASTAP-36) | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 16 | ගෝලීය සයිබර් අභ්‍යාස 100x | ශිෂ්‍යත්ව | දින 03 | 01 |
| 17 | ඩිජිටල් සහ බුද්ධිමය කරුණු පිළිබඳ APAC සම්මේලනය 2024 | ශිෂ්‍යත්ව | දින 03 | 01 |
| 18 | APT NIPA පුහුණු වැඩසටහන ඩිජිටල් තාක්ෂණය | ශිෂ්‍යත්ව | දින 10 | 01 |
| 19 | සේද මාවත සහ මාර්ග වැඩසටහන යටතේ සිටින රටවල් සඳහා ග්‍රාමීය ප්‍රදේශවල සන්නිවේදන ජාල ඉදිකිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | ශිෂ්‍යත්ව | දින 14 | 01 |
| 20 | කලාප 03 සඳහා ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගු (NTFA) පිළිබඳ ITU වැඩමුළුව | ශිෂ්‍යත්ව | දින 04 | 01 |
| 21 | ඕස්ට්‍රේලියාව විසින් ශ්‍රී ලංකාවට ප්‍රදානය කරන "ඩිජිටල් යුගයේ පාලනය" පිළිබඳ කෙටි පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 12 | 03 |
| 22 | ITU -T අධ්‍යයන කණ්ඩායම 02 රැස්වීම | ශිෂ්‍යත්ව | දින 10 | 01 |
| 23 | ITU-T අධ්‍යයන කණ්ඩායම 20 හි රැස්වීම | ශිෂ්‍යත්ව | දින 12 | 01 |
| 24 | අල්ට්‍රා බ්‍රෝඩ්බෑන්ඩ් ජාල තාක්ෂණය සහ විසඳුම පිළිබඳ APT පුහුණු පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 25 | ස්විට්සර්ලන්තයේ ජිනීවා හි ITU-T අධ්‍යයන කණ්ඩායම 03 හි රැස්වීම | ශිෂ්‍යත්ව | දින 10 | 01 |

| අංකය | විදේශ වැඩසටහන | අරමුදල් වර්ගය | කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 26 | අනාගත ජාල යටිතල පහසුකම් සහ ඩිජිටල් පරිවර්තන සමාජයේ ක්‍රියාත්මක කිරීම පිළිබඳ APT පුහුණු පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 27 | ඩිජිටල් පරතරය සහ විසඳුම් පිළිබඳ APT පුහුණු පාඨමාලාව: ඩිජිටල් පරතරය පිළිබඳ ප්‍රතිපත්ති සහ සැලසුම්කරණය | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 28 | කෘත්‍රිම බුද්ධිය සහ සයිබර් ආරක්ෂාව යෙදීම පිළිබඳ APT පුහුණු පාඨමාලාව (සම්මුඛ) | ශිෂ්‍යත්ව | දින 10 | 01 |
| 29 | ඩිජිටල් රාජ්‍ය ප්‍රතිපත්ති කළමනාකරණ පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 30 | AI බලගැන්වූ 5G සහ 6G විදුලි සංදේශ පිළිබඳ APT පුහුණු පාඨමාලාව (සම්මුඛ) | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 31 | Huawei Connect 2024 හුවාවි කනෙක්ට් 2024 | ශිෂ්‍යත්ව | දින 03 | 06 |
| 32 | ගෝලීය සංවර්ධන මුලපිරීම යටතේ ඩිජිටල් ආර්ථික පාලනය පිළිබඳ සම්මන්ත්‍රණය | ශිෂ්‍යත්ව | දින 14 | 01 |
| 33 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමන කවුන්සිලයේ (SATRC) මෑත කාලීන ප්‍රවණතා සහ තාක්ෂණයන් පිළිබඳ වැඩමුළුව | ශිෂ්‍යත්ව | දින 03 | 02 |
| 34 | ආසියාව සහ පැසිෆික් කලාපය සඳහා ITU කලාපීය ගුවන්විදුලි සන්නිවේදන සම්මන්ත්‍රණය 2024 (RRS-24-ආසියාව සහ පැසිෆික්) | ශිෂ්‍යත්ව | දින 06 | 01 |
| 35 | චන්ද්‍රිකා සේවා, ජාතික නියාමන රාමු සහ හවුල්කාරිත්වය පිළිබඳ ITU ආසියා-පැසිෆික් කලාපීය වැඩමුළුව | ශිෂ්‍යත්ව | දින 02 | 01 |
| 36 | 5G සහ IoT ජාල යටිතල පහසුකම් ඔස්සේ කර්මාන්ත අංශ සඳහා සේවා සැපයීම පිළිබඳ රාජ්‍ය ගණනයකරණය සම්බන්ධ APT පුහුණු පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 05 | 03 |
| 37 | ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් පරතරය පියවීම සඳහා මූලික ජාල සැලසුම් කුසලතා වර්ධනය කිරීම පිළිබඳ APT පුහුණු පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 10 | 01 |
| 38 | කෘත්‍රිම බුද්ධියේ නවෝත්පාදනය, යෙදීම් සහ පාලන අභියෝග පිළිබඳ APT පුහුණු පාඨමාලාව | ශිෂ්‍යත්ව | දින 06 | 01 |
| 39 | ගෝලීය ප්‍රමිති සම්මන්ත්‍රණය සහ ලෝක විදුලි සංදේශ ප්‍රමිතිකරණ රැස්වීම | ශිෂ්‍යත්ව | දින 10 | 01 |
| 40 | ඉන්දු-පැසිෆික් කලාපයේ මුහුදු සංදාම කේබල් පද්ධතිවල අනාගතය පිළිබඳ වැඩමුළුව | ශිෂ්‍යත්ව | දින 01 | 01 |
| 41 | 5G අවබෝධ කර ගැනීම පිළිබඳ APT පුහුණු පාඨමාලාව: ජංගම තාක්ෂණයන්හි පරිණාමය | ශිෂ්‍යත්ව | දින 06 | 01 |
| 42 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමන කවුන්සිලයේ (SATRC-25) 25 වන රැස්වීම | ශිෂ්‍යත්ව | දින 03 | 01 |
| 43 | ඩිජිටල් පරිවර්තනය සඳහා නැගී එන තාක්ෂණයන් පිළිබඳ ITU පුහුණු පාඨමාලාව, චොංකිං, මහජන චීන සමූහාණ්ඩුව | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 44 | IIC හි ජාත්‍යන්තර නියාමකයින්ගේ සංසදය සහ වාර්ෂික සමුළුව | ශිෂ්‍යත්ව | දින 04 | 01 |
| 45 | ITU D අධ්‍යයන කණ්ඩායම 01 හි 03 වන රැස්වීම | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 46 | ASTAP සහ අදාළ ආයතනවල ප්‍රමිතිකරණ ක්‍රියාවලීන් සම්බන්ධයෙන් විශේෂඥයන් පුහුණු කිරීම සහ කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීම – නවීන තාක්ෂණ ප්‍රවණතා ප්‍රමිතිකරණය පිළිබඳ දැනුම හුවමාරු කිරීම (සම්මුඛ) | ශිෂ්‍යත්ව | දින 05 | 01 |
| 47 | ආසියාව සඳහා විශ්වීය හා අර්ථවත් සම්බන්ධතාවය (UMC) ප්‍රවර්ධනය කිරීම සහ මැනීම පිළිබඳ ITU උප කලාපීය වැඩමුළුව | ශිෂ්‍යත්ව | දින 03 | 01 |

*වගුව 15: විදේශ පුහුණු වැඩසටහන්*

### දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගීත්වය

| දේශීය වැඩසටහන | ආයතනය | කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ආදායම් බද්ද පිළිබඳ නවතම ප්‍රායෝගික යෙදුම් පාඨමාලාව | ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය | දින 14 | 01 |
| අවදානම් පදනම් වූ අභ්‍යන්තර විගණනය පිළිබඳ වැඩමුළුව | සීමාසහිත කුසලතා සංවර්ධන අරමුදල | දින 02 | 01 |
| තොරතුරු පද්ධති විගණනය පිළිබඳ දෙදින වැඩමුළුව | සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය | දින 02 | 01 |
| වරලත් ගණකාධිකාරීවරුන්ගේ 45 වන ජාතික සමුළුව | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | දින 03 | 03 |
| අභ්‍යන්තර පාලන පද්ධති සහ අභ්‍යන්තර විගණනය | නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය | දින 02 | 02 |

*වගුව 16: දේශීය පුහුණු වැඩසටහන්*

### ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්

කොමිෂන් සභාවට අවශ්‍ය විවිධ භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීම සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය විසින් සිදු කර ඇත. මෙයට ලංසු ලේඛන සකස් කිරීම, දැන්වීම් ප්‍රකාශයට පත් කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) පත් කිරීම ඇතුළත් වේ. එසේම, අවශ්‍ය අනුමැති ලබා ගැනීම සඳහා වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම, අදාළ පාර්ශවයන්ට තීරණ දැනුම් දීම, නීති අංශය සමඟ එක්ව සේවා ගිවිසුම් සකස් කිරීම, සේවා සැපයුම්කරුවන්ගේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සහ ගිවිසුම් කොන්දේසි වලින් බැහැරවීම් නිරීක්ෂණය වූ අවස්ථාවල නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

### වාහන සංචිතය නඩත්තු කිරීම

2024 වර්ෂයේදී වාහන සංචිතය මෝටර් රථ 11ක්, ඩබල් කැබ් රථ 2ක්, ජීප් රථ 4ක්, වෑන් රථ 5ක්, බස් රථයක් සහ යතුරුපැදි 2කින් සමන්විත විය. මෙම වාහන පරීක්ෂණ චාරිකා, කාර්ය මණ්ඩලයේ නිල රාජකාරි සහ සුභසාධන කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා භාවිතා කරන ලදී.

### වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය

2023 වර්ෂයට අදාළ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය 2024 ජනවාරි මාසයේදී පවත්වන ලදී. ඒ සඳහා සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කර තිබුණි. සමීක්ෂණය මඟින් බැහැර කළ යුතු අයිතම හඳුනාගෙන, සම්මත ක්‍රියාපටිපාටි අනුව ඒවා බැහැර කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. එසේම, 2023 වර්ෂයට අදාළ භාණ්ඩ වෙන්දේසිය 2024 මුල් භාගයේදී සාර්ථකව පවත්වන ලදී.

### සැපයුම් සහාය සේවා

පරිපාලන අංශය විසින් කොමිෂන් සභාවේ අනෙකුත් අංශවල ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සැපයුම් සහාය සපයා ඇත. එයට රැස්වීම්, වැඩමුළු, සම්මන්ත්‍රණ, පරීක්ෂණ චාරිකා සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වැනි කටයුතු සඳහා සහාය ලබා දීම ඇතුළත් වේ.

### ගෙවීම් නිර්දේශ කිරීම / අනුමත කිරීම

ප්‍රමාදයකින් තොරව ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. පාලන අංශයේ ප්‍රධාන කාර්යයක් ලෙස වැටුප් වර්ධක, අතිකාල, හිඟ වැටුප්, ගමන් හා යැපුම් දීමනා, විනය පරීක්ෂණ ගාස්තු, වාහන අලුත්වැඩියා, ආහාර මිලදී ගැනීම්, උපකරණ හා යන්ත්‍රෝපකරණ, පොත්පත්, වාර සඟරා මෙන්ම සේවා සැපයීම (ආරක්ෂක, සනීපාරක්ෂක, ජලය, දුරකථන, විදුලිය ආදී සේවා) සම්බන්ධ විවිධ ගෙවීම් අනුමත කිරීම සිදු කර ඇත. අංශය විසින් ගෙවීම් වවුචර් සවිස්තරාත්මකව පරීක්ෂා කර, ගෙවීම් ස්වභාවය සහ මූල්‍ය අධිකාරී සීමාවන් අනුව නිර්දේශ ඉදිරිපත් කිරීම හෝ අනුමැතිය ලබාදීම සිදු කර ඇත. ගෙවීම් ප්‍රමාදයකින් තොරව සිදු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ගද ගෙන ඇත.

### පුස්තකාලය

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නියැලී සිටින පිරිසට සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තම දැනුම යාවත්කාලීන කර ගැනීමට සහාය වීමේ අරමුණින් පුස්තකාලය ස්ථාපිත කර ඇත. එහි විදුලි සංදේශ ක්ෂේත්‍රය සම්බන්ධ පෙළපොත් සහ සඟරා විශාල එකතුවක් පවතී. පරිශීලකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පුස්තකාල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කරනු ලැබේ. එසේම, පුස්තකාලය කාර්ය මණ්ඩලයට මෙන්ම පර්යේෂකයන්, විශ්වවිද්‍යාල සිසුන් සහ පාසල් සිසුන් වැනි බාහිර පාර්ශ්වයන්ටද පුස්තකාල නිර්දිශ්ඨ සේවා පහසුකම් සපයයි.

### මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්

කොමිෂන් සභාව විසින් සංවිධානය කළ දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් සඳහා මාධ්‍ය ආවරණය ලබා දීම මාධ්‍ය ඒකකයේ වගකීමක් ලෙස ඉටු කර ඇත. එමෙන්ම, කොමිෂන් සභාවේ වැදගත් අවස්ථා සහ සිදුවීම් ඡායාරූපගත කිරීම සහ වීඩියෝ කිරීම, ඒවා සංස්කරණය කිරීම සහ ආරක්ෂිතව ගබඩා කිරීම සඳහා අති නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිතා කිරීමද එම ඒකකය විසින් සිදු කරයි.

## කොමිෂන් සභා ලේකම් කාර්යාලය

### *සමාලෝචනය*

*කොමිෂන් සභාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ කොමිසම පෙළගස්වන කේන්ද්‍රස්ථානය කොමිෂන් සභා ලේකම් කාර්යාලය වන අතර එහි ක්‍රියාකාරකම් ව්‍යවස්ථාපිත අනුකූලතාවයෙන් සහ ආයතනික ආයතන සඳහා යහපාලන මූලධර්මවලට අනුකූලව සිදු කරයි. කොමිෂන් සභාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ සම්බන්ධීකරණය කරමින්, ව්‍යවස්ථාපිත අනුකූලතාව සහ ආයතනික යහපාලන මූලධර්මයන්ට අනුකූලව සියලු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස කොමිෂන් සභා ලේකම් කාර්යාලය කටයුතු කරයි.*

### *කාර්යයන්*

- කොමිෂන් සභාවේ රැස්වීම් කැඳවීම
- රැස්වීම් ක්‍රියාවලිය කළමනාකරණය කිරීම, ගනු ලැබූ තීරණ සටහන් කිරීම සහ රැස්වීමෙන් අනතුරුව අවශ්‍ය පියවර ගැනීම.
- කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා විශේෂඥ මාර්ගෝපදේශ සහ උපායමාර්ගික සැලසුම් යෝජනා සැපයීම.
- පසු විපරම් ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම
- මුල් ලේඛන වාර්තා කළමනාකරණ කටයුතු සිදු කිරීම
- කොමිෂන් සභාවේ නව සාමාජිකයින් ක්‍රමවත් ලෙස පිළිගැනීම, අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබාදීම සහ ආයතනික ක්‍රියාවලියට සක්‍රියව සම්බන්ධ කිරීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීමට අදාළ සියලු කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- කොමිෂන් සභාවේ නිල මුද්‍රාව ලේඛන හා උපකරණ මත යෙදීම සහ එහි භාවිතය සම්බන්ධ මුද්‍රා ලේඛනය පවත්වාගෙන යාම.
- කොමිෂන් සභා තීරණ පසු විපරම් කටයුතු සිදු කිරීම.
- බාහිර රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් සම්බන්ධීකරණය කිරීම සහ ප්‍රතිචාර සැපයීම.

### *කාර්යසාධනය*

සමාලෝචන වර්ෂය තුළ කොමිෂන් සභා රැස්වීම් එකොළහක් (11) පවත්වා ඇත.

හදිසි අවශ්‍යතා මත තීරණ ගැනීමට අවශ්‍ය කරුණු 08ක් බෙදාහැරීම සිදු කර ඇත.

කොමිෂන් සභාව විසින් ආසන්න වශයෙන් කරුණු 200ක් සාකච්ඡා කර තීරණ ගනු ලැබූ අතර, ඒවාට සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය, තරඟකාරීත්ව නියාමනය, කර්මාන්ත ගැටළු විසඳීම සහ ආයතනයේ බඳවා ගැනීමේ ක්‍රියාවලීන්ට අදාළ ප්‍රධාන නියාමන මූලපිරීම් කිහිපයක් ඇතුළත් විය.

කොමිෂන් සභාවේ මුද්‍රාව බලපත්‍ර සංශෝධන ඇතුළුව නිල ලිඛිත ලේඛන සහ වාර්තාකරණ ලේඛන 17 කට යොදා ඇත.

ලේකම් කාර්යාලයේ නිත්‍ය කටයුතු අතර, පෙර ගනු ලැබූ තීරණ පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කරමින් සහ ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ලේඛන හා තොරතුරු සපයමින් අනෙකුත් අංශ සඳහා සහාය ලබා දීම සිදු කරන ලදී.

තවද, 2024 වර්ෂයේදී කොමිෂන් සභාවේ සංයුතියේ සිදුවූ ප්‍රධාන වෙනස්කම් දෙක සමඟ, කොමිෂන් සභා සාමාජිකයින්ගේ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සාර්ථකව නිම කර ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම සඳහා වූ පුළුල් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වගකීම වූ අතර, එය 2024 ජූලි මාසයේදී 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේ සම්මත වීමත් සමඟ සාර්ථකව නිම කරන ලදී. එය කොමිෂන් සභාවේ සහ විදුලි සංදේශ කර්මාන්තයේ සන්ධිස්ථානයක් කරා ළඟා වීම විශේෂ ජයග්‍රහණයක් විය.

## තරඟකාරිත්ව

### සමාලෝචනය

*තරඟකාරී අංශය, පාරිභෝගිකයින්, ක්‍රියාකරුවන් සහ අනෙකුත් කොටස්කරුවන්ගේ අවශ්‍යතා සපුරාලන කාර්යක්ෂම හා අංග සම්පූර්ණ විදුලි සංදේශ සේවාවක් ලබාදීම සඳහා නියාමන කටයුතු සිදු කරයි. රටේ සියලු පුරවැසියන්ට දැරිය හැකි සහ උසස් ගුණාත්මක සේවාවක් ලබා ගැනීම සහතික කිරීම සඳහා මෙම අංශය ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරයි. ඒ අනුව, අයක්‍රම හා අන්තර් සම්බන්ධතා නියාමනය කිරීම, ක්‍රියාකරුවන්ගේ කාර්යසාධනය විශ්ලේෂණය කිරීම, කර්මාන්ත තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සහ අදාළ පාර්ශ්වයන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම අංශයේ කාර්යයන් වේ. මෙහි අරමුණ වන්නේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සියලුම ක්‍රියාකරුවන් සඳහා සාධාරණ හා සමාන තරඟකාරී පරිසරයක් සහතික කිරීමයි.*

*2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මඟින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) තරඟකාරිත්ව අංශයේ භූමිකාව සෘජුවම ශක්තිමත් කරමින් සැලකිය යුතු නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දී ඇත.5(ඹ) සහ 6A වගන්ති ප්‍රකාරව, සාධාරණ හා විනිවිදභාවයෙන් යුතු මිලකරණය සහතික කරමින් අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර ගාස්තු ක්‍රම නිශ්චය කිරීම හෝ අනුමත කිරීමේ බලය කොමිෂන් සභාවට ලබා දී ඇත. එමෙන්ම 5(ඔ) සහ 20අ වගන්ති මඟින් ක්‍රියාකරුවන් අතර අන්තර් සම්බන්ධතාවය සහතික කිරීම සහ එකඟතාවකට පැමිණීමට නොහැකි අවස්ථාවලදී අන්තර් සම්බන්ධතා ගාස්තු නිශ්චය කිරීමේ බලය කොමිෂන් සභාවට පවරා ඇත. තවද, 5(පඅ), (පආ), (පඇ), (පඈ) සහ 9අ වගන්ති මඟින් විදුලි සංදේශ ක්ෂේත්‍රය තුළ සාධාරණ තරඟකාරීත්වයක් සහතික කිරීමෙන් තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රති තරඟකාරී පරිචයන් තුරන් කිරීම සඳහා කොමිෂන් සභාවේ නියාමන බලතල තවදුරටත් ශක්තිමත් කර ඇත.*

### කාර්යයන්

- බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ මූල්‍යමය හා මෙහෙයුම් කාර්යසාධනය විශ්ලේෂණය කිරීම මඟින් කර්මාන්තයේ ප්‍රවණතා නිරීක්ෂණය කිරීම.
- කර්මාන්තයට අදාළ සංඛ්‍යානමය තොරතුරු රැස් කර ඒවා විශ්ලේෂණය කිරීම.
- සාධාරණ තරඟකාරිත්වය සහ පාරිභෝගිකයින්ගේ යහපත සහතික කරමින් ගාස්තු ක්‍රම නියාමනය කිරීම.
- අනුකූලතා සහතිකය නිකුත් කිරීම සඳහා අන්තර් සම්බන්ධතා ගිවිසුම් සකස් කිරීම සහ ඒ ආශ්‍රිතව ඇතිවන ගැටළු සහ ආරවුල් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- කර්මාන්තයෙන් බදු/ අය බදු ගාස්තු (විදුලි සංදේශ බද්ද, සෙස් බද්ද, සෙලියුලර් කුලුණු බද්ද සහ කෙටි පණිවිඩ සේවා බද්ද සහ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද) එකතු කිරීම.
- බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකරුවන් මඟින් සේවා නොලැබෙන සහ අඩු සේවා සපයන ප්‍රදේශවල විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
- මූල්‍ය විමර්ශන සිදු කර බදු සහ අයකිරීම් ගෙවීම්වල නිවැරදිභාවය තහවුරු කිරීම.
- බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ විගණනය කරන ලද ගිණුම් රැස් කිරීම.
- පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ මූල්‍ය කාර්ය සාධනය හා කර්මාන්ත ආයෝජන පිළිබඳ විශ්ලේෂණය කිරීම.
- ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ආශ්‍රිත ව්‍යාපෘතිවල නියැලී සිටින විදේශීය විශේෂඥයින් සඳහා අදාළ වීසා ලබා ගැනීමට පහසුකම් සැලසීම.

### කාර්යසාධනය

කර්මාන්තයේ සියලු ක්‍රියාකරුවන්ට සමාන අවස්ථා ලබාදීම සහ තරඟකාරී විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා තරඟ නීති 2024 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී. කර්මාන්තයේ සියලු ක්‍රියාකරුවන්ට සමාන අවස්ථා ලබාදීම සහ ප්‍රති තරඟකාරී පරිචයන් වැළැක්වීම සඳහා තරඟකාරිත්ව රීති 2024 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම රීති යටතේ, අර්ථ දක්වා ඇති වෙළඳපොළ තුළ සුවිශේෂී වෙළඳපොළ බලය (SMP) හිමි ක්‍රියාකරුවන් හඳුනාගැනීම සඳහා ක්‍රියාවලියක් ආරම්භ කර ඇත.

#### 1. බදු සහ සෙස් බදු එකතු කිරීම

| වර්ගය | වර්ෂය | |
|---|---|---|
| | 2023 | 2024 |
| විදුලි සංදේශ බදු | 13,328 | 12,697 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු | 3,983 | 3,268 |
| ජංගම දුරකථන කුලුණු බදු | 1,652 | 1697 |
| කෙටි පණිවිඩ සේවා බදු | 286 | 612 |
| සෙස් බදු | 5,637 | 6,181 |

*වගුව 17: බදු සහ සෙස් බදු එකතු කිරීම*

තවද, තරඟකාරිත්ව අංශය විසින් මූල්‍ය විගණන සිදු කරමින්, කොමිෂන් සභාවට අයවිය යුතු බදු සහ ගාස්තු නිසි ලෙස සහ නිවැරදිව ගෙවනු ලබන බව තහවුරු කරයි.

#### 2. වීසා අයදුම්පත් නිර්දේශ කිරීම

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තාක්ෂණය ඉතා වේගයෙන් වෙනස් වන බැවින්, ක්‍රියාකරුවන් නව තාක්ෂණික ප්‍රවණතා අනුව ඔවුන්ගේ ජාල අඛණ්ඩව වැඩිදියුණු කිරීමට උත්සාහ කරති. අවශ්‍ය විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා, ඔවුන් විශේෂිත ව්‍යාපෘති සඳහා විදේශීය විශේෂඥයන් බඳවා ගනී. එවැනි විදේශීය වෘත්තිකයන් සඳහා වීසා ලබාගැනීමට අවශ්‍ය ලියකියවිලි සකස් කිරීමට කොමිෂන් සභාව විසින් පහසුකම් සපයනු ලබයි. 2024 වර්ෂය තුළ අංශය විසින් වෘත්තික වීසා අයදුම්පත් 27ක් සකස් කර ඇත.

#### 3. විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත සංඛ්‍යාලේඛන එකතු කිරීම

විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ දත්ත හා සංඛ්‍යාලේඛන එක්රැස් කර ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතනවලට මෙන්ම ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) වැනි ජාත්‍යන්තර සංවිධාන වෙත ද ඉදිරිපත් කරන ලදී. රැස්කරන ලද විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත සංඛ්‍යාලේඛන කාලානුරූපව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

## 4. අන්තර් සම්බන්ධතා කටයුතු මෙහෙයවීම

කර්මාන්ත පාර්ශවයන් සමඟ පැවති සාකච්ඡා සහ දීර්ඝ ක්‍රියාවලියකින් පසු, තරඟකාරිත්ව අංශය විසින් සංශෝධිත අන්තර් සම්බන්ධතා ගාස්තු කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, කොමිෂන් සභාව විසින් නව අන්තර් සම්බන්ධතා ගාස්තු අනුමත කළ අතර, ඒවා පහත පරිදි අදියර හතරකින් ක්‍රියාත්මක කරන ලදී.

| අයිතමය | පියවර 1 | පියවර 2 | පියවර 3 | පියවර 4 |
|---|---|---|---|---|
| මිනිත්තුවකට අයකරනු ලබන ඇමතුම් අවසන් කිරීමේ ගාස්තුව (ශත) | 20 | 15 | 10 | 0 |
| SMS/MMS අවසන් කිරීම සඳහා අයකරන ගාස්තුව (ශත) | 07 | 05 | 03 | 0 |
| බලාත්මක දිනයන් | 2022.04.15 | 2023.04.15 | 2024.04.15 | 2025.04.15 |

*වගුව 18:අන්තර් සම්බන්ධතා කටයුතු මෙහෙයවීම*

## 5. ගාස්තු ක්‍රම නියාමනය

කොමිෂන් සභාව විසින් විශේෂ උත්සව කාලසීමා ගාස්තු ක්‍රම, ප්‍රවර්ධන ගාස්තු ක්‍රම සහ ස්ථාවර ගාස්තු ක්‍රම යන කාණ්ඩ තුන යටතේ ගාස්තු ක්‍රම අනුමත කරනු ලබයි. මෙම වර්ෂය තුළ, උත්සව කාලසීමා ගාස්තු ක්‍රම 09ක්, ප්‍රවර්ධන ගාස්තු ක්‍රම 32ක් සහ ස්ථාවර ගාස්තු ක්‍රම 16ක් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

2024 වර්ෂයේදී, ක්‍රියාකරුවන් විසින් ග්‍රාහක අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් හඬ සේවා, කෙටි පණිවුඩ සහ දත්ත එකට ඒකාබද්ධ කළ සංයුක්ත ගාස්තු සැලසුම් පැකේජ හඳුන්වා දෙන ලදී. එසේම, වෙළඳපොලේ පවතින දැඩි තරඟකාරිත්වය හේතුවෙන්, පාරිභෝගිකයින්ට දැරිය හැකි මිල ගණන් යටතේ අසීමිත සේවා පැකේජ ද ලබා දෙන ලදී.

කොමිෂන් සභාව විසින් ගාස්තු ක්‍රම සැලසුම් විශේෂ උත්සව කාලසීමා ගාස්තු, ප්‍රවර්ධන ගාස්තු සහ ස්ථාවර ගාස්තු යන ප්‍රධාන කාණ්ඩ තුන යටතේ අනුමත කරනු ලැබේ. එමෙන්ම, වසර පුරා තරඟකාරීත්ව අංශය විසින් සකස් කර අනුමතිය සඳහා ඉදිරිපත් කළ තීරුබදු සැලසුම් සංඛ්‍යාව පහත පරිදි සඳහන් වේ:

| ක්‍රියාකරු | ගාස්තු වර්ගය | | |
|---|---|---|---|
| | විශේෂ කාලසීමා | ප්‍රවර්ධනාත්මක | ස්ථිර |
| එයාර්ටෙල් | 1 | 1 | - |
| ඩයලොග් ආසිආටා | - | 12 | 7 |
| හච් | - | 6 | - |
| මොබිටෙල් | 3 | 8 | 1 |
| ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් | 1 | 4 | 3 |
| ලංකා බෙල් | - | - | - |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | - | 6 | 5 |
| ආස්ක් කේබල් | - | - | - |
| ඩයලොග් ටීවී | 3 | 2 | 1 |
| ට්‍රයිමාස් මීඩියා | - | - | - |
| සිටි කේබල් | - | - | - |
| ස්ටාර්ලින්ක් | - | - | - |
| මුළු එකතුව | **8** | **40** | **18** |

*වගුව 19: ගාස්තු ක්‍රම නියාමනය*

**විශේෂ කාණ්ඩය යටතේ ගාස්තු ක්‍රම**

වසර තුළ විශේෂ කාණ්ඩයන්ට අදාළව පහත සඳහන් ගාස්තු ක්‍රම සැලසුම් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

| කාණ්ඩය | ගාස්තු ක්‍රම සංඛ්‍යාව |
|---|---|
| රජයේ නිලධාරීන් සඳහා ජංගම ගාස්තු ක්‍රම සැලසුම් | 03 |
| ජංගම දුරකථන අංක සත්‍යාපන (MNV) විශේෂාංගය සඳහා ගාස්තු ක්‍රම සැලැස්ම | 01 |

*වගුව 20: විශේෂ කාණ්ඩය යටතේ ගාස්තු ක්‍රම*

## මූල්‍ය

### *සමාලෝචනය*

*කොමිෂන් සභාවේ මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියේදී, ආදායම් එකතු කිරීම, අරමුදල් කළමනාකරණය සහ ආදායම් හා වියදම් නිවැරදිව සටහන් කර වාර්තා කිරීම ඇතුළු සියලුම මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. එසේම, මූල්‍ය පාලනය සහ ගෙවීම් සිදු කිරීම සමඟ අදාළ මූල්‍ය රෙගුලාසි, චක්‍රලේඛ සහ කොමිෂන් සභා තීරණ වලට දැඩි අනුකූලතාවය පවත්වා ගැනීමද අංශය විසින් තහවුරු කරනු ලබයි. සියලු ගනුදෙනු වල සත්‍යතාව සහ සම්පූර්ණභාවය සුරක්ෂිත කරමින්, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ අනිවාර්ය වගකීමක් වේ.*

### කාර්යයන්

අංශය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර ඇති ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- උපායමාර්ගික සහ මෙහෙයුම් සැලසුම්කරණයට සහාය වීම සඳහා වාර්ෂික අයවැය පුරෝකථන සකස් කිරීම.
- මූල්‍ය ගනුදෙනු වල විශ්වාසනීයභාවය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගැනීම.
- වගවීම සහ වත්කම් කළමනාකරණය සහතික කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම සහ, අදාළ පාර්ශ්වයන් වෙත නියමිත කාලසීමාවන් තුළ වාර්තා ඉදිරිපත් කිරීම.
- අදාළ බලධාරීන් සමඟ නිසි සම්බන්ධීකරණයෙන් බදු සැලසුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ නීතිමය හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ අනුකූලතාවය සහතික කිරීම.
- රජය සහ පාර්ලිමේන්තු පනත් යටතේ පනවා ඇති විවිධ බදු එකතු කිරීම සහ ඒවා ප්‍රේෂණය කිරීම අධීක්ෂණය කිරීම සහ පසු විපරම් කිරීම.
- අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා අනුව කොමිෂන් සභාවේ කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.
- ආදායම, වියදම්, වත්කම්, වගකීම් සහ කොටස් ප්‍රාග්ධනය පිළිබඳ සවිස්තරාත්මක සංඛ්‍යානමය වාර්තා පවත්වාගෙන යාම.

### කාර්යසාධනය

#### වාර්ෂික අයවැය / මූල්‍ය අධිකාරී බලය පැවරීම / මූල්‍ය ප්‍රකාශන

2025 වාර්ෂික අයවැය, 2025 මූල්‍ය අධිකාරිය පැවරීමේ ප්‍රකාශය සහ 2024 වසරේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයට අදාළ වාර්තා, කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.

### බදු ගෙවීම්

පසුගිය වසර පහක කාලය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සිදු කරන ලද බදු ගෙවීම් පහත පරිදි වේ.

| බදුකරණය | වසර | | | | |
|---|---|---|---|---|---|
| | 2020 (රු. මිලියන) | 2021 (රු. මිලියන) | 2022 (රු. මිලියන) | 2023 (රු. මිලියන) | 2024 (රු. මිලියන) |
| ආයතනික ආදායම් බදු | 1,784.94 | 1,907.76 | 1,223.18 | 670.13 | 1,376.22 |
| එකතු කළ අගය මත බදු | 864.73 | 1,238.94 | 1,650.37 | 3,906.69 | 3,458.91 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | - | - | 61.17 | 661.68 | 616.93 |
| මුද්දර බදු | 2.66 | 3.66 | 3.43 | 4.56 | 4.87 |
| උපයන විට ගෙවීමේ බදු / අත්තිකාරම් පුද්ගල ආදායම් බදු | 1.75 | 1.64 | 5.65 | 21.99 | 26.69 |
| අධිභාර බදු | - | - | 1,593.71 | - | - |
| **මුළු එකතුව** | 2,654.08 | 3,152.00 | 4,537.50 | 5,265.05 | 5,483.62 |

*වගුව 21: බදු ගෙවීම්*

### මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම් ස්වයංක්‍රීයකරණය කිරීම

රජයේ ආයතන සඳහා පහසු සහ ආරක්ෂිත මාර්ගගත ගෙවීම් පහසුකම් ලබා දීමේ අරමුණින් රජය විසින් GovPay මාර්ගගත ගෙවීම් වේදිකාව හඳුන්වා දී ඇති අතර, මෙම වැඩසටහන සඳහා නියමු ආයතනයක් ලෙස කොමිෂන් සභාව තෝරා ගෙන ඇත.

ඊට සමගාමීව පුළුල් මූල්‍ය ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලියක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එය සාර්ථකව අවසන් වූ පසු කොමිෂන් සභාව විසින් විශේෂිත ගෙවීම් ද්වාර පද්ධතියක් ඒකාබද්ධ කිරීමට සැලසුම් කර ඇත. එමඟින් කාර්යක්ෂමතාව වැඩිදියුණු වන අතර ගනුදෙනුකරුවන්ට වඩාත් පහසු හා පරිශීලක-හිතකාමී ගෙවීම් අත්දැකීමක් ලබා දෙනු ඇත.


### ආදායම

කොමිෂන් සභාව පොදු ස්විචීකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකරුවන් සහ ගුවන්විදුලි සංඛ්‍යාත පරිහරණය කරන්නන්ගෙන් ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු, සෙස් ගාස්තු, පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු, වෙළඳ බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් අදාළ ගාස්තු මගින් ආදායම් උපයා ගනී. පසුගිය වසර පහ තුළ කොමිෂන් සභාවේ ආදායම පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2020 (රු. '000) | 2021 (රු. '000) | 2022 (රු. '000) | 2023 (රු. '000) | 2024 (රු. '000) |
|---|---|---|---|---|---|
| පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 5,402 | - | - | 5,011,857 | 55,100 |
| සෙස් ගාස්තු | 4,674,874 | 5,164,189 | 5,514,298 | 5,637,770 | 6,111,180 |
| ගුවන්විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු | 6,724,408 | 7,374,468 | 5,430,252 | 8,329,845 | 6,221,328 |
| ගුවන්විදුලි සංඛ්‍යාත පූර්ව ගාස්තු | - | 3,324,250 | 3,278,900 | 6,106,230 | 4,124,550 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 14,393 | 14,226 | 14,198 | 15,793 | 20,354 |
| ආධුනික ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු | 88 | 100 | 71 | 86 | 73 |
| රැහැන් රහිත දුරකථන වෙළඳ ගාස්තු | 94,408 | 193,970 | 63,251 | 71,589 | 58,987 |
| විභාග ගාස්තු | 203 | 388 | 371 | 360 | 499 |
| මාදිලි අනුමැති ගාස්තු | 102 | 38,970 | 23,278 | 23,407 | 31,909 |
| අයදුම්පත් ක්‍රියාවලි ගාස්තු | 400 | 1,000 | 1,400 | 2,320 | 1,560 |
| කෙටි කේත අංක ගාස්තු | 34,250 | 45,750 | 39,750 | 55,200 | 60,300 |
| අන්තර්ජාල සේවා සැපයුම්කරු බලපත්‍ර ගාස්තු | - | 133,473 | 2,252,509 | - | - |
| ලේබල් ගාස්තුව | - | - | 2,539 | 44,189 | 73,604 |
| අනෙකුත් ආදායම් (ස්ථාවර තැන්පතු, සේවක ණය ආදියෙන් ලැබෙන පොලී ආදායම) | 488,995 | 871,819 | 2,280,096 | 3,759,145 | 1,675 |
| **මුළු එකතුව** | **12,037,523** | **17,162,602** | **18,900,918** | **29,057,796** | **18,434,396** |

### විදුලි සංදේශ බදු

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ විධිවිධාන යටතේ විදුලි සංදේශ බදු අය කරනු ලබයි. එසේම, 2022.06.04 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම බදු අනුපාතය 11.25% සිට 15% දක්වා වැඩි කිරීමට රජය තීරණය කර ඇත.





*ප්‍රස්ථාර 2: විදුලි සංදේශ බදු*

### විදුලි සංදේශ සංවර්ධන ගාස්තු

2009 අංක 13 දරන මුදල් පනත මගින් සංශෝධනය කරන ලද 2004 අංක 11 දරන මුදල් පනතට අනුව, කොමිෂන් සභාව ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුගේ බද්ද ක්‍රියාකරුවන්ගෙන් අය කරයි.


ඒ අනුව, කොමිෂන් සභාව විසින් ලැබෙන දේශීය ප්‍රවේශ ගාස්තු (ILAC) ලෙස මිනිත්තුවකට ඇමරිකානු ඩොලර් 0.06ක් අය කරන ලද අතර, එම ආදායමෙන් 50%ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඉතිරි 50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) සඳහා වෙන් කර රඳවා ගනු ලැබිය.




*ප්‍රස්ථාර 3: විදුලි සංදේශ සංවර්ධන ගාස්තු*

### ජංගම දුරකථන කුලුණු බදු


මෙම බද්ද 2019 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නව බද්දක් ලෙස හඳුන්වා දෙන ලද අතර, එය කොමිෂන් සභාව විසින් කාර්තුමය පදනම මත එකතු කර ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.




*ප්‍රස්ථාර 4: ජංගම දුරකථන කුලුණු බදු*


### කෙටි පණිවුඩ සේවා බදු

මෙම බද්ද 2019 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දෙන ලද අතර, තොග කෙටි පණිවුඩ සඳහා එක් කෙටි පණිවුඩයකට රු. 0.25 ක අනුපාතයකින් අය කෙරේ. තවද, 2023.12.13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2018 අංක 35 දරන මුදල් පනතේ 48 වන වගන්තිය ප්‍රකාරව ස්ථාවර දුරකථන මාර්ග ඔස්සේ යවන ලද තොග වෙළඳ දැන්වීම් සඳහා ද ගාස්තුවක් අය කරනු ලබයි.





*ප්‍රස්ථාර 5: කෙටි පණිවුඩ සේවා බදු*

### මුළු ආදායම් රැස්කිරීම




*ප්‍රස්ථාර 6: මුළු ආදායම් රැස්කිරීම*




*ප්‍රස්ථාර 7: මුළු ආදායම*

### ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණය කිරීම

2024 වසරේදී, රාජ්‍ය ආදායම ශක්තිමත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රුපියල් බිලියන 25.35ක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද අතර, එහි විස්තර පහත පරිදි වේ.

| විස්තරය | 2020<br>රු. බිලි | 2021<br>රු. බිලි | 2022<br>රු. බිලි | 2023<br>රු. බිලි | 2024<br>රු. බිලි |
|---|---|---|---|---|---|
| විදුලි සංදේශ පනත / විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා අරමුදල් | 5.0 | 8.5 | 13.2 | 25.0 | 7.0 |
| විදුලි සංදේශ බදු | 10.82 | 11.05 | 12.9 | 13.25 | 12.95 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු 50% | 2.15 | 1.81 | 2.41 | 3.86 | 1.63 |
| පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත අය කරන බදු | - | - | - | - | - |
| කෙටි පණිවුඩ සේවා මත අය කෙරෙන බදු | 0.42 | 0.40 | 0.23 | 0.28 | 0.61 |
| කුලුණු බදු | 1.42 | 1.47 | 1.56 | 1.62 | 1.69 |
| **මුළු එකතුව** | **19.81** | **23.23** | **30.30** | **44.05** | **25.35** |

*වගුව 22: ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණය*

## අභ්‍යන්තර විගණනය

### සමාලෝචනය

*අභ්‍යන්තර විගණනය යනු ආයතනයේ උපායමාර්ග, අරමුණු සහ අවදානම් සැලකිල්ලට ගනිමින් එයට හා එහි පාර්ශවකරුවන්ට අගය එකතු කිරීම සඳහා ක්‍රියාත්මක වන ස්වාධීන හා වෛෂයික ක්‍රියාවලියකි. මෙය පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා වැඩිදියුණු කිරීමේ යෝජනා ඉදිරිපත් කරමින්, ව්‍යාපාර ක්‍රියාවලීන් හා දත්ත විශ්ලේෂණය මත පදනම්ව නිර්දේශ සහ අවබෝධය ලබාදේ. එමඟින් ආයතනයේ කාර්යක්ෂමතාව, විශ්වසනීයත්වය සහ අනුකූලතාව ඉහළ නැංවීමට දායක වේ. අභ්‍යන්තර විගණනයේ විෂය පථය මෙහෙයුම් කාර්යක්ෂමතාව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය, වංචා වැළැක්වීම හා විමර්ශනය, වත්කම් ආරක්ෂා කිරීම සහ නීති-රීති වලට අනුකූලතාව වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කරයි.*

*අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා සෘජුවම කොමිෂන් සභාවට වාර්තා කරන අතර, වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි. පරිපාලනමය වශයෙන් ඔහු අධ්‍යක්ෂ ජනරාල්වරයාට යටත් වේ.*

### කාර්යයන්


- වාර්ෂික විගණන සැලැස්ම සකස් කර එය කොමිෂන් සභාවට සහ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.
- විගණන කමිටු රැස්වීම් කැඳවා අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීම සහ විගණකාධිපතිවරයා විසින් මතු කරන ලද විගණන විමසුම් සලකා බලා ඒවාට පිළිතුරු සැපයීම සිදු කිරීම.
- ආයතනයේ ආදායම් එකතු කිරීම, ණය, ගෙවීම් සහ වියදම් ක්‍රියාවලීන් සම්බන්ධව අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදු කිරීම.
- මහා භාණ්ඩාගාර තැන්පතු, රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාර අරමුදල, බැංකු ස්ථාවර තැන්පතු සහ ඒකාබද්ධ අරමුදලට දායක මුදල් වැනි අරමුදල් භාවිතය විගණනය කිරීම.


### කාර්යසාධනය


2024 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.


| අංකය | විස්තර | සම්පූර්ණයි/ක්‍රියාත්මක වෙමින් පවතී/වෙනත් |
|---|---|---|
| 1 | ශ්‍රී.ල.වි.ස.නි.කො. සභා රිසිට්පත් (මුදල්, චෙක්පත් සහ මුදල් ඇණවුම්) | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 2 | ශ්‍රී.ල.වි.ස.නි.කො. සභා ගෙවීම් (වැටුප් සහ අදාළ ගෙවීම්, ණය සහ සේවක අත්තිකාරම් හැර) | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 3 | 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 22 වන වගන්තිය යටතේ නව බලපත්‍ර නිකුත් කිරීම සහ බලපත්‍ර අලුත් කිරීම. | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 4 | 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම. | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 5 | විදුලි සංදේශ පද්ධති ක්‍රියාකරුවන්ගෙන් ලැබෙන ආදායම (1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය.) | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 6 | විවිධ ආදායම් | සම්පූර්ණ කරන ලදී |
| 7 | ධාවන සටහන් පවත්වාගෙන යාම | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 8 | වැටුප් හා වේතන ගෙවීම | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 9 | ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ අත්තිකාරම් ප්‍රදානය කිරීමේ සහ පියවීමේ ක්‍රියාවලිය | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 10 | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම. | වාර්තාව ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 11 | ශ්‍රී.ල.වි.ස.නි.කො. සභා ප්‍රසම්පාදනය | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 12 | බැංකු සැසඳුම් සත්‍යාපනය කිරීම | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 13 | සංඛ්‍යාත මත ණයගැති ශේෂයන් | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 14 | ආපදා ණය ප්‍රදානය කිරීමේ සහ අයකර ගැනීමේ ක්‍රියාවලිය | සම්පූර්ණ කර වාර්තාව ඉදිරිපත් කරන ලදී |
| 15 | සියලුම විගණන විමසුම් සහ පිළිතුරු සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කිරීම:<br>විගණන වාර්තා - 03<br>විගණන විමසුම් - 33<br>තොරතුරු සඳහා ඉල්ලීම - 13 | සම්පූර්ණ කරන ලදී |
| 16 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම | සම්පූර්ණ කරන ලදී |


# අපගේ සේවක පැතිකඩ



සේවා කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින්
සේවකයන් ගණන
80
60
40
20
0
34
19
23
14
42
65
40
2
ජ්‍යෙෂ්ඨ
තෘතියික
ද්විතියික
ප්‍රාථමික
පුරුෂ
ස්ත්‍රී


සේවක විශ්‍රාම විශ්ලේෂණය
සේවකයන් ගණන
10
8
6
4
2
0
8
3
2
4
3
3
4
6
2025
2026
2027
2028
පුරුෂ
ස්ත්‍රී


වයස් කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින්
60
50
40
30
20
10
0
0
0
27
15
36
22
51
40
25
23
අවුරුදු 18 - 24
අවුරුදු 25 - 34
අවුරුදු 35 - 44
අවුරුදු 45 - 54
අවුරුදු 55ට වැඩි
පුරුෂ
ස්ත්‍රී


රැකියා ස්ථානය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින්
180
150
120
90
60
30
0
138
98
1
0
2
0
ප්‍රධාන කාර්යාලය
කදිරාන
කොකාවිල්
පුරුෂ
ස්ත්‍රී


විදේශ නිවාඩු මත සේවකයින්
4.5
4
3.5
3
2.5
2
1.5
1
0.5
0
4
1
2024
පුරුෂ
ස්ත්‍රී


ධුර කාලය විශ්ලේෂණය
50
40
30
20
10
0
43
17
20
19
18
7
26
31
9
4
16
18
8
3
අවුරුදු 05ට අඩු
අවුරුදු 06 - 10
අවුරුදු 11 - 15
අවුරුදු 16 - 20
අවුරුදු 21 - 25
අවුරුදු 26 - 30
අවුරුදු 30ට වැඩි
පුරුෂ
ස්ත්‍රී

## විගණන කමිටු යාවත්කාලීන කිරීම්

2024 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර, මෙම රැස්වීමේදී පහත කරුණු සාකච්ඡා කරන ලදී.

1. 2024 මාර්තු 20 වන දින පැවති විගණන කමිටු රැස්වීම.

1.1 පහත සඳහන් වාර්තා/කරුණු සාකච්ඡා කරන ලද අතර, පහත පරිදි තීරණ / ක්‍රියාමාර්ග ගන්නා ලදී:

| විෂය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග / තීරණ |
|---|---|
| කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය | 2017 වසරේ කෝප් වාර්තාව සහ ශ්‍රී. ල.වි.ස.නි. කො.සභාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම. |
| වාහන ණය පරීක්ෂා කිරීම | වාහන ණය චක්‍රලේඛ කෙටුම්පත කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. |
| විදුලි සංදේශ කුලුනු පිළිබඳ දීප ව්‍යාප්ත භෞතික සත්‍යාපනය සඳහා විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම | • යෝජිත ක්‍රියාකාරී සැලැස්මට අනුව විදුලි සංදේශ කුලුනු වල දීප ව්‍යාප්ත භෞතික සත්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම.<br>• අනුමත කුලුනු ගණන, ප්‍රදානය කර ඇති සංඛ්‍යාත බලපත්‍ර සහ අදාළ අංශ විසින් අය කරනු ලබන කුලුනු බද්ද අතර සැසඳුම අවසන් කිරීම. |
| මොරටුව විශ්වවිද්‍යාලයේ උපදේශන සේවා පිළිබඳව විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම | කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. |
| වාර්ෂික වාර්තාව, ප්‍රසම්පාදන සැලැස්ම සහ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම. |
| විකාශන මධ්‍යස්ථාන බලපත්‍රය (රූපවාහිනී TV) සහ විකාශන මධ්‍යස්ථාන බලපත්‍රය (ගුවන් විදුලි FM) පිළිබඳ අභ්‍යන්තර විගණනය | විකාශන මධ්‍යස්ථාන බලපත්‍රලාභීන් 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ විධිවිධානවලට අනුකූල වන බව සහතික කිරීම. |
| දේපල, පිරියත, උපකරණ පිළිබඳ අභ්‍යන්තර විගණනය | • දේපළ, පිරියත සහ උපකරණ කාලෝචිත ලෙස ප්‍රති තක්සේරු කිරීම සහ ගිණුම් පොත්වල වාර්තා යාවත්කාලීන කිරීම.<br>• පවතින වෙළඳපල වටිනාකම් ඇති වත්කම් රක්ෂණය කිරීම.<br>• බදු දී ඇති ඉඩම සඳහා ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය යොදා ගැනීම. |

2. 2024 ජුනි 20 වන දින පැවති විගණන කමිටු රැස්වීම

2.1 පහත සඳහන් වාර්තා/කරුණු සාකච්ඡා කරන ලද අතර, පහත පරිදි තීරණ / ක්‍රියාමාර්ග ගන්නා ලදී:

| විෂය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග / තීරණ |
|---|---|
| කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය. | 2017 වසරේ කෝප් වාර්තාවේ වත්මන් තත්ත්වය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත දැනුම් දීම. |
| වාහන ණය පරීක්ෂා කිරීම | වාහන ණය චක්‍රලේඛ කෙටුම්පත ඊළඟ කමිටුවට ඉදිරිපත් කිරීම. |
| විදුලි සංදේශ කුළුණු පිළිබඳ දීප ව්‍යාප්ත භෞතික සත්‍යාපනය සඳහා විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම | • දීප ව්‍යාප්ත විදුලි සංදේශ කුලුනු භෞතික සත්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම.<br>• අනුමත කුලුනු ගණන, ලබා දී ඇති සංඛ්‍යාත බලපත්‍ර සහ අය කරනු ලබන කුලුනු බදු සැසඳුම අවසන් කිරීම. |
| මොරටුව විශ්වවිද්‍යාලයේ උපදේශන සේවා පිළිබඳව විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම | අනුමැතිය සඳහා කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කර ඉදිරිපත් කිරීම. |
| වාර්ෂික වාර්තාව, ප්‍රසම්පාදන සැලැස්ම සහ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම. |
| විකාශන මධ්‍යස්ථාන බලපත්‍රය (රූපවාහිනී TV) සහ විකාශන මධ්‍යස්ථාන බලපත්‍රය (ගුවන් විදුලි FM) පිළිබඳ අභ්‍යන්තර විගණනය | විකාශන මධ්‍යස්ථාන බලපත්‍රලාභීන් 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ විධිවිධානවලට අනුකූල වන බව සහතික කිරීම. |
| ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ ප්‍රසම්පාදනය පිළිබඳ විගණනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (GPG) හි නියමයන් පිළිපැදීම. |
| ලැබිය යුතු විදුලි සංදේශ බදු සහ ගෙවීම් - 2023/2024 | විදුලි සංදේශ බදු අඩුවෙන් ගෙවීම සම්බන්ධයෙන් කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම. |
| ගෙවීම් (සේවක වැටුප් සහ අදාළ ගෙවීම්, ණය සහ අත්තිකාරම් හැර) | ගෙවීම් මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව සිදු කරන බව සහතික කිරීම. |
| විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම - හිඟ ණයගැතියන් | විගණන කමිටු නිර්දේශ සහිත කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම. |

3. 2024 සැප්තැම්බර් 05 වන දින පැවති විගණන කමිටු රැස්වීම

3.1 පහත සඳහන් වාර්තා/කරුණු සාකච්ඡා කරන ලද අතර, පහත පරිදි තීරණ / ක්‍රියාමාර්ග ගන්නා ලදී:

| විෂය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග / තීරණ |
|---|---|
| කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ලිපියක් මගින් දැනුම් දීම. |
| වාහන ණය පරීක්ෂා කිරීම | කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා කෙටුම්පත් වාහන ණය චක්‍රලේඛය ඉදිරිපත් කිරීම. |
| විගණකාධිපතිවරයාගෙන් ලැබුණු විගණන විමසුම | • දීප ව්‍යාප්ත විදුලි සංදේශ කුලුනු භෞතික සත්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම.<br>• අනුමත කුලුනු ගණන, ලබා දී ඇති සංඛ්‍යාත බලපත්‍ර සහ අය කරනු ලබන කුලුනු බදු සැසඳුම අවසන් කිරීම. |
| මොරටුව විශ්ව විද්‍යාලයේ උපදේශන සේවා සම්බන්ධයෙන් විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම | අනුමැතිය සඳහා කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කර ඉදිරිපත් කිරීම. |
| විදුලි සංදේශ බදු ලැබීම් සහ ගෙවීම් – 2023/2024 | ගෙවිය යුතු මුදල ගෙවීමට අපොහොසත් වුවහොත්, 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව පියවර ගැනීම. |
| හිඟ ණයගැතියන් සම්බන්ධයෙන් විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම | විගණන කමිටු නිර්දේශ ඇතුළත් කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම. |
| බැංකු සැසඳුම් පිළිබඳ අභ්‍යන්තර විගණනය | • දිගු කලක් තිස්සේ පැවති හිඟ ශේෂයන් කපා හැරීම.<br>• හඳුනා නොගත් තැන්පතු සැසඳුම පසු විපරම් කිරීම. |
| ධාවන සටහන් නඩත්තු කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණනය | • අතිකාල ගෙවීම් නිර්දේශ කිරීමට පෙර ධාවන සටහනේ සම්පූර්ණභාවය පරීක්ෂා කිරීම. |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මානව සම්පත් පද්ධතිය පිළිබඳ අභ්‍යන්තර විගණනය | • e-HR පද්ධතිය තුළ ඉතිරි මොඩියුල ක්‍රියාත්මක කිරීම සහ සක්‍රිය කිරීම සඳහා ප්‍රමුඛතාවය දීම.<br>• සියලුම පද්ධති වෙනස්කම් සහ පරිශීලක ක්‍රියාවන් පිළිබඳ සවිස්තරාත්මක, කාලානුක්‍රමික වාර්තාවක් සපයනු ලබන, විනිවිදභාවය සහ වගවීම සහතික කරනු ලබන ශක්තිමත් විගණන ලක්ෂණ සහිතව, e-HR පද්ධතිය යාවත්කාලීන කිරීම. |
| වැටුප් ගෙවීම පිළිබඳ අභ්‍යන්තර විගණනය | දිගු කාලීන හිඟ ශේෂ කපා හැරීම. |

4. 2024 දෙසැම්බර් 18 වන දින පැවති විගණන කමිටු රැස්වීම.


4.1 පහත සඳහන් වාර්තා/කරුණු සාකච්ඡා කරන ලද අතර, පහත පරිදි තීරණ / ක්‍රියාමාර්ග ගන්නා ලදී:

| විෂය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග / තීරණ |
|---|---|
| කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ (CLTP) තාක්ෂණික විගණනය | • කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ තාක්ෂණික විගණනය සඳහා විෂයය පථය ලබා ගැනීම.<br>• ඉහළ පෙළේ කමිටුවක් පිහිටුවීම.<br>• කළමනාකරණ සමාගම සමඟ සාකච්ඡා කිරීම කඩිනම් කිරීම. |
| වාහන ණය පරීක්ෂා කිරීම | මතුවන සියලු කරුණු අන්තර්ගත කර, කෙටුම්පත් වාහන ණය චක්‍රලේඛය ඉදිරිපත් කිරීම. |
| විගණකාධිපතිවරයාගෙන් ලැබුණු විගණන විමසුම | දීප ව්‍යාප්ත විදුලි සංදේශ කුලුනු භෞතික සත්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම. |
| මොරටුව විශ්ව විද්‍යාලයේ උපදේශන සේවා පිළිබඳව විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම | අනුමැතිය සඳහා කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කර ඉදිරිපත් කිරීම. |
| විදුලි සංදේශ බදු ලැබීම් සහ ගෙවීම් – 2023/2024 | ගෙවිය යුතු මුදල ගෙවීමට අපොහොසත් වන්නේ නම්, 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව පියවර ගැනීම. |
| හිඟ ණයගැතියන් පිළිබඳ විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම | ශේෂ කපා හැරීම සඳහා කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම. |
| කොකාවිල් බහුකාර්ය සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයේ කල්බදු සහ විදුලි ගෙවීම් | සම්පූර්ණ හා සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීම. |
| බැංකු සැසඳුම් පිළිබඳ විගණනය | • දීර්ඝ කාලීන හිඟ ශේෂයන් කපා හැරීම.<br>• හඳුනා නොගත් තැන්පතු සැසඳුම් පසු විපරම් කිරීම. |
| වැටුප් ගෙවීම පිළිබඳ විගණනය | • දිගු කාලීන හිඟ උපයන විට ගෙවීම් ශේෂ කපා හැරීම. |
| ආයතනික සැලැස්ම, වාර්ෂික වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය, ප්‍රසම්පාදන සැලැස්ම සහ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය | • 2023 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.<br>• 2025 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ 2024 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම. |
| 2025 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම | • ව්‍යවස්ථාපිත බැඳීම්වලට අනුකූල වීම සහ නියමිත වේලාවට ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම. |

# ආයතනික පාලන වාර්තාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යනු විශිෂ්ට ආයතනික පාලනය වැදගත් ආයතනික අවශ්‍යතාවයක් ලෙස පිළිගනු ලබන ව්‍යවස්ථාපිත ආයතනයකි. කොමිෂන් සභාව සිය මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍ර තුළ, සියලුම ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කිරීමට කැපවී සිටී. විනිවිදභාවය, විශ්වසනීයත්වය සහ අනුකූලතාවය යනු කොමිෂන් සභාව විසින් සිය අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා මෙහෙයවීම පිණිස භාවිත කරන මාර්ගෝපදේශක මූලධර්ම වේ.

### ආයතනික පාලන රාමුව




### කොමිෂන් සභාව

ඉහළම පාලන ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව දැඩි ලෙස කැපවී සිටින අතර, ශක්තිමත් ආයතනික පාලන ක්‍රියාමාර්ග, ප්‍රවර්ධිත විදුලි සංදේශ ක්ෂේත්‍රයක පදනම බව තරයේ විශ්වාස කරයි. මෙම ක්‍රියාමාර්ග තුළින් රෙගුලාසි වල වටිනාකම වැඩි දියුණු කරනවා පමණක් නොව, පාරිභෝගිකයින්ගේ සහ පාර්ශවකරුවන්ගේ වැදගත් අවශ්‍යතා ආරක්ෂා කිරීම ද සහතික කරයි. මෙම වැදගත් අරමුණ ඉටු කර ගැනීම සඳහා, කොමිෂන් සභාව දැඩි පාලන මූලධර්ම මාලාවක් ඉතා උනන්දුවෙන් සකස් කර ඇත. කාර්යක්ෂම පාලන ක්‍රියා පටිපාටිවල සිට ස්ථාවර විනිවිදභාවය සහ ශක්තිමත් වගවීම දක්වා කොමිෂන් සභාවේ සෑම අංශයකම කාර්යයන්වල විශිෂ්ටත්වයට මෙම මූලධර්ම ප්‍රමුඛත්වය දෙයි. එපමණක් නොව, අදාළ වන සියලුම නීති සහ රෙගුලාසි තරයේ පිළිපැදීම ඉතා වැදගත් වන අතර, එය සදාචාරාත්මක සහ වගකිවයුතු පාලනය සඳහා කොමිෂන් සභාවේ කැපවීම ශක්තිමත් කරයි.

- 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත
- 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත
- 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත
- කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද රෙගුලාසි
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත් කිරීම් කාණ්ඩය සහ විනය කාණ්ඩය
- ආයතන සංග්‍රහය
- මුදල් රෙගුලාසි
- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ
- ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන්
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
- අදාළ රජයේ චක්‍රලේඛ

### කොමිෂන් සභා පත්වීම

රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර, නායකත්වය සහ රජයේ ඉදිරි දර්ශනය පිළිබඳ ගැඹුරු අවබෝධයකින් යුතුවේ. අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනෙකුත් ගෞරවනීය සාමාජිකයන් තිදෙනා පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභාවේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම, කොමිෂන් සභාවේ බලතල සහ රාජකාරි ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම දරයි. ඔහු උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලය සහ කොමිෂන් සභාව යන දෙකම දිගුකාලීන දැක්ම සහ මෙහෙවර කරා මෙහෙයවමින් ප්‍රධාන නිලධාරියා ලෙස සේවය කරයි.

නීතිය, මූල්‍ය සහ කළමනාකරණ ක්ෂේත්‍ර නියෝජනය කරමින් සාමාජිකයින් තිදෙනෙකු පත් කරනු ලැබේ. කොමිෂන් සභා සාමාජිකයින් සතුව ආයතනය ඉහළම මට්ටමේ යහපාලනයක් කරා මෙහෙයවීමට සහ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ අත්දැකීම් ඇත. ඔවුන් දැක්ම, නායකත්ව කුසලතා, නිපුණතාවය සහිත ගෞරවනීය පුද්ගලයන් වේ. මෙම වාර්තාවේ 08 සිට 09 දක්වා පිටුවල කොමිෂන් සභා සාමාජිකයින් පිළිබඳ විස්තරයක් ඇතුළත් වේ.

### කොමිෂන් සභාවේ වගකීම්

කොමිෂන් සභාව යනු කළමනාකාරිත්වයට උපායමාර්ගික නායකත්වය සපයන ඉහළම තීරණ ගැනීමේ ආයතනයයි. ආයතනයේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම සඳහා කොමිෂන් සභා සාමාජිකයින් වගකිව යුතුය. කොමිෂන් සභාවේ මඟ පෙන්වීම යටතේ මෙහෙයුම් කළමනාකරණය කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ අංශය නියාමනය කිරීම සඳහා තම අධිකාරිය අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට පවරයි.

කොමිෂන් සභාව,

- ආයතනයේ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට ආයතනික උපාය මාර්ග සමත් බව සහතික කිරීම.
- විශේෂ ආයතනික ක්‍රියාමාර්ග සමාලෝචනය කර අනුමත කිරීම.
- කළමනාකාරිත්වයේ උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- ක්‍රියාකාරී සැලැස්ම, ආයතනික සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ වාර්ෂික අයවැය සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.
- කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සහ උපායමාර්ගික සැලසුම් සහ අනෙකුත් දිගු කාලීන ඉලක්ක සන්සන්දනය කර ප්‍රතිඵල ඇගයීමට ලක් කිරීම.
- මූල්‍ය පාලන සහ වාර්තාකරණ පද්ධති සමාලෝචනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.
- නීතිමය අනුකූලතාව සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම.

### කොමිෂන් සභා රැස්වීම්

කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකු විය යුතු අතර, ඉන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුතුය. සභාපතිවරයා නොමැති විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතුය. කොමිෂන් සභා රැස්වීමක දී තීරණ ඒ සඳහා පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබේ.

කොමිෂන් සභාව සාමාන්‍යයෙන් සෑම මසකම සහ අවශ්‍ය පරිදි රැස්වේ. වසර මුළුල්ලේ කොමිෂන් සභාව 10 වතාවක් රැස්විය. කොමිෂන් සභා රැස්වීම්වල කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා, කොමිෂන් සභා පත්‍රිකා රැස්වීමට පෙර ප්‍රමාණවත් කාලයක් තුළ බෙදා හරිනු ලැබේ. එමඟින් කොමිෂන් සභා සාමාජිකයින්ට කොමිෂන් සභා පත්‍රිකා පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන බව සහතික කෙරේ.

2024 වසරේ දී පැවති කොමිෂන් සභා රැස්වීම් සඳහා සහභාගිත්වය පහත දැක්වේ.

| නම | තනතුර | පත්වීම් දිනය | ධුර කාලය අවසන් වන දිනය | ධුර කාලය තුළ පැවති රැස්වීම් ගණන | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|---|---|---|---|
| ආචාර්ය ධර්මසිරි කුමාරතුංග | සභාපති | 2024.01.01 | 2024.09.26 | 08 | 08 |
| ඩී.එම්.එම්. දිසානායක මහතා | අධ්‍යක්ෂ ජනරාල් | 2023.08.10 | 2024.10.02 | 08 | 08 |
| ඒ.බී. රාජසිංහ මහතා | සාමාජික | 2023.02.16 | 2024.10.15 | 08 | 07 |
| නන්දසිරි පොන්නම්පෙරුම මහතා | සාමාජික | 2023.06.13 | 2024.10.15 | 08 | 07 |
| ඉරුෂ කාලිදාස මහතා | සාමාජික | 2023.06.28 | 2024.10.15 | 08 | 03 |
| එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තේ (විශ්‍රාමික) | සභාපති | 2024.09.27 | 2024.11.25 | 01 | 01 |
| වී.ආර්.ඩබ්ලිව්.එස්. ධනපාල මහතා | සභාපති | 2024.11.29 | මේ දක්වා | 01 | 01 |
| එයාර් වයිස් මාර්ෂල් බන්දුල හේරත් (විශ්‍රාමික) | අධ්‍යක්ෂ ජනරාල් | 2024.10.03 | මේ දක්වා | 02 | 02 |
| අතුල විකිරි බණ්ඩාර මහතා | සාමාජික | 2024.10.15 | මේ දක්වා | 02 | 02 |
| රුක්ෂාන් රණබාහු මහතා | සාමාජික | 2024.10.15 | මේ දක්වා | 02 | 02 |
| අරුණ සී. කුකුලේගම මහතා | සාමාජික | 2024.10.15 | මේ දක්වා | 02 | 02 |

### කොමිෂන් සභා ලේකම්වරයාගේ කාර්යභාරය

- කොමිෂන් සභා රැස්වීම් කැඳවීම.
- වාර්තා කෙටුම්පත් කිරීම.
- වාර්තා සාරාංශ පිළියෙල කිරීම.
- පසු විපරම් ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීම සහ කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම.
- තීරණ ගැනීම සඳහා කොමිෂන් සභා සාමාජිකයන් වෙත යොමු කරන පත්‍රිකා සම්බන්ධව කටයුතු මෙහෙය වීම.
- මුද්‍රා ලේඛනය පවත්වාගෙන යාම.
- මුල් වාර්තා කළමනාකරණය කිරීම.
- කොමිෂන් සභාවේ නව සාමාජිකයින්ට සහායවීමේ ක්‍රියාවලිය සිදු කිරීම.
- කොමිෂන් සභාව වෙත විශේෂඥ මත ලබා දීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීමට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.

## ප්‍රධාන පාලන පිළිවෙත්

### වගවීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී සහ වාර්තා කිරීමේ දී කොමිෂන් සභාව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය සමඟ කියවිය යුතු 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධානවලට අනුකූලව, විගණකාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳ මූල්‍ය හා කළමනාකරණ විගණන සිදු කරයි.

### වගකීම

ආයතනයේ දිගුකාලීන තිරසාරභාවය සහතික කරමින් කොමිෂන් සභාව විසින් සැලසුම් කරන හා නියම කරන පරිදි කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම සහ සහතික කිරීම පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ කළමනාකරණ රැස්වීම් අඛණ්ඩව පවත්වයි.

කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය කොමිෂන් සභාව විසින් වරින් වර සමාලෝචනය කරනු ලැබේ.

### විනිවිදභාවය

කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් විනිවිදභාවයෙන් යුතුව මෙහෙයවීම සහතික කිරීම සඳහා කොමිෂන් සභාව රීති, රෙගුලාසි, මාර්ගෝපදේශ සකස් කර ඇත.

අභ්‍යන්තර විගණන අංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක යටතේ ක්‍රියාත්මක වන අතර, කොමිෂන් සභාවට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට සෘජුවම වාර්තා කරයි. කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයන් ඇතුළුව සියලුම පද්ධති සහ ක්‍රියාවලීන් නිසි පරිදි ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා මෙම අංශය වගකියනු ලැබේ.

විගණන කමිටුව විසින් කොමිෂන් සභාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වරින් වර සමාලෝචනය කරයි.

# මූල්‍ය ප්‍රකාශනය
## 2024 වර්ෂය සඳහා

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2024 දෙසැම්බර් 31 දිනට
*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | සටහන් | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 4 | 3,444,852,130 | 3,445,580,151 |
| දේපළ, පිරියත හා උපකරණ - කොළඹ නෙළුම් කුලුන | 4.1 | 60,769,584,120 | 61,450,235,494 |
| අස්පෘශ්‍ය වත්කම් | 4.2 | 926,404 | 1 |
| කෙරිගෙන යන වැඩ | 5 | 1,179,671,434 | 1,025,916,186 |
| ආයෝජන | 6 | 7,500,000,000 | 7,551,394,125 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **72,895,034,087** | **73,473,125,957** |
| **ජංගම වත්කම්** | | | |
| ලැබිය යුතු ගිණුම් | 7 | 2,925,397,231 | 2,791,140,497 |
| පූර්වගෙවුම් සහ අත්තිකාරම් | 8 | 119,333,880 | 205,833,705 |
| ණය සහ අනෙකුළුත් ලැබීම් | 9 | 171,560,617 | 1,835,537,864 |
| මුදල් සහ මුදල් සමානුපාත | 10 | 15,519,175,441 | 10,294,093,663 |
| **මුළු ජංගම වත්කම්** | | **18,735,467,170** | **15,126,605,730** |
| **මුළු වත්කම්** | | **91,630,501,256** | **88,599,731,687** |
| **සම කොටස් සහ වගකීම්** | | | |
| **සම කොටස්** | | | |
| රජයේ දායක මුදල් | 11 | 22,737,646,792 | 22,737,646,792 |
| සමුච්චිත අතිරික්තය | | 32,830,857,669 | 32,428,417,564 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 12 | 19,572,379,054 | 19,572,379,054 |
| **මුළු සම කොටස්** | | **75,140,883,515** | **74,738,443,410** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුලුන) | | 0 | 2,234,220,795 |
| රඳවා ගැනීම | 13 | 17,448,766 | 17,448,766 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 14 | 30,286,447 | 44,790,264 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **47,735,213** | **2,296,459,825** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**
**2024 දෙසැම්බර් 31 දිනට**
***(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)***

| | සටහන් | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|---|
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ගිණුම් | 15 | 2,274,439,799 | 3,116,819,143 |
| අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවීම් | 16 | 9,340,945,339 | 3,432,320,334 |
| භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු මුදල් | 17 | 1,774,853,570 | 1,637,168,956 |
| නෙළුම් කුලුනේ ප්‍රමාද හානි වගකීම් | | 3,051,643,819 | 3,378,520,019 |
| **මුළු ජංගම වගකීම්** | | **16,441,882,528** | **11,564,828,453** |
| **මුළු වගකීම්** | | **16,489,617,741** | **13,861,288,277** |
| **මුළු සම කොටස් සහ වගකීම්** | | **91,630,501,256** | **88,599,731,687** |

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමස්ථ මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි. කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනය මඟින් 2024 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සත්‍ය හා සාධාරණ සමාලෝචනයක් කර ඇති බවත් කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත එතැන් සිට අවසන් වන බවත් සහතික කරමි.

.....................

**එම්.කේ. ජයන්ත**
**අධ්‍යක්ෂ - මූල්‍ය**

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාව සතුවේ. කොමිෂන් සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

| | | |
|---|---|---|
| .............................. | .............................. | .............................. |
| **වරුණ ශ්‍රී ධනපාල** | **එයාර් වයිස් මාර්ෂල් බන්දුල හේරත් (විශ්‍රාමික)** | **අරුණ චමින්ද කුකුලේගම** |
| **සභාපති** | **අධ්‍යක්ෂ ජනරාල්** | **කොමිෂන් සභා සාමාජික** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය**
**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**
***(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)***

| | සටහන් | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආදායම | 18 | 36,969,301,790 | 48,235,966,865 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | **36,969,301,790** | **48,235,966,865** |
| *අඩු කළා:* *නියාමන වියදම්* | 19 | (6,801,857,045) | (1,131,537,426) |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම** | | **30,167,444,745** | **47,104,429,439** |
| ***අඩු කළා: වෙනත් වියදම්*** | | | |
| පරිපාලන හා ස්ථාපිත කිරීම | 20 | 1,726,846,103 | 1,565,095,871 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 21 | 111,932,340 | 120,438,179 |
| (විදේශ විනිමය ගනුදෙනු (ලාභය)/අලාභය | | (1,085,255,615) | (384,645,157) |
| **මුළු වියදම** | | **753,522,828** | **1,300,888,893** |
| **අඛණ්ඩ මෙහෙයුම් වලින් ලැබෙන ආදායම** | | **29,413,921,917** | **45,803,540,546** |
| *අඩු කළා:* ආදායම් බදු - වර්ෂය සඳහා ගාස්තු | | (3,643,113,935) | 0 |
| පසුගිය වර්ෂය වැඩි වෙන්කිරීම් ගැළපීම | | 0 | (501,617,700) |
| **අඛණ්ඩ මෙහෙයුම් තුළින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පසු** | | **25,770,807,982** | **45,301,922,846** |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ලාභය/(අලාභය) | | (19,565,330) | 101,443 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම** | | **(19,565,330)** | **101,443** |
| **බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | **25,751,242,652** | **45,302,024,289** |
| *අඩු කළා:* ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 22 | (25,348,845,276) | (44,055,632,587) |
| **ඒකාබද්ධ අරමුදලට දායක කිරීමෙන් පසුව වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | **402,397,376** | **1,246,391,702** |
| *එකතු කළා:* **ඉදිරියට ගෙනා මුළු විස්තීරණ ආදායම** | | 32,428,460,293 | 31,182,025,862 |
| **ඉදිරියට ගෙන ගිය මුළු විස්තීර්ණ ආදායම** | | **32,830,857,669** | **32,428,417,564** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | සටහන් | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ | | | |
| මෙහෙයුම් තුළින් උත්පාදනය වූ මුදල් | 23 | 32,956,315,012 | 45,711,556,178 |
| බදු ගෙවීම් | | (679,367,183) | (815,318,475) |
| විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් | | (5,490,330) | (10,636,780) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය | | **32,271,457,499** | **44,885,600,923** |
| ආයෝජන ක්‍රියාකාරකම් මඟින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම | | (27,342,119) | (2,505,689) |
| කෙරිගෙන යන වැඩ යටතේ ඇති ව්‍යාපෘති | | (153,755,248) | (55,568,265) |
| ස්ථාවර තැන්පතුවල ශුද්ධ ආයෝජනය හා භාණ්ඩාගාර බැඳුම්කර | | 51,394,125 | 3,900,000,000 |
| ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොළී ආදායම | | 759,949,700 | 1,783,165,651 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන - පාරිතෝෂික බැදීම් | | (60,300,000) | (4,680,000) |
| ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොළී ආදායම - පාරිතෝෂික බැදීම් | | 17,663,969 | 9,262,419 |
| දේපළ, පිරියත් සහ උපකරණ අළෙවි කිරීම් | | 0 | 279,600 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල | | **587,610,427** | **5,629,953,715** |
| මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ | | | |
| අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම | | 0 | 17,450,122 |
| මුදල් වෙළඳපල ගණුදෙනු වලින් පොළී අදායම | | 691,844,503 | 1,124,766,523 |
| ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ | | (25,348,845,276) | (44,055,632,587) |
| ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙලුම් කුලුන) | | (2,423,818,355) | 0 |
| කූපන් පොලී ආදායම | | 187,027,397 | 0 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් | | (26,893,791,731) | (42,913,415,942) |
| මුදල් හා මුදල් සමානුපාත වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම | | **5,983,441,193** | **7,602,138,696** |
| මුදල් හා මුදල් සමානුපාතවල වෙනස්වීම | | | |
| 2024 ජනවාරි 01 දිනට | 10 | 10,294,093,663 | 2,691,954,967 |
| (අඩුවීම)/වැඩිවීම | | 5,983,441,193 | 7,602,138,696 |
| මුදල් හා මුදල් සමානුපාතවල විනිමය අනුපාතය (අලාභය)/ලාභය | | (758,359,415) | 0 |
| **2024 දෙසැම්බර් 31 දිනට** | **10** | **15,519,175,441** | **10,294,093,663** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**සමානුපාතවල වෙනස්කම් ප්‍රකාශය**
**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
***(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)***

| | සටහන් | රාජ්‍යදායකවීම් | ප්‍රත්‍යාගණන අතිරික්තය | සමුච්චිත අතිරික්තය / (හිඟය) | මුළු සමානුපාත |
|---|---|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | | **526,214,744** | **37,380,000** | **31,182,025,862** | **31,745,620,606** |
| අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම් | | - | - | (1,000,000,000) | (1,000,000,000) |
| | | **526,214,744** | **37,380,000** | **30,182,025,862** | **30,745,620,606** |
| රජයේ ප්‍රදාන | 11 | 22,211,432,048 | - | - | 22,211,432,048 |
| නැවත තක්සේරු කිරීමේ අතිරික්තය | 12 | - | 19,534,999,054 | - | 19,534,999,054 |
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | - | - | 2,246,391,702 | 2,246,391,702 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **22,737,646,792** | **19,572,379,054** | **32,428,417,564** | **74,738,443,410** |
| | | | | | |
| **2024 ජනවාරි 01 දිනට ශේෂය** | | **22,737,646,792** | **19,572,379,054** | **32,428,417,564** | **74,738,443,410** |
| 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | - | - | 402,397,376 | 402,397,376 |
| කපා හැරීම් (ශුද්ධ) | | - | - | 42,729 | 42,729 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **22,737,646,792** | **19,572,379,054** | **32,830,857,669** | **75,140,883,515** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – 2024.12.31**
**(මෙම සටහන්වල සියළුම වටිනාකම් වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මිස ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)**

## 1. පොදු තොරතුරු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයකි.

කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 පිහිටා තිබේ.

**උක්ත පනතේ සඳහන් පරිදි කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් වේ:**

කොමිෂන් සභාව විසින් පනත යටතේ තමා සතු බලතල ජාතික යහපත ප්‍රවර්ධනය කිරීම සඳහා තමා වඩාත්ම යෝග්‍ය යයි තමා සලකන ආකාරයට සහ විශේෂයෙන්,

(අ) ශ්‍රී ලංකාවේ ජාතික හා අන්තර්ජාතික විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා සියලුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි වන පරිදි විශ්වාසය තැබිය හැකි සහ කාර්යක්ෂම සේවාවක්, (එවැනි සේවාවක් සැපයීම ප්‍රායෝගික නොවන අවස්ථාවල හැර) හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා, ග්‍රාමීය සේවා සහ වෙනත් ප්‍රදේශවල ජාතික යහපත පිණිස අවශ්‍ය යයි සළකනු ලබන සේවා ඇතුළුව, සපයනු ලබන බවට වගබලා ගැනීම.

(ආ) (අ) ඡේදයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, සෑම ක්‍රියාකරුවකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා, එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔහු විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.

(ඇ) අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සහ විදුලි සංදේශ උපකරණ වල තත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චි කරන්නන්ගේ සම්බන්ධතාවයන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඈ) විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වයක් පවත්වා ගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සහ ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාවය සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

(ඉ) අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳ සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

(ඊ) අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරවලින් තොර විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම් ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.

(උ) විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම.

(ඌ) ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති, විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චි කරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරිගැන්වීම.

(එ) ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

## 2. අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (“SLFRS” සහ “LKAS”) සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්වල (SLPSAS’s) අවශ්‍යතා ප්‍රකාරව කොමිෂන් සභාව සිය මූල්‍ය ප්‍රකාශන සකස් කරයි.

## 3. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මිස ඉදිරිපත් කළ සියලුම වර්ෂ සඳහා අඛණ්ඩව අදාළ කරගෙන ඇත.

## 3.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (“SLFRS” සහ“LKAS”) අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ පිළියෙල කර ඇත. මෙම ගිණුම්වලට බලපාන උද්ධමනකාරී සාධකයන් සඳහා ගැලපීම් කර නැත.

### 3.1.1 විදේශ විනිමය පරිවර්තනය කිරීම

ගණුදෙනු සිදුවූ අවස්ථාවේ පැවති විදේශ විනිමය අනුපාතය සියළු විදේශ මුදලින් වූ ගණුදෙනු සඳහා යොදාගෙන ඇත. විදේශ මුදලින් ඇති වත්කම් සහ වගකීම් ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකය යටතේ පරිවර්තනය කරයි. එහි ප්‍රතිඵල ලෙස ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇත.

## 3.2 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

### 3.2.1 දේපල, පිරියත සහ උපකරණ

#### (අ) හඳුනාගැනීමේ මිනුම

##### I. දේපළ පිරියත සහ උපකරණ

සියලුම දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය පිරිවැය හෝ හානිකරන අලාභය මත සටහන් කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ පිරිවැය එහි ගැනුම් මිල සහ පරිහරණය කිරීමට අපේක්ෂිත වත්කම්වල සේවා තත්ත්වය මත ඍජු ආරෝපිත පිරිවැයෙන් සමන්විත වේ.

කොමිෂන් සභාව වෙත අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉදිරියට ගෙන යාම හෝ ගලා ඒම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද පසුකාලීන පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසේ දැක්වෙන වත්කමක මුල් පිරිවැය හඳුනා නොගනී. අනෙකුත් සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් ඔවුන් දරනු ලබන මූල්‍ය කාල සීමාව තුළ විස්තීරණ ආදායමට අය කෙරේ.

විගණන කමිටුවේ උපදෙස් පරිදි, පසුගිය වසරේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ එකගතාවය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රත්‍යාගණන ප්‍රතිපත්ති කෙටුම්පත සඳහා විගණකාධිපතිගේ මතය ලැබෙන තුරු, මූල්‍ය අංශය විසින් එම ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර එම ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සම්බන්ධ කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කර සකස් කරන මෙන් පාලන අංශයෙන් ඉල්ලා සිටින ලදී.

##### II. ආයෝජන දේපළ - කොළඹ නෙළුම් කුලුන

ආයෝජන දේපළ, පිරිවැය සමුච්චිත ක්ෂයවීම් අඩු කර ප්‍රකාශ කර ඇත.

#### (ආ) ක්ෂය වීම්

ඉඩම් ක්ෂය කිරීමට නොහැකිය. සෙසු වත්කම් ක්ෂය කිරීමේදී ලාභය හෝ අලාභය දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල එක් එක් කොටස්වල ඵලදායී ජීවිත කාලය පුරා ක්ෂය කිරීමේ සරල රේඛීය ක්‍රමය මත හඳුනාගනු ලැබේ. අත්පත් කර ගන්නා වර්ෂයේදී ක්ෂය කිරීම වත්කම පරිහරණයට ගන්නා ලද මාසයේ සිට සමානුපාතික පදනම මත ගණනය කරනු ලබන අතර අදාල වත්කම ඉවත් කරන මාසයේදී ක්ෂය කිරීම සිදු නොකරයි.

### (ඇ) දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය (ආයෝජන දේපල ඇතුළුව)

| | |
|---|---|
| නෙළුම් කුළුණ ගොඩනැගිල්ල සහ ව්‍යුහය | වසර 50 වැඩි |
| අනෙකුත් ගොඩනැගිලි | වසර 20 වැඩි |
| විදුලි සංදේශ කුලුනු | වසර 10 වැඩි |
| ලී බඩු සහ සවි කිරීම් | වසර 10 වැඩි |
| කාර්යාල උපකරණ | වසර 10 වැඩි |
| ගිනි ආරක්ෂණ පද්ධතිය | වසර 10 වැඩි |
| මුළුතැන්ගෙයි උපකරණ | වසර 10 වැඩි |
| වායු සමීකරණ | වසර 10 වැඩි |
| විදුලි උත්පාදන යන්ත්‍ර | වසර 10 වැඩි |
| විදුලි සෝපාන යන්ත්‍ර | වසර 10 වැඩි |
| කාර්යාල දුරකථන | වසර 10 වැඩි |
| තාක්ෂණ උපකරණ | වසර 10 වැඩි |
| මෝටර් රථ | වසර 08 වැඩි |
| පරිගණක | වසර 04 වැඩි |
| වෙබ් සර්වර් | වසර 04 වැඩි |
| කායවර්ධන උපකරණ | වසර 04 වැඩි |
| මාධ්‍ය ඒකක උපකරණ | වසර 04 වැඩි |

### (ඇ) අස්පෘශ්‍ය වත්කම්

නිශ්චිත මෘදුකාංග අත්පත් කර ගැනීමට සහ භාවිත කිරීමට දරන පිරිවැය මත පදනම්ව, අත්පත් කරගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. එම වියදම් වසරක කාලයක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

### (ඉ) කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල පිරිවැය සඳහන් වේ. මෙය ප්‍රාග්ධනය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීම සහ පද්ධති සංවර්ධනයෙහි ලා සෘජුවම වැය කරන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

### (ඊ) ශේෂ පත්‍රයෙහි වත්කම් හෝ වගකීම් ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ප්‍රකාශ කරන වටිනාකම, බැහැර කිරීම මත ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීම මත ලාභය සහ අලාභය තීරණය වන්නේ දේපල, පිරියත සහ උපකරණවල ප්‍රකාශ කරන වටිනාකම සමඟ වත්කමක් බැහැර කිරීමෙන් ලැබෙන ආදායම සන්සන්දනය කිරීමෙන් වන අතර "වෙනත් ආදායම්" ලාභය හෝ පාඩුව තුලින් වටිනාකම හඳුනා ගනු ලැබේ.

### 3.2.2 තාවකාලික අරමුදල් කළමනාකරණය / ආයෝජන

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාවකාලික අරමුදල් කළමනාකරණ මාර්ගෝපදේශයට අනුකූලව සියලුම ආයෝජන කටයුතු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

ආයෝජන ශේෂය යනු රු. 7,500,000 ක ස්ථාවර තැන්පතුවක් වන අතර එය "ගමට සන්නිවේදනය", ෆයිබර් පාසල් ව්‍යාපෘතිය වැනි ජාතික ව්‍යාපෘති සඳහා වෙන් කර තබා ඇත.

ඉහත ස්ථාවර තැන්පතුවෙන් ලැබෙන පොලී ආදායම 18 අ(1) විවිධ ආදායම් සටහන යටතේ සටහන් කර ඇත.

### 3.2.3 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් හඳුනාගෙන පවත්වාගෙන යනු ලබන්නේ එක්රැස් කර ගත නොහැකි සියළුම වටිනාකම් සඳහා වන සියළුම දීමනා අඩුකිරීමෙන් පසුව/අඩුව සහ මුල් බිල්පත් වටිනාකම් මතය. සම්පූර්ණ වටිනාකම රැස්කිරීම තවදුරටත් අපේක්ෂා කල නොහැකි විට අඩමාන ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ.

### 3.2.4 මුදල් සහ මුදල් සමානුපාත

මුදල් සහ මුදල් සමානුපාත යනු අතැති මුදල්, බැංකු තැන්පතු සහ බැංකුවේ මුදල් වෙළෙඳපොළ ඉතුරුම් ගිණුම වේ.

### 3.3 වගකීම් සහ වෙන් කිරීම්

ශේෂපත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂපත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කොට ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම මත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

### 3.3.1 ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දිනට ඇති ප්‍රාග්ධන වියදම් බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම් ගිණුම් සඳහා සටහන් අංක 3.8 යටතේ හෙළිදරව් කර ඇත.

### 3.3.2 කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

### (අ) විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම

වර්ෂය තුල විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම පහත දැක්වේ.

| | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| **මූල්‍යය වර්ෂය ආරම්භයේදී ශේෂය** | **137,352,511** | **117,674,290** |
| ජංගම සේවා පිරිවැය | 5,119,234 | 3,942,155 |
| පොළී පිරිවැය | 8,010,245 | 7,851,356 |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් ලෙස අයකිරීම්** | **150,481,990** | **129,467,801** |
| තථ්‍ය අලාභ / (ලාභ) | 19,565,330 | (101,443) |
| ගෙවන ලද ප්‍රතිලාභ | (5,490,330) | (10,636,780) |
| **එකතු කළා:** පාරිතෝෂික බැඳීම් ආවරණය කිරීමට ආයෝජන මත උපයාගත් පොලිය | 14,250,387 | 18,622,933 |
| **මූල්‍යය වර්ෂය අවසානයේදී ශේෂය** | **178,807,377** | **137,352,511** |

1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ ගෙවීම් ප්‍රකාරව අවශ්‍ය පරිදි සුදුසුකම් ලත් සියලුම සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සැලැස්ම මඟින් සේවකයෙකු විශ්‍රාම ගැනීම මත ලබා ගන්නා ප්‍රතිලාභවල වටිනාකම විස්තර කෙරේ. විස්තර කර ඇති ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වගකීම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 19: සේවක ප්‍රතිලාභ හි නියම කර ඇති අපේක්ෂිත ඒකක ක්‍රමය භාවිත කරමින් කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

පසුගිය වර්ෂයේ අධි හෝ ඌන වෙන් කිරීම් නිසා සිදුවන වෙනස්කම් මඟින් පැන නඟින ලාභය හෝ අලාභය එය සිදුවන කාලපරිච්ඡේදයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා අය කිරීම හෝ බැර කිරීම කරනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල වර්ෂය සඳහා පාරිතෝෂික අය කිරීම ක්ෂණිකව හඳුනාගනු ලැබේ. කොමිෂන් සභාව විසින් පාරිතෝෂික බැඳීම් සඳහා සමාන වටිනාකම ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලැබේ.

පහත සඳහන් ප්‍රධාන තථ්‍ය උපකල්පනයන් සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් පාරිතෝෂික වෙන් කිරීම සිදු කරනු ලැබේ.

වට්ටම් අනුපාතිකය - වාර්ෂිකව සියයට 10.25%

වැටුප් වර්ධක අනුපාතය - 1% - 6.7% දක්වා

විශ්‍රාම ගැනීමේ වයස - අවුරුදු 60

### (ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලැස්මට දායක මුදල් ගෙවීමේ වගකීම, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දරන ලද වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

### (ඇ) සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF)

කොමිෂන් සභාවේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ (EPF) සහ සේවක භාර අරමුදලේ (ETF) සාමාජිකයින් වේ.

කොමිෂන් සභාව සේවකයින්ගේ මූලික වැටුපෙන් 15% ක් සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාර අරමුදලට (ETF) දායක වන අතර, සේවකයා සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා 10% ක දායකත්වයක් සපයයි.

## 3.4 ආදායම් හඳුනාගැනීම

ආදායම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - (LKAS) 18 ට අනුකූලව හඳුනා ගැනේ.

### 3.4.1 සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුව

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනත මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 වන වගන්තියට අනුව, සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුව යනු ඕනෑම ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචක උපකරණයක් භාවිත කිරීම සඳහා සංඛ්‍යාත පරිශීලකයා විසින් ගෙවිය යුතු ගාස්තුවයි. එබැවින්, 2019 වසරේ සිට නාවික මධ්‍යස්ථාන ගාස්තුව සහ ගුවන් යානා බලපත්‍ර ගාස්තුව ද ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුව යටතේ වර්ගීකරණය කරන ලදී.

වර්ෂය තුළ එකතු කරන ලද ඕනෑම සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුවක බලපත්‍ර කාලය ඊළඟ වර්ෂය දක්වා ක්‍රියාත්මක වන්නේ නම්, ඊළඟ වසරට අදාළ සමානුපාතික මුදල අත්තිකාරම් ආදායම ලෙස හඳුනාගෙන අත්තිකාරම්, තැන්පතු සහ අනෙකුත් ගෙවිය යුතු දේ යන ශීර්ෂය යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

### 3.4.2 ක්‍රියාකරු බලපත්‍ර ගාස්තුව

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනත මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ, නව බලපත්‍ර නිකුත් කරන විට හෝ පවතින බලපත්‍ර වසර 10 ක හෝ අවුරුදු 05 ක කාලයක් සඳහා විදුලි සංදේශ ක්‍රියාකරුවන්ට අලුත් කරන විට, මුදල් පදනම මත ක්‍රියාකරු බලපත්‍ර ගාස්තුව හඳුනා ගනු ලැබේ.

### 3.4.3 වෙළඳ බලපත්‍ර ගාස්තුව/ රැහැන් රහිත දුරකථන අලෙවිකරු ගාස්තු/ කෙටි කේත ගාස්තු/ අයදුම්පත් ක්‍රියාවලි ගාස්තුව

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනත මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ (21) වගන්තිය යටතේ පුද්ගලයින්ට බලපත්‍ර නිකුත් කරන විට මුදල් පදනම මත වෙළඳ බලපත්‍ර ගාස්තුව හඳුනා ගැනේ.

### 3.4.4 සෙස් ගාස්තුව

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනත මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22(උ) වගන්තියේ කොන්දේසි ප්‍රකාරව සෙස් ගාස්තුව හඳුනාගනු ලැබේ.

ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් (පුද්) සමාගම විසින් නොගෙවන ලද සෙස් ගාස්තු අයකර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.

### 3.4.5 විදුලි සංදේශ බද්ද

2011 අංක 21 දරන විදුලි සංදේශ පනත යටතේ විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගෙන් ලැබෙන විදුලි සංදේශ බද්ද (TL), ආදායමක් ලෙස හඳුනාගෙන පසුව රාජ්‍ය ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

2018.11.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලි සංදේශ සේවා සඳහා වන විදුලි සංදේශ බද්ද 25% සිට 15% දක්වා අඩු කරන ලද අතර, 2019.11.27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කරන ලද පරිදි 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීමත් සමඟ 2019.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 15% සිට 11.25% දක්වා නැවත අඩු කරන ලදී. එබැවින්, 2022 ජූනි 4 වන දින සිට විදුලි සංදේශ බද්ද 11.25% සිට 15% දක්වා වැඩි කිරීමට යෝජනා කෙරේ.

2011 අංක 21 දරන විදුලි සංදේශ පනතේ විධිවිධාන අනුව, ලංකා කේබල් සැටලයිට් නෙට්වර්ක් (පුද්) සමාගම විසින් නොගෙවන ලද විදුලි සංදේශ බද්ද අයකර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.

### 3.4.6 විදුලි සංදේශ සංවර්ධන ගාස්තු

2004 අංක 11 දරන මුදල් පනතේ III කොටස යටතේ බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන්ගෙන් ලැබුණු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු සහ වැඩිදුර රෙගුලාසි 2010 ජුලි 12 දිනැති අංක 1662/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන අතර, මෙම ආදායමෙන් සියයට 50 ක් නියමිත දිනට හෝ ඊට පෙර රාජ්‍ය ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

### 3.4.7 තොග කෙටි පණිවිඩ සේවාව (SMS) සඳහා බද්ද

2018 අංක 35 දරන මුදල් පනතේ xiii කොටස යටතේ 2019.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තොග කෙටි පණිවිඩ සේවාව (SMS) සඳහා බද්දක් පනවන ලද අතර වැඩිදුර රෙගුලාසි අංක 2104/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කෙරේ.

### 3.4.8 ජංගම දුරකථන කුළුණු බද්ද

2018 අංක 35 දරන මුදල් පනතේ xii කොටස යටතේ 2019.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෙලියුලර් කුළුණු බද්ද පනවන ලද අතර වැඩිදුර රෙගුලාසි අංක 2104/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇත.

### 3.4.9 මාදිලි අනුමැති ගාස්තු

මෙය 2020 ඔක්තෝබර් 09 දිනැති අංක 2196/51 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) මාදිලි අනුමැති රීති 2020 ලෙස හඳුන්වා දුන් නව ආදායම් මූලාශ්‍රයකි. එමගින් ශ්‍රී ලංකාවේ ආනයනය කිරීමට, අලෙවි කිරීමට, නිෂ්පාදනය කිරීමට හෝ භාවිත කිරීමට අදහස් කරන සියලුම වර්ගවල ගුවන් විදුලි සහ විදුලි සඳේශ පර්යන්ත උපකරණ (RTTE) ආශ්‍රිතව අදාළ වන සියලුම ගාස්තු විස්තර කර ඇත.

මාදිලි අනුමැති අයදුම්පත් ඇගයීම සහ වෙළඳපල නිරීක්ෂණ ඇතුළුව, මාදිලි අනුමැති පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් ආවරණය කිරීම මාදිලි අනුමැති ගාස්තුවෙන් අදහස් කෙරේ. මෙම රීතිවල පරිශිෂ්ට ඇ හි දක්වා ඇති පරිදි, මාදිලි අනුමැති ගාස්තු එක් එක් ගුවන් විදුලි සහ විදුලි සඳේශ පර්යන්ත උපකරණ (RTTE) වර්ගය සඳහා අය කෙරේ. අවශ්‍ය පරිදි කොමිෂන් සභාව විසින් වරින් වර මාදිලි අනුමැති ගාස්තු සමාලෝචනය කළ හැකිය.

### 3.4.10 විවිධ ආදායම්

කෙටි කාලීන ස්ථාවර තැන්පතු සහ මුදල් වෙළඳපොළ ඉතුරුම් ගිණුම්, කොකාවිල් කල්බදු කුලිය, මඩුකන්ද කල්බදු කුලිය ආදිය මත ලැබෙන පොලී ආදායම විවිධ ආදායම්වලට ඇතුළත් වේ. කල්පිරීමේ දිනයේදී ලාභ හෝ අලාභ වශයෙන් එකතු වන විට පොලී ආදායම හඳුනා ගැනේ.

## 3.5 වියදම

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමවල ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාවයක් මත ය. කොමිෂන් සභාව පවත්වාගෙන යාමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වා ගැනීමේදී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේ දී ආදායමට ගණන් ගෙන ඇත.

### 3.5.1 ආදායම් බදු

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද පරිදි, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බදු කාලය ජනවාරි 1 වන දින සිට දෙසැම්බර් 31 දක්වා වේ. ඒ අනුව, 2024 සඳහා බදු වගකීම පහත දැක්වේ.

| | **2024 (රු.)** |
|---|---|
| **බදුකරණයට පෙර ගිණුම් ලාභය** | **29,413,921,917** |
| **එකතු කළා:** ආදායම් බදු ගෙවීම 2020 **(සටහන)** | 1,994,163,391 |
| **එකතු කළා:** අධිභාර බදු ගෙවීම 2020 **(සටහන)** | 2,147,456,398 |
| **එකතු කළා:** බදු අයකළ හැකි ආදායම / (අලාභය) තීරණය කිරීමේදී අනුමත කළ නොහැකි වියදම්වල බදු බලපෑම | (372,341,270) |
| **අඩු කළා:** බදු මත ආදායම, බදු අය කළ හැකි ආදායම්/ (අලාභය) තීරණය කිරීමේදී අනුමත කළ නොහැකි මුළු වියදම් සහ පොලී ආදායම | (22,685,121,440) |
| **ආදායම් බදු සඳහා අය කළ හැකි ගැළපුම් කළ ගිණුම් ලාභය / (අලාභය)** | **10,498,078,996** |
| පොලී ආදායම | 1,645,634,121 |
| **තක්සේරු කළ හැකි ආදායම** | **12,143,713,116** |
| **අඩු කළා:** සුදුසුකම් ලබන ගෙවීම | - |
| **මුළු බදු අය කළ හැකි ආදායම** | **12,143,713,116** |
| වර්ෂය සඳහා බදු අනුපාතය | 30% |
| **වර්ෂය සඳහා බදු බලපෑම** | **3,643,113,935** |
| **ගෙවන ලද ස්වයං තක්සේරු බදු වාරික** | |
| 2024 නොවැම්බර් මාසයේ ගෙවන ලද ආදායම් බදු ගෙවීම (3 වන කාර්තුව) | 679,367,183 |
| 2025 පෙබරවාරි මාසයේ ගෙවන ලද ආදායම් බදු ගෙවීම (4 වන කාර්තුව) | 696,848,129 |
| රඳවා ගැනීමේ බදු (WHT)/ අත්තිකාරම් ආදායම් බද්ද (AIT) | 71,691,868 |
| **ගෙවිය යුතු බදු මුදල** | **2,195,206,754** |

*සටහන*

ඉහත සඳහන් බදු ගෙවීම් දෙක වන ආදායම් බදු 2020 සහ අධිභාර බද්ද 2020 පිළිබඳව, දැනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) සමඟ සාකච්ඡා කරමින් පවතී. 2020.01.07 දිනැති අංක MFE/FP/02/CM/2020/007 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් ඒකාබද්ධ අරමුදලට අරමුදල් ප්‍රේෂණය කර ඇති අතර, එය තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී සුදුසුකම් ලත් ගෙවීම් ලෙස සලකා බලා ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා විදුලි සදේශ නියාමන කොමිෂන් සභාව එහි ආයතනික ආදායම් බද්ද (CIT) ගණනය කර අදාළ ගෙවීම් සිදු කළ අතර, 2020/2021 තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවා අංශය-02 (LTU) විසින් නිසි ලෙස පිළිගනු ලැබීය.

කෙසේ වෙතත්, 2024.05.22 දින, ඒකාබද්ධ අරමුදලට ලැබෙන එවැනි දායකත්වයන් සුදුසුකම් ලත් ගෙවීම් ලෙස සැලකීම අභියෝගයට ලක් කරමින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශාල බදු ගෙවන්නන්ගේ විමර්ශන අංශය විසින් "තක්සේරු නිවේදනයක් " නිකුත් කරන ලදී.

මෙම තක්සේරුවට විරුද්ධව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) වෙත විධිමත් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අභියාචනා ක්‍රියාවලියේ ප්‍රතිඵල ලැබෙන තෙක්, 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල අදාළ බදු හිඟ මුදල් නිසි ලෙස හෙළිදරව් කර ඇති අතර ඒ සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

## 3.6 ආයෝජන දේපළ - කොළඹ නෙළුම් කුලුන

නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සොනාලි කේ.එම්. පෙරේරාගේ අංක 33 දරන බදු ගිවිසුම මත කොළඹ නෙළුම් කුළුණ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නිසි ලෙස සංස්ථාගත කරන ලද, සමාගම් අංක PV 00252719 දරන සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන කොළඹ 10, ඩී.ආර්. විජේවර්ධන මාවතේ අංක 320 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සීමාසහිත කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණ (පුද්ගලික) සමාගම (බදුකරු) වෙත 2022 මාර්තු 1 වන දින සිට 2072 පෙබරවාරි 29 දක්වා වසර 50 ක කාලයක් සඳහා බදු දෙන ලදී.

## 3.7 රජයේ ප්‍රදාන

### 3.7.1 නෙළුම් කුළුණ ඉඩම

රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තියට අනුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූලික සැලැස්ම අංක 9956 හි දැක්වෙන හෙක්ටෙයාර් 1.2141 ප්‍රමාණයකින් යුතු ඉඩමේ කැබලි අංක 1 ලෙස සලකුණු කර ඇති කොටස අංක 4/10/66753 දරන නිදහස් ප්‍රදානය මත සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූලික සැලැස්ම අංක 9401 හි දැක්වෙන හෙක්ටයාර 1.2141 ක ප්‍රමාණයකින් යුතු ඉඩමේ කැබලි අංක 1-6 දක්වා සලකුණු කර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස් සියල්ල අංක 4/10/66549 දරන නිදහස් ප්‍රදානය මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ප්‍රදානය කර ඇත. ප්‍රදාන දෙකෙහිම මුළු ප්‍රමාණයෙන් (හෙක්ටයාර 2.3513) ප්‍රත්‍යාගණනය කළ මුදල රු. 22,167,432,048 කි.

### 3.7.2 තොරතුරු තාක්ෂණ උද්‍යානය හම්බන්තොට සූරියවැව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) වෙනුවෙන් කොළඹ නොතාරිස් ඩී. සුනන්ද රණසිංහ මහතා විසින් සහතික කරන ලද 2014 සැප්තැම්බර් 3 දිනැති අංක 92 දරන ප්‍රදාන ඔප්පුව ක්‍රියාත්මක කර ඇති අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් ලියාපදිංචි බලපත්‍රලාභී මිනින්දෝරු සහ තලමිතිකරු ජී.ජී.එල්. පත්මසිරි මහතා විසින් සාදන ලද 2013 මැයි 4 දිනැති අංක 65/2013 පිඹුරුපත්වල දැක්වෙන කැබලි අක්ෂර J ලෙස සලකුණු කර ඇති ඉඩමේ අයිතිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් මාරු කර ඇත.

රජයේ තක්සේරුකරු විසින් ඉඩමේ වටිනාකම තක්සේරු කරන විට සූරියවැව ඉඩම් පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතුය.

## 3.8 අවිනිශ්චිත වියදම්

### 3.8.1 <u>ඩී.සී (කොළඹ) නඩු අංකය ඩී.එම්.ආර්/3277/2017</u>

සම්පූර්ණ යාපනය අර්ධද්වීපයම සහ යාබද දූපත් සියල්ලම ආවරණය කරන ලද සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයට සිදු වූ හානිය සහ සේවාව බිඳ වැටීම සම්බන්ධයෙන් නීති විරෝධී සහ / හෝ වැරදි ආකාරයෙන් සහ / හෝ කිසිදු හිමිකමක් නොමැතිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) මගින් රුපියල් 14,800,000,000/= ක වන්දි මුදලක් අයකර ගැනීම සඳහා පැමිණිලිකරු මෙම නඩුව ගොනු කර ඇත. මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින අතර වැඩිදුර නඩු විභාගය සඳහා නියම කර ඇත.

### 3.8.2 <u>එච්.සී. (සිවිල්) කොළඹ නඩු අංක 137/2011</u>

වගඋත්තරකරුගේ නීති විරෝධී සහ/හෝ වැරදි ආකාරයෙන් සහ/හෝ කිසිදු හිමිකමක් නොමැතිව සහ එම බලපත්‍රයේ සහ/හෝ ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කරමින්, ජංගම සන්නිවේදනය පිළිබඳ ගෝලීය පද්ධති (GSM) ජංගම දුරකථන සහ සමමුහුර්ත සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (SCDMA) ජාලයක් ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස ඉහත ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පැමිණිලිකරුට අවසර දීම ප්‍රතික්ෂේප කිරීම සහ/හෝ අසමත් වීම සහ නොසලකා හැරීම හේතුවෙන් රුපියල් 47,345,112,000/= ක වන්දි අයකර ගැනීම සඳහා පැමිණිලිකරු මෙම නඩුව ගොනු කර ඇත. මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින අතර වැඩිදුර නඩු විභාගය සඳහා නියම කර ඇත.

### 3.8.3 <u>ඩී. සී. (කොළඹ) නඩු අංකය DMR/6188/2010</u>

ගෙවාන් ඉංජිනේරු ආයතනයේ හිමිකරු වන ගාමිණී රාජපක්ෂ මහතා, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විත්තිකරු ලෙස සඳහන් කරමින් කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ අංක 6188/2010 දරන නඩුවක් ගොනු කළේය.

2007 ජූලි 19 වන දින පැමිණිලිකරු සහ විත්තිකරු අතර ඇති කරගත් ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සඳේශ නියාමන කොමිෂන් සභාව වෙතින් වන්දි අයකර ගැනීම සඳහා පැමිණිලිකරු මෙම නඩුව ගොනු කර ඇත. ඉල්ලා සිටි සහන යටතේ, පැමිණිලිකරු රුපියල් මිලියන 1.5 ක වන්දි ඉල්ලා සිටියේය.

2019.04.30 දින නඩු තීන්දුව පැමිණිලිකරුට පක්ෂව ලබා දෙන ලදී. තීන්දුවට අනුව, නඩු විභාගය සඳහා රු. 71,443.31 ක් සහ නීතිමය පිරිවැය පැමිණිලිකරුට ප්‍රදානය කරන ලද අතර නඩුකරු විසින් ගොනු කළ යුතු නියෝගයක් ලබා දෙන ලදී.

### 3.9 සංසන්දනාත්මක තොරතුරු

වත්මන් වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයන්ට අනුකූලව, අවශ්‍ය අවස්ථාවන්හිදී සංසන්දනාත්මක තොරතුරු නැවත ස්ථාපිත කර හෝ නැවත වර්ගීකරණය කර ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

## 4. දේපළ, පිරියත සහ උපකරණ

| පිරිවැය | 2024.01.01 දිනට ශේෂය | 2024 වර්ෂය සඳහා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත්කිරීම්/ මාරුකිරීම් | |
| ඉඩම් | 3,377,830,000 | 0 | 0 | 3,377,830,000 |
| බද්දට ගත් ඉඩම් | 345,502 | 0 | 0 | 345,502 |
| ගොඩනැගිලි | 150,381,065 | 0 | 0 | 150,381,065 |
| කොකාවිල් කුලුන | 314,933,479 | 0 | 0 | 314,933,479 |
| වවුනියා කුලුන | 29,900,741 | 0 | 0 | 29,900,741 |
| වාහන | 164,200,913 | 0 | 0 | 164,200,913 |
| වායු සමීකරණ | 18,042,145 | 0 | 0 | 18,042,145 |
| විදුලි සෝපාන | 4,683,848 | 0 | 0 | 4,683,848 |
| විදුලි උත්පාදක යන්ත්‍ර | 2,665,428 | 3,247,047 | 0 | 5,912,474 |
| පරිගණක | 122,087,043 | 14,469,100 | 0 | 136,556,143 |
| වෙබ් සර්වර් | 34,095,551 | 0 | 0 | 34,095,551 |
| වෙනත් කාර්යාල උපකරණ | 49,610,436 | 5,223,802 | 0 | 54,834,238 |
| ජංගම දුරකථන | 1,517,309 | 619,640 | 0 | 2,136,949 |
| කාර්යාල ගෘහ භාණ්ඩ | 27,597,325 | 699,358 | 0 | 28,296,683 |
| තාක්ෂණික උපකරණ | 75,377,569 | 206,772 | 0 | 75,584,341 |
| FMMS ව්‍යාපෘති ආවේක්ෂණ වාහන | 61,712,127 | 0 | 0 | 61,712,127 |
| FMMS ව්‍යාපෘති උපකරණ | 408,303,544 | 0 | 0 | 408,303,544 |
| කායවර්ධන උපකරණ | 5,629,707 | 0 | 0 | 5,629,707 |
| මාධ්‍ය ඒකක උපකරණ | 13,615,066 | 0 | 0 | 13,615,066 |
| | **4,862,528,796** | **24,465,719** | **0** | **4,886,994,515** |

| ක්ෂය කිරීම් | 2024.01.01 දිනට ශේෂය | 2024 වර්ෂය සඳහා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත්කිරීම්/ මාරුකිරීම් | |
| ගොඩනැගිලි | 139,004,511 | 1,990,057 | | 140,994,568 |
| කොකාවිල් කුලුන | 314,933,480 | | | 314,933,480 |
| වවුනියා කුලුන | 29,900,741 | | | 29,900,741 |
| වාහන | 164,200,912 | | | 164,200,912 |
| වායු සමීකරණ | 16,014,780 | 454,495 | | 16,469,275 |
| විදුලි සෝපාන | 4,683,848 | | | 4,683,848 |
| විදුලි උත්පාදක යන්ත්‍ර | 2,665,428 | 140,557 | | 2,805,985 |
| පරිගණක | 115,353,215 | 3,814,236 | | 119,167,451 |
| වෙබ් සර්වර් | 34,095,550 | | | 34,095,550 |
| වෙනත් කාර්යාල උපකරණ | 38,357,771 | 2,611,014 | | 40,968,784 |
| ජංගම දුරකථන | 1,205,368 | 129,522 | | 1,334,891 |
| කාර්යාල ගෘහ භාණ්ඩ | 23,416,087 | 833,287 | | 24,249,373 |
| තාක්ෂණික උපකරණ | 62,554,775 | 4,584,631 | | 67,139,406 |
| FMMS ව්‍යාපෘති ආවේක්ෂණ වාහන | 61,712,127 | | | 61,712,127 |
| FMMS ව්‍යාපෘති උපකරණ | 390,011,615 | 10,448,442 | | 400,460,056 |
| කායවර්ධන උපකරණ | 5,629,707 | | | 5,629,707 |
| මාධ්‍ය ඒකක උපකරණ | 13,208,730 | 187,500 | | 13,396,230 |
| | **1,416,948,645** | | | **1,442,142,385** |
| ශුද්ධ පොත් අගය | 3,445,580,151 | | | 3,444,852,130 |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31
*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

### 4.1 දේපළ, පිරියත සහ උපකරණ - කොළඹ නෙලුම් කුලුන

| පිරිවැය | 2024.01.01 දිනට ශේෂය | 2024 වර්ෂය සඳහා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් / නැවත තක්සේරු කිරීම | ඉවත්කිරීම්/ මාරුකිරීම් | |
| ඉඩම් | 40,873,000,000 | 0 | 0 | 40,873,000,000 |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 18,773,228,257 | 0 | 0 | 18,773,228,257 |
| වායු සමීකරණ | 636,947,459 | 0 | 0 | 636,947,459 |
| විදුලි සෝපාන | 613,103,592 | 0 | 0 | 613,103,592 |
| විදුලි උත්පාදක යන්ත්‍ර | 540,207,042 | 0 | 0 | 540,207,042 |
| ගිනි ආරක්ෂණ පද්ධතිය | 362,321,270 | 0 | 0 | 362,321,270 |
| වෙනත් උපකරණ | 568,170,384 | 0 | 0 | 568,170,384 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 94,721,217 | 0 | 0 | 94,721,217 |
| මුළු තැන්ගෙයි උපකරණ | 236,397,126 | 0 | 0 | 236,397,126 |
| | **62,698,096,346** | **0** | **0** | **62,698,096,346** |

| ක්ෂය වීම් | 2024.01.01 දිනට ශේෂය | 2024 වර්ෂය සඳහා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත්කිරීම්/ මාරුකිරීම් | |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 688,351,703 | 375,464,565 | 0 | 1,063,816,268 |
| වායු සමීකරණ | 116,773,701 | 63,694,746 | 0 | 180,468,447 |
| විදුලි සෝපාන | 112,402,325 | 61,310,359 | 0 | 173,712,684 |
| විදුලි උත්පාදක යන්ත්‍ර | 99,037,958 | 54,020,704 | 0 | 153,058,662 |
| ගිනි ආරක්ෂණ පද්ධතිය | 66,425,566 | 36,232,127 | 0 | 102,657,693 |
| වෙනත් උපකරණ | 104,164,570 | 56,817,038 | 0 | 160,981,609 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 17,365,556 | 9,472,122 | 0 | 26,837,678 |
| මුළු තැන්ගෙයි උපකරණ | 43,339,473 | 23,639,713 | 0 | 66,979,186 |
| | **1,247,860,852** | **680,651,374** | **0** | **1,928,512,226** |
| ශුද්ධ පොත් අගය | **61,450,235,494** | | | **60,769,584,120** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31 *(Contd…)*
*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

## 4.2 අස්පෘශ්‍ය වත්කම්

| පිරිවැය | 2024.01.01 දිනට ශේෂය | 2024 වර්ෂය සඳහා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත්කිරීම්/ මාරුකිරීම් | |
| පරිගණක මෘදුකාංග | 47,369,781 | 2,876,400 | 0 | 50,246,181 |
| | **47,369,781** | **2,876,400** | **0** | **50,246,181** |

| ක්ෂය වීම් | 2024.01.01 දිනට ශේෂය | 2024 වර්ෂය සඳහා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත්කිරීම්/ මාරුකිරීම් | |
| පරිගණක මෘදුකාංග | 47,369,780 | 1,949,998 | 0 | 49,319,778 |
| | **47,369,780** | **1,949,998** | **0** | **49,319,778** |
| ශුද්ධ පොත් අගය | **1** | | | **926,404** |

## 5. කෙරිගෙන යන වැඩ

| | 2024.01.01 දිනට ශේෂය | 2024 වර්ෂය සඳහා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් / ගැලපුම් | (මාරු කිරීම්) | |
| ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල | 10,508,910 | 0 | 0 | 10,508,910 |
| තොරතුරු තාක්ෂණ උද්‍යානය - හම්බන්තොට | 711,268,797 | 0 | 0 | 711,268,797 |
| ල.වි.ස.නි.කො. සභාවේ ප්‍රධාන කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම | 199,748,125 | 32,705,379 | 0 | 232,453,504 |
| කදිරානා ඉදිකිරීම | 102,665,861 | 89,060,490 | 0 | 191,726,351 |
| කෙරිගෙන යන වැඩ - විවිධ | 1,724,493 | 31,989,379 | 0 | 33,713,872 |
| | **1,025,916,186** | **153,755,248** | **0** | **1,179,671,434** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31**
*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|---|
| **6. ආයෝජන** | | | |
| ස්ථාවර තැන්පතු | | 7,500,000,000 | 3,500,000,000 |
| ආයෝජන - භාණ්ඩාගාර තැන්පතු | | 0 | 4,000,000,000 |
| ආයෝජන - වට්ටම් - භාණ්ඩාගාර බැඳුම්කර | | 0 | 51,394,125 |
| | | **7,500,000,000** | **7,551,394,125** |
| **7. ලැබිය යුතු ගිණුම්** | | | |
| ලැබිය යුතු සෙස් ගාස්තු | | 627,843,738 | 560,419,554 |
| ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | | 443,872,866 | 632,433,755 |
| ලැබිය යුතු විදුලි සංදේශ බදු | | 1,046,821,583 | 839,954,289 |
| අයකර ගත යුතු කොකාවිල් කුලුන | | 115,528,038 | 115,320,992 |
| කුලුනෙන් ලැබිය යුතු බදු | | 424,287,530 | 412,818,085 |
| ලැබිය යුතු කෙටි පණිවුඩ සේවා බදු | | 81,808,024 | 68,179,704 |
| ලැබිය යුතු වෙනත් ආදායම් | | 4,520 | 0 |
| අයකර ගත යුතු හිඟ කාර්ය මණ්ඩල ණය | | 690,028 | 713,143 |
| ලැබිය යුතු කොකාවිල් බදුකුලී | | 2,066,233 | 1,176,987 |
| මඩුකන්ද බදු කුලී පාලන ගිණුම් | | 754,125 | 1,146,758 |
| ලැබිය යුතු ගුවන් ටිකට්පත් | | 972,600 | 764,900 |
| ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොලි | | 180,747,945 | 140,239,726 |
| ලැබිය යුතු කූපන් පොලී | | 0 | 17,972,603 |
| වෙළඳ ණයගැති | 7 අ | 0 | 0 |
| | | **2,791,140,497** | **3,104,691,601** |
| **07 අ. වෙළඳ ණයගැති** | | | |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | | 364,415,275 | 372,764,954 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | | 0 | 32,790 |
| | | **364,415,275** | **372,797,744** |
| *අඩු කළා -* බොල්ණය සඳහා වෙන් කිරීම් ** | | (364,415,275) | (372,797,744) |
| | | **0** | **0** |

| | ණය ගැතියන් | | ප්‍රතිපාදන |
|---|---|---|---|
| ***** බොල් ණය ගැතියන් සඳහා වෙන්කිරීම* | | | |
| වසර 20 ට වඩා වැඩි | 364,415,275 | **100%** | 364,415,275 |

වෙළඳ ණයගැතියන්හට 100% ලබා දීමෙන් පසු සාධාරණ වටිනාමකට දක්වා ඇත.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31**
***(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)***

| | | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|---|
| **8. පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්** | | | |
| විශේෂ අත්තිකාරම් | | 0 | 575 |
| උත්සව අත්තිකාරම් | | 191,000 | 198,000 |
| ගැනුම් අත්තිකාරම් | | 201,875 | 221,553 |
| පූර්ව ගෙවීම් | | 118,941,005 | 205,413,578 |
| | | **119,333,880** | **205,833,705** |
| **9. ණය සහ වෙනත් ලැබීම්** | | | |
| ආපදා ණය | | 65,036,032 | 52,391,777 |
| මෝටර් රථ ණය | | 97,337,842 | 106,277,187 |
| දේපළ ණය | | 207,495 | 279,640 |
| මෝටර් බයිසිකල් ණය | | 676,732 | 1,015,014 |
| අයකර ගතයුතු වැටුප් අඩුකිරීම් | | 2,302,065 | 2,305,065 |
| වෙනත් ලැබීම් | | 2,050,000 | 85,383,333 |
| ලං.වි.ම ආරක්ෂක ඇප තැන්පතු ගිණුම (තොරතුරු තාක්ෂණ උද්‍යානය) | | 125,000 | 125,000 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (රඳවා ගැනීමේ බදු) | | 0 | 163,072,996 |
| ආදායම් බදු | | 0 | 1,391,693,000 |
| නෙළුම් කුලුන විදුලි ආරක්ෂණ තැන්පතු | | 3,125,000 | 3,125,000 |
| ලැබිය යුතු මැතිවරණ රාජකාරි ගෙවීම් | | 700,451 | 0 |
| කොළඹ නෙළුම් කුලුන මඟින් ලැබිය යුතු මුදල් ඉපයීම් | | 0 | 29,869,852 |
| | | **171,560,617** | **1,835,537,864** |
| **10. මුදල් සහ මුදල් සමානුපාත** | | | |
| බැංකු මුදල් | **10 අ** | 284,423,226 | 2,273,593,726 |
| අතැති මුදල් | **10 ආ** | 75,000 | 75,000 |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව<br>අංක 119-2-001-2-3693169 ඉතුරුම් ගිණුම | | 15,234,677,215 | 8,020,424,937 |
| | | **15,519,175,441** | **10,294,093,663** |
| **10 අ. බැංකු මුදල්** | | | |
| I මහජන බැංකුව - නාරාහෙන්පිට ශාඛාව (තැන්පතු ගිණුම)<br>ගිණුම් අංකය 119-4021-1-3960300 (RFC USD 0032) | | 191,871,922 | 209,716,013 |
| II මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (එකතු කිරීමේ ගිණුම)<br>ජංගම ගිණුම අංක 119-1-001-4-3693169 | | 70,306,617 | 1,529,383,962 |
| III මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (එකතු කිරීමේ ගිණුම)<br>ජංගම ගිණුම අංක 119-1-002-3-3693169 | | 55,821 | 30,000 |
| IV මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව<br>ජංගම ගිණුම අංක 119-1-001-3-3693264 | | 1,014,587 | 467,974,275 |
| V ලංකා බැංකුව - නාරාහේන්පිට ශාඛාව<br>ජංගම ගිණුම අංක 2323167 | | 21,174,280 | 66,489,477 |
| | | **284,423,226** | **2,273,593,726** |
| **10 ආ. අතැති මුදල්** | | | |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | | 10,000 | 10,000 |
| සුළු මුදල් - පාලන හා මානව සම්පත් අංශය | | 15,000 | 15,000 |
| සුළු මුදල් - අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය | | 25,000 | 25,000 |
| සුළු මුදල් - අනුකූලතා | | 5,000 | 5,000 |
| සුළු මුදල් - පරිපාලන නිලධාරි / පාලන | | 20,000 | 20,000 |
| | | **75,000** | **75,000** |
| **11. රජයේ දායකවීම්** | | | |
| ලෝක බැංකු ණය ගිවිසුම | | 298,572,434 | 298,572,434 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | | 19,533,906 | 19,533,906 |
| භාණ්ඩාගාරය විසින් දායක කරන ලද ප්‍රග්ධනය | | 208,108,404 | 208,108,404 |
| රජයේ ප්‍රදාන - ඉඩම් | | 22,211,432,048 | 22,211,432,048 |
| | | **22,737,646,792** | **22,737,646,792** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|
| **12. තක්සේරු අතිරික්තය** | | |
| නැවත තක්සේරු කිරීමේ අතිරික්තය - විවෘත ශේෂය | 37,380,000 | 37,380,000 |
| නැවත තක්සේරු කිරීමේ අතිරික්තය - ආයෝජන දේපළ - නෙළුම් කුලුන | 16,350,032,825 | 16,350,032,825 |
| නැවත තක්සේරු කිරීම අතිරික්තය - වෙනත් ඉඩම | 3,184,966,229 | 3,184,966,229 |
| | **19,572,379,054** | **19,572,379,054** |
| **13. රඳවා ගැනීම්** | | |
| රඳවාගැනීම් - ප්‍රධාන කාර්යාලයීය නව ගොඩනැගිල්ල | 10,454,652 | 10,454,652 |
| රඳවාගැනීම් - කදිරාන | 6,994,114 | 6,994,114 |
| | **17,448,766** | **17,448,766** |
| **14. විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්** | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 178,807,377 | 137,352,511 |
| ස්ථාවර තැන්පතු (පාරිතෝෂික) | (137,400,000) | (77,100,000) |
| ප්‍රතිලාභ සඳහා ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළී | (11,120,930) | (15,462,247) |
| ශුද්ධ ප්‍රතිලාභ වගකීම් | **30,286,447** | **44,790,264** |
| **15. ලැබිය යුතු ගිණුම්** | | |
| උපචිත වියදම් | | |
| දුරකථන - කාර්යාලය | 350,046 | 740,018 |
| වැටුප් පාලන | 770,687 | 306,679 |
| ගෙවිය යුතු වැටුප් | 341,884 | 629,884 |
| විදුලිය | 1,825,329 | 2,839,931 |
| ජලය | 279,196 | 77,287 |
| සනීපාරක්ෂක සේවා | 1,332,073 | 838,167 |
| ආරක්ෂක සේවා | 1,704,410 | 1,659,790 |
| අතිකාල | 1,051,312 | 1,076,974 |
| සේවා අර්ථසාධක අරමුදල | 5,155,669 | 3,761,797 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 618,679 | 451,415 |
| අන්තර්ජාල | 511,359 | 405,939 |
| වෛද්‍ය රක්ෂණ හිමිකම් | 0 | 250,995 |
| කාර්ය මණ්ඩල සහසාධනය | 952,650 | 1,213,370 |
| පුවත්පත් සහ නිවේදන | 1,024,106 | 330,400 |
| විගණන ගාස්තු | 2,000,000 | 2,000,000 |
| ප්‍රසාද දීමනා | 42,003,689 | 35,823,516 |
| රඳවා ගැනීම් - පොදු | 613,771 | 508,436 |
| වැටුප් අඩුකිරීම් | 133,374 | 133,374 |
| අළුත්වැඩියා හා නඩත්තු | 9,398,696 | 15,399,925 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 1,543,725 | 1,369,460 |
| ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු | 0 | 56,537 |
| ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු | 8,678,641 | 5,424,109 |
| ගෙවිය යුතු විවිධ ගැනුම් සහ සැපයුම් | 44,205,527 | 166,563,411 |
| ගෙවිය යුතු වාර්ෂික දායකත්ව මුදල් | 205,978 | 0 |
| කාර්ය මණ්ඩල ණය වැඩියෙන් අයකර ගැනීම | 0 | 12,657 |
| ගෙවිය යුතු මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 257,492 | 159,425 |
| විවිධ ගෙවීම් | 147,045 | 718,572 |
| නඩු ගොනු කිරීම සහ නඩු වලට පෙනී සිටීම | 0 | 447,000 |
| විලම්භිත ආදායම | 1,878,060 | 1,878,060 |
| ගෙවිය යුතු අධිභාර | 2,147,456,398 | 0 |
| කොළඹ නෙළුම් කුලුනේ ණය ආපසු ගෙවීම | 0 | 2,871,742,016 |
| | **2,274,439,799** | **3,116,819,143** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31
*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|---|
| **16. අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු දෑ** | | | |
| අත්තිකාරම් ලෙස ලැබුණු ආදායම් | | 4,892,142,800 | 2,109,725,422 |
| ටෙන්ඩර් සඳහා ආපසු ගෙවිය යුතු තැන්පතු | | 1,770,167 | 1,745,167 |
| මෙගාහර්ට්ස් 1800 පරාසය සඳහා ලබුණු අත්තිකාරම් | | 57,500,000 | 57,500,000 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඵලදායී ආපදා කළමනාකරණ සමුළුව | | 34,210 | 34,210 |
| සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු වැඩියෙන් අයකර ගැනීම | | 2,175,002 | 2,175,002 |
| C.T.O විදුලි සංදේශ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය | | 924,492 | 924,492 |
| අගය එකතු කිරීමේ බදු පාලන ගිණුම් | | 925,019,553 | 1,078,317,169 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද) | | 129,175,188 | 181,130,172 |
| ආදායම් බදු | | 3,331,452,278 | 0 |
| ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු | | 0 | 5,250 |
| ඉදිකිරීමේ ණයගැතියන් | | 751,650 | 751,650 |
| වෙළඳ බලපත්‍ර ප්‍රමාද ගාස්තු ආපසු ගෙවීම් | | 0 | 11,800 |
| | | **9,340,945,339** | **3,432,320,334** |
| **17. භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ** | | | |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ සංවර්ධන අරමුදල 50% | | 221,936,432 | 316,216,877 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ බදු | | 1,046,821,584 | 839,954,291 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු කෙටි පණිවිඩ බදු | | 81,808,024 | 68,179,704 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු සෙලියුලර් කුලුනු බදු | | 424,287,530 | 412,818,085 |
| | | **1,774,853,570** | **1,637,168,956** |
| **18. ආදායම** | | | |
| ආදායම - බලපත්‍ර ගාස්තු | **18 අ** | 18,434,395,717 | 29,057,796,413 |
| විදුලි සංදේශ බදු | | 12,958,295,005 | 13,255,333,224 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | **18 ආ** | 3,267,678,917 | 3,983,034,681 |
| ජංගම කෙටි පණිවිඩ සේවා බදු | | 611,782,031 | 287,485,768 |
| සෙලියුලර් කුලුනු බදු | | 1,697,150,120 | 1,652,316,780 |
| | | **36,969,301,790** | **48,235,966,865** |
| **18 අ. ආදායම - බලපත්‍ර ගාස්තු** | | | |
| සෙස් ගාස්තු | | 6,111,180,171 | 5,637,770,474 |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | | 6,221,328,487 | 8,329,845,593 |
| සංඛ්‍යාත පෙරගෙවුම් ගාස්තු | | 4,124,550,000 | 6,106,230,000 |
| විදුලි සංදේශ ක්‍රියාකරු ගාස්තු | | 55,100,000 | 5,011,857,976 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | | 20,353,952 | 15,793,750 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | | 73,001 | 86,038 |
| රැහැන් රහිත දුරකථන බෙදාහැරීමේ ගාස්තු | | 58,987,192 | 71,589,345 |
| විභාග ගාස්තු | | 499,260 | 360,730 |
| මාදිලි අනුමැති ගාස්තු | | 31,909,322 | 23,407,284 |
| ලේබල් ගාස්තු | | 73,604,491 | 44,189,867 |
| අයදුම්පත්‍ර සැකසීමේ ගාස්තු | | 1,560,000 | 2,320,000 |
| කෙටි සංකේත අංක ගාස්තු | | 60,300,000 | 55,200,000 |
| අතිරික්ත ආදායම - **18 අ (1)** | | 1,674,949,840 | 3,759,145,355 |
| | | **18,434,395,717** | **29,057,796,413** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31
*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|
| **18 අ (1). අනෙකුත් ආදායම්** | | |
| කාර්ය මණ්ඩල ණය වලින් ලද පොලී ආදායම් | 6,812,521 | 7,467,105 |
| ස්ථාවර තැන්පතු වලින් ලද පොලී ආදායම් | 759,949,700 | 2,021,140,315 |
| මුදල් වෙළඳපල ගනුදෙනු මත පොලී ආදායම් | 691,844,503 | 1,124,766,523 |
| කොකාවිල් බදු කුලී | 7,109,252 | 7,076,563 |
| මඩුකන්ද බදු කුලී | 3,289,082 | 3,289,082 |
| කොළඹ නෙළුම් කුලුනේ බදු කුලී | 16,666,667 | 183,333,333 |
| වෙනත් ආදායම් - විවිධ | 2,063,540 | 1,391,681 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම | 0 | 279,600 |
| කූපන් පොලි ආදායම | 187,027,397 | 410,000,000 |
| සමුද්‍රීය ජංගම ස්ටිකර් ගාස්තු | 21,500 | 0 |
| බොල් ණය අයකර ගැනීම | 165,679 | 401,153 |
| | **1,674,949,840** | **3,759,145,355** |
| **18 ආ. විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC)** | | |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම | 3,267,678,917 | 3,983,034,681 |
| | **3,267,678,917** | **3,983,034,681** |
| **19. නියාමන වියදම්** | | |
| ITU වාර්ෂික සාමාජික මුදල | 31,446,522 | 64,202,161 |
| APT වාර්ෂික සාමාජික මුදල | 5,042,290 | 5,901,701 |
| දේශීය පුහුණු වැඩසටහන් - ITU/APT | 347,444 | 0 |
| නියාමන කටයුතු සඳහා සහභාගී වීම | 5,250,877 | 3,388,241 |
| නඩු ගොනුකිරීම සහ නඩු වලට පෙනීසිටීම | 2,496,250 | 9,385,050 |
| නෙළුම් කුලුන ණය පොලී | 738,016,727 | 162,594,088 |
| නියාමන කටයුතු සඳහා ප්‍රවාහන හා යැපීම් දීමනා | 1,773,617 | 1,861,535 |
| ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය | 1,346,334,008 | 207,322,524 |
| ශිෂ්‍යයන් දැනුවත් කිරීම් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන | 2,636,625 | 1,272,450 |
| එස්.ඒ.ටී.ආර්.සී (SATRC) | 4,645,110 | 0 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 489,932,062 | 661,675,252 |
| ආදායම් බදු | 1,994,163,391 | 0 |
| අධිභාර බදු | 2,147,456,398 | 0 |
| විවිධ නියාමන වියදම් | 32,315,724 | 13,934,425 |
| | **6,801,857,045** | **1,131,537,426** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|
| **20. පරිපාලන හා ආයතනික වියදම්** | | |
| වැටුප් | 226,641,933 | 179,257,568 |
| සේ.අ.අ. (15% දායකත්වය) | 35,569,566 | 26,177,574 |
| සේ.භා.අ. (3% දායකත්වය) | 7,113,913 | 5,235,534 |
| ජීවන වියදම් දීමනාව | 30,341,977 | 2,869,294 |
| ප්‍රවාහන දීමනා | 47,620,841 | 33,073,687 |
| ගෙවල් කුලී දීමනාව | 22,255,279 | 17,380,978 |
| වෙනත් දීමනා | 18,479,736 | 22,823,212 |
| කාර්ය සාධනය දිරිදීමනා | 54,778,368 | 43,206,970 |
| විශේෂ දීමනා | 415,807 | 358,852 |
| ප්‍රසාද දීමනා | 69,609,315 | 60,854,211 |
| අතිකාල | 15,593,298 | 11,820,529 |
| සභාපතිගේ වේතනය | 1,180,025 | 1,200,000 |
| පාවිච්චි නොකළ විවේක නිවාඩු | 15,310,090 | 11,575,930 |
| විශ්‍රාම වැටුප් සඳහා කොමිෂන් සභාවේ දායකත්වය | 3,397,109 | 1,591,443 |
| සන්නිවේදන දීමනාව | 7,114,556 | 3,372,180 |
| නිල ඇඳුම් | 2,752,587 | 986,364 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 14,615,385 | 15,446,885 |
| කාර්ය මණ්ඩලය වෘත්තීය සාමාජික මුදල් දායකත්වය | 943,003 | 644,279 |
| දේශීය පුහුණු | 1,352,562 | 698,940 |
| කොමිෂන් සභා සාමාජිකයින්ගේ දීමනාව | 169,700 | 62,500 |
| විගණන කමිටු දීමනා | 215,800 | 187,500 |
| 2/3 නිවාස ණය පොලිය ප්‍රතිපූරණය කිරීම | 3,743,589 | 4,209,491 |
| පාරිතෝෂික | 5,119,234 | 3,942,155 |
| විදුලිය | 23,362,280 | 22,182,962 |
| ජලය | 1,318,076 | 916,892 |
| සනීපාරක්ෂක සේවා | 10,360,365 | 10,467,927 |
| ආරක්ෂක සේවා | 19,483,573 | 17,740,147 |
| වරිපනම් හා බදු | 939,182 | 2,051,424 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 21,504,450 | 7,885,352 |
| ඉන්ධන | 7,241,330 | 7,287,082 |
| තැපැල් | 1,601,270 | 1,633,910 |
| දුරකථන, ෆැක්ස් සහ පි.ඒ.බී.එක්ස් (PABX) | 4,725,772 | 5,664,571 |
| රක්ෂණය (දේපළ හා වෛද්‍ය) | 187,673,524 | 161,711,048 |
| අන්තර්ජාල ගාස්තු | 80,547 | 89,847 |
| පුවත්පත් හා නිවේදන | 3,508,386 | 3,768,165 |
| වාර්ෂික පුස්තකාල සාමාජික මුදල | 86,666 | 93,334 |
| වැඩමුළු හා සම්මන්ත්‍රන | 2,529,624 | 1,285,231 |
| වෘත්තීය දීමනා | 7,166,484 | 7,949,903 |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31
*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|
| විගණන ගාස්තු | 1,698,000 | 2,060,000 |
| නීති වියදම් / විනය පරීක්ෂණ / මූලික විමර්ශන | 59,633 | 304,364 |
| ක්ෂයවීම | 705,845,113 | 707,175,400 |
| ණය හිලව් කිරීම | 1,949,998 | 6,841,124 |
| විවිධ පාලන වියදම් | 3,526,217 | 959,278 |
| විවිධ මෙහෙයුම් පිරිවැය | 4,941,290 | 2,163,620 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 9,212,585 | 9,020,475 |
| වාහන නඩත්තුව | 11,422,386 | 7,463,716 |
| ගොඩනැගිලි සහ ව්‍යුහ නඩත්තුව | 3,779,446 | 6,644,395 |
| තාක්ෂණික උපකරණ නඩත්තුව | 1,292,434 | 9,294,479 |
| මෘදුකාංග නඩත්තුව සහ සංවර්ධනය | 89,417,941 | 100,796,838 |
| අලුත්වැඩියා සහ නඩත්තු - විවිධ | 2,923,768 | 1,608,022 |
| බද්දට ගත් පරිශ්‍ර සඳහා කුලී | 0 | 2,292,945 |
| බද්දට ගත් අන්තර්ජාල සම්බන්ධතා කුලී | 6,107,677 | 6,107,677 |
| පිරික්සුම් පද්ධතිය වැඩි දියුණු කිරීම | 2,760,711 | 105,982 |
| ක්‍රිඩා කටයුතු සංවර්ධනය | 1,366,394 | 872,215 |
| විවිධ ගැනුම් සහ සැපයුම් | 4,530,493 | 2,457,337 |
| පිරික්සුම් මධ්‍යස්ථාන නඩත්තුව | 96,816 | 1,224,135 |
| | **1,726,846,103** | **1,565,095,871** |

## 21. මූල්‍ය හා අනෙකුත් වියදම්

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 52,527,969 | 258,345 |
| පාරිතෝෂික මුදල් වෙන්කිරීම මත පොලිය | 8,010,245 | 7,851,356 |
| භාණ්ඩාගාර බැඳුම්කර වට්ටම් ක්ෂයවීම් | 51,394,125 | 112,328,478 |
| | **111,932,340** | **120,438,179** |

## 22. ඒකාබද්ධ අරමුදලට දායකවීම

| | | |
|---|---|---|
| 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලි සංදේශ පනත යටතේ දායකත්වය | 7,000,000,000 | 25,000,000,000 |
| 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් පනත යටතේ දායකත්වය | | |
| ගෙවන ලද විදුලි සංදේශ බදු | 12,958,295,005 | 13,255,387,225 |
| 50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 1,633,840,959 | 1,991,517,340 |
| භාවිතා නොකළ විදුලි සංදේශ සංවර්ධන ගාස්තු - භාණ්ඩාගාරයට | 1,447,777,162 | 1,868,925,474 |
| භාණ්ඩාගාරයට ගෙවන ලද කෙටි පණිවුඩ සේවා බදු | 611,782,031 | 287,485,768 |
| භාණ්ඩාගාරයට ගෙවන ලද ජංගම කුලුනු බදු | 1,697,150,120 | 1,652,316,780 |
| | **25,348,845,276** | **44,055,632,587** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31
*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|---|
| **23. මෙහෙයුම් තුළින් උත්පාදන වූ මුදල්** | | | |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | | **29,413,921,917** | **45,803,540,546** |
| *ගැලපුම් සඳහා* | | | |
| දේපළ, පිරියත හා උපකරන ක්ෂයවීම | | 705,845,113 | 707,175,400 |
| අස්පෘශ්‍ය වත්කම් ණය හිලව්කිරීම | | 1,949,998 | 6,841,124 |
| බොල් ණය අයකර ගැනීම | | (165,679) | 401,153 |
| විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම | | 5,119,234 | 3,942,155 |
| ස්ථාවර තැන්පතු වලින් පොළී | | (759,949,700) | (2,021,140,315) |
| කොටස් වෙළඳපොල ගනුදෙනු වලින් පොලී ආදායම | | (691,844,503) | (1,124,766,523) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත පොලී පිරිවැය | | 8,010,245 | 7,851,356 |
| විදේශ මුදල් ගනුදෙනු මත ලාභ/අලාභ | | (1,085,255,615) | (384,645,157) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත ලාභය | | 0 | (279,600) |
| කූපන් පොලී ආදායම | | (187,027,397) | (410,000,000) |
| භාණ්ඩාගාර බැඳුම්කරවල වට්ටම් හිලව් කිරීම | | 0 | 112,328,478 |
| බොල් ණයගැති වෙන් කිරීම | | 364,415,275 | 0 |
| | | | |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්** | | | |
| ලැබිය යුතු ගිණුම් | **23-1** | (134,256,735) | 313,952,257 |
| පූර්ව ගෙවීම් සහ අත්තිකාරම් | **23-2** | 86,499,825 | (145,654,618) |
| ණය සහ වෙනත් ලැබීම් | **23-3** | (1,663,977,247) | 460,648,166 |
| පාරිතෝෂිත ප්‍රතිලාභ සඳහා ස්ථවර තැන්පතු මත ලැබිය යුතු පොලී | | 4,341,317 | (8,873,019) |
| ගෙවිය යුතු ගිණුම් | **23-4** | 842,379,344 | 193,410,108 |
| අත්තිකාරම්, තැන්පතු හා වෙනත් ගෙවිය යුතු දෑ | **23-5** | 5,908,625,005 | 2,323,248,637 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු | | 137,684,614 | (126,423,970) |
| **මෙහෙයුම් තුළින් උත්පාදනය වන මුදල්** | | **32,956,315,012** | **45,711,556,178** |
| | | | |
| **23-1. ලැබිය යුතු ගිණුම්** | | | |
| ලැබිය යුතු සෙස් ගාස්තු | | 627,843,738 | 560,419,554 |
| ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | | 443,872,866 | 632,433,755 |
| ලැබිය යුතු විදුලි සංදේශ බදු | | 1,046,821,583 | 839,954,289 |
| අයකර ගත යුතු කොකාවිල් කුලුන | | 115,528,038 | 115,320,992 |
| කුලුනෙන් ලැබිය යුතු බදු | | 424,287,530 | 412,818,085 |
| ලැබිය යුතු කෙටි පණිවුඩ සේවා බදු | | 81,808,024 | 68,179,704 |
| ලැබිය යුතු වෙනත් ආදායම් | | 4,520 | 0 |
| අයකර ගත යුතු හිඟ කාර්ය මණ්ඩල ණය | | 690,028 | 713,143 |
| ලැබිය යුතු කොකාවිල් බදුකුලී | | 2,066,233 | 1,176,987 |
| මඩුකන්ද බදු කුලී පාලන ගිණුම | | 754,125 | 1,146,758 |
| ලැබිය යුතු ගුවන් ටිකට්පත් | | 972,600 | 764,900 |
| ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොලී | | 180,747,945 | 140,239,726 |
| ලැබිය යුතු කූපන් පොලී | | 0 | 17,972,603 |
| | | **2,925,397,231** | **2,791,140,496** |
| | | **(134,256,735)** | |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024.12.31

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)*

| | 2024.12.31 දිනට | 2023.12.31 දිනට |
|---|---|---|
| **23-2. පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්** | | |
| විශේෂ අත්තිකාරම් | 0 | 575 |
| උත්සව අත්තිකාරම් | 191,000 | 198,000 |
| ගැනුම් අත්තිකාරම් | 201,875 | 221,553 |
| පූර්ව ගෙවීම් | 118,941,005 | 205,413,578 |
| | **119,333,880** | **205,833,706** |
| | **86,499,825** | |
| **23.3. ණය සහ වෙනත් ලැබීම්** | | |
| ආපදා ණය | 65,036,032 | 52,391,777 |
| මෝටර් රථ ණය | 97,337,842 | 106,277,187 |
| දේපළ ණය | 207,495 | 279,640 |
| මෝටර් බයිසිකල් ණය | 676,732 | 1,015,014 |
| අයකර ගතයුතු වැටුප් අඩුකිරීම් | 2,302,065 | 2,305,065 |
| වෙනත් ලැබීම් | 2,050,000 | 85,383,333 |
| ලං.වි.ම ආරක්ෂක ඇප තැන්පතු ගිණුම (තොරතුරු තාක්ෂණ උද්‍යානය) | 125,000 | 125,000 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (රඳවා ගැනීමේ බදු) | 0 | 163,072,996 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 0 | 1,391,693,000 |
| නෙළුම් කුලුන විදුලි ආරක්ෂණ තැන්පතු | 3,125,000 | 3,125,000 |
| ලැබිය යුතු මැතිවරණ රාජකාරි ගෙවීම් | 700,451 | 0 |
| කොළඹ නෙළුම් කුලුන මඟින් ලැබිය යුතු මුදල් ඉපයීම් | 0 | 29,869,852 |
| | **171,560,617** | **1,835,537,864** |
| | **(1,663,977,247)** | |
| **23-4. ගෙවිය යුතු ගිණුම්** | | |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව | 2,274,439,799 | 3,116,819,143 |
| | **2,274,439,799** | **3,116,819,143** |
| | **842,379,344** | |
| **23-5. අත්තිකාරම්, තැන්පතු සහ අනෙකුත් ගෙවීම්** | | |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව | 9,340,945,339 | 3,432,320,334 |
| | **9,340,945,339** | **3,432,320,334** |
| | **(5,908,625,005)** | |

# විගණකාධිපතිගේ වාර්තාව

## 2024 වර්ෂය සඳහා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAM/E/TRC/01/24/30 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 නොවැම්බර් 24 දින

සභාපති

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

## 1.1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පොලී ලැබීම ලෙස රු. 683,690,115 ක් හඳුනාගත යුතු වුවද රු. 759,949,700 ක් හඳුනාගෙන තිබීම හේතුවෙන් රු. 76,259,585 කින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ණය හා වෙනත් ලැබිය යුතු දෑ ලෙස හඳුනාගෙන තිබුණු රු. 1,663,977,247 ක වටිනාකම කාරක ප්‍රාග්ධන වෙනස් වීම යටතේ එකතු කළ යුතු අගයක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය අඩුකර දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ඇ) ගෙවිය යුතු වටිනාකම ලෙස හඳුනාගෙන තිබුණු රු. 842,379,344 ක වටිනාකම කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම යටතේ අඩු කළ යුතු අගයක් ලෙස හඳුනාගත යුතු වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය එකතු කර දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්ම ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) බැංකු ගිණුම තුළ 2020, 2022 හා 2023 වර්ෂ වල සිට පැවත එන හඳුනා නොගත් ලැබීම් අයිතම 848 කරු. 15,131,285 ක වටිනාකමක් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ කළම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ වර්ෂ 50 ක කාලයකට බදු පදනමින් ගොඩනැගිල්ල ලබාදී ඇති අතර ඒ වෙනුවෙන් වන බදු කුලිය අය කිරීමට අදාළව 2024 පෙබරවාරි 28 දින දක්වා පමණක් බදු කුලී ආදායම හඳුනාගෙන තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින දක්වා වන මුළු බදු කුලී ආදායම හඳුනාගෙන නොතිබුණි. තවද බදු කුලී ආදායම නිශ්චිතව හඳුනාගැනීමට අදාළව දෙපාර්ශවය අතර වන ගිවිසුම යාවත්කාලීන කිරීමද සිදුකර නොතිබුණි.

(ඊ) 2023 වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගත් රු. 1,097,439 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ මෘදුකාංග නඩත්තු ගිණුමට බැර කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට කොකාවිල් කුළුණ භාවිතා කරන පාර්ශ්වයන්ගෙන් රු. 120,524,829 ක් අය විය යුතුව තිබුණද 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු වටිනාකම ලෙස රු. 115,528,038 ක් පමණක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව රු. 4,996,791 ක ලැබිය යුතු ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.

(ඌ) කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමේ සමාරම්භක උත්සවය වෙනුවෙන් 2019 වර්ෂයේ දරන ලද රු. 583,644 ක වියදමක්ද 2023 වර්ෂයට අදාළව මෝටර් රථ අලුත් වැඩියා කිරීම, ලේබල් මුද්‍රණය කිරීම, ක්‍රීඩා කටයුතු සඳහා සහ නීතිඥ ගාස්තු ලෙස දරන ලද මුළු එකතුව රු. 9,139,509 ක වියදම් ද සමාලෝචිත වර්ෂයේ ගෙවීම හේතුවෙන් 2024 වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, ශුද්ධ ලාභය අඩුවෙන්ද දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කොමිෂන් සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කොමිෂන් සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් කොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණු මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිතවිගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 20 (2) (ඇ), 21 (2) (ආ) සහ 22 (2) (අ) වගන්ති | යම් ගාස්තුවක් ගෙවනු ලැබූ විට පමණක් සේවා සැපයිය යුතු වුවත් 2018 වර්ෂයට පෙර මුදල් ලැබීමට පෙර සේවා සැපයීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට රු. 364,415,275 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. |
| (ආ) | 2022 අංක 14 දරන අධිභාර බදු පනත | 2020/2021 වර්ෂයට අදාළව බදු වටිනාකම රු. 1,289,763,603 ක්ද, දඩ මුදල ලෙස රු. 257,952,720 ක්ද, පොලිය රු. 599,740,075 ක්ද ලෙස මුළු වටිනාකම රු. 2,147,456,398 ක් ගෙවීමට සිදුවී තිබුණි. තවද අධිභාර බදු පනතේ 6 (අ) ප්‍රකාරව මෙම වටිනාකම 2020 අප්‍රේල් 01 දිනෙන් ආරම්භ වූ මුල්‍ය ප්‍රකාශන වල වියදමක් ලෙස සලකා බැලිය යුතු වුවද රඳවා ගත් ලාභයට ගැලපීම නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන තිබුණු අතර විගණිත දින වන තෙක්ම මෙය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් විශේෂඥ සේවා ලබා ගැනීම සඳහා 2014 දෙසැම්බර් 30 දින මොරටුව විශ්ව විද්‍යාලය සමඟ එළඹි ගිවිසුම ප්‍රකාරව 2015 ජනවාරි 06 දින රු. 10,057,909 ක් සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රු. 451,000 ක් ලෙස මුළු වටිනාකම රු. 10,508,909 ක් ගෙවා ඇති අතර විගණිත දින වන තෙක්ම කාර්යය අවසන් කර නොතිබුණි.

(ආ) හම්බන්තොට සූරියවැව ප්‍රදේශයේ හෙක්ටයාර් 4.7 ක ඉඩම් සහ තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් කොමිෂන් සභාව සහ කොන්ත්‍රාත්කරු අතර එළඹුණු ගිවිසුම 2016 අගෝස්තු 10 දින අවසන් කර තිබුණි. කොන්ත්‍රාත්තුව නිම් කරන දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 33 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දින වන විට දරන ලද රු. 711,268,796 ක වියදම නිෂ්කාරය වියදමක් වී තිබුණි.

(ඇ) 2022 අප්‍රේල් 29 දින ගිවිසුම්ගත වූ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සඳහා රු. 1,500,000 2022 මැයි 23 හා 2023 අගෝස්තු 29 දිනවල ගෙවා තිබුණු අතර විගණිත දින වන විටත් කාර්යය අවසන් කර නොතිබුණි.

## 2.3 වෙනත් නිරීක්ෂණ

(අ) 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරකම් 92 ක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණ ද 2024 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කරන ලද කාර්ය සාධන වාර්තාවට අනුව ක්‍රියාකාරකම් 64 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ සෝලා ව්‍යාපෘතියක් (Solar project) ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 50 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂයේ ආරම්භ කර 2024 වර්ෂයේ අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් කාර්යය ආරම්භ කර නොතිබුණි.

(ඇ) 2024 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට අනුව Replacing old servers of the spectrum management system සඳහා රු. මිලියන 60 ක් වෙන්කර තිබුණු අතර 2024 අප්‍රේල් 01 දින ව්‍යාපෘතිය ආරම්භ කර 2024 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීමට සැලසුම් කර තිබුණ මෙම ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය සියයට 25 ක් පමණක් විය.

(ඈ) කොමිෂන් සභාවේ සේවය කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු. 2,302,060 ක ණය මුදලක් ද වසර 10 කට වැඩි කාලයක සිට ලැබිය යුතු දැ යටතේ හඳුනාගෙන තිබුණු පාර්ශවයන් දෙදෙනෙකුගෙන් ගොඩනැගිලි කුලියට ගැනීම වෙනුවෙන් කොමිෂන් සභාව විසින් ගෙවා ඇති රු. 1,550,000 ක අත්තිකාරම් වටිනාකමද 2025 ඔක්තෝබර් 07 විගණිත දින වන විටත් අය කරගෙන නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමෙන්, ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් පුද්ගලික සමාගමෙන් හා සැටිනෙට් සමාගමෙන් රු. 4,479,128 ක් වර්ෂ 5කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතුව තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් අය කරගෙන නොතිබුණි.

(ඊ) කොමිෂන් සභාව විසින් රු. 1,187,002,018 ක ගෙවිය යුතු බදු වටිනාකමක් අඩුවෙන් හඳුනාගැනීම හේතුවෙන් රු. 237,400,404 ක දඩ මුදලක් සහ ඒ මත පොලිය ලෙස රු. 569,760,969 ක් ලෙස මුළු වටිනාකම රු. 1,994,163,391 ක් ගෙවීමට සිදුවී තිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

## අතිරේක තොරතුරු

## වසර 10ක මූල්‍ය ප්‍රගතිය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් මිලියන වලින්)

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය තත්ත්ව** | | | | | | | | | | |
| මුළු ජංගම නොවන වත්කම් | 72,895.0 | 73,473.1 | 36, 395.0 | 43, 506.6 | 35, 826.9 | 34, 215.3 | 30, 334.9 | 34, 324.5 | 25, 330.0 | 45, 915.1 |
| මුළු ජංගම වත්කම් | 18,735.5 | 15,126.6 | 7, 179.6 | 9, 123.3 | 12, 724.0 | 9, 295.8 | 8, 306.0 | 12, 120.3 | 18, 746.0 | 7, 022.0 |
| මුළු වත්කම් | 91,630.5 | 88,599.7 | 43, 574.5 | 52, 629.8 | 48, 550.9 | 43, 511.1 | 38, 640.9 | 46, 444.8 | 44, 076.0 | 52, 937.0 |
| මුළු සම කොටස් | 75,140.9 | 74,738.4 | 31, 701.1 | 32, 060.5 | 27, 478.8 | 20, 327.8 | 11, 132.4 | 17, 309.2 | 20, 041.4 | 29, 242.9 |
| මුළු ජංගම නොවන වගකීම් | 47.7 | 2,296.5 | 5, 162.1 | 12, 581.8 | 13, 850.1 | 15, 294.3 | 16, 947.1 | 18, 451.7 | 16, 966.6 | 15, 856.3 |
| මුළු ජංගම වගකීම් | 16,441.9 | 11,564.8 | 6, 711.3 | 7, 987.5 | 7, 222.0 | 7, 889.0 | 10, 561.4 | 10, 683.9 | 7, 068.0 | 7, 837.9 |
| මුළු වගකීම් | 16,489.6 | 13,861.3 | 11, 873.4 | 20, 569.3 | 21, 072.1 | 23, 183.3 | 27, 508.5 | 29, 135.6 | 24, 034.6 | 23, 694.2 |
| මුළු සම කොටස් සහ වගකීම් | 91,630.5 | 88,599.7 | 43, 574.5 | 52, 629.8 | 48, 550.9 | 43, 511.1 | 38, 640.9 | 46, 444.8 | 44, 076.0 | 52, 937.0 |
| | | | | | | | | | | |
| **ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | | | | | |
| ආදායම | 36,969.3 | 48,236.0 | 38, 414.6 | 33, 700.5 | 29, 000.9 | 38, 575.2 | 48, 032.9 | 54, 368.0 | 56, 024.0 | 48, 235.1 |
| නියාමන වියදම් | 6,801.9 | 1,131.5 | 209.6 | 50.1 | 54.8 | 78.9 | 82.2 | 66.9 | 164.2 | 97.8 |
| වෙනත් වියදම් | 753.5 | 1,300.9 | 6, 507.9 | 1, 354.2 | 918.0 | 612.8 | 2, 244.1 | 724.7 | 518.0 | 543.9 |
| ලාභය ආදායම් බදු ගෙවීමට පෙර | 25,770.8 | 45,301.9 | 31, 697.2 | 32, 296.3 | 28, 028.1 | 37, 883.5 | 45, 706.6 | 53, 576.5 | 55, 341.7 | 47, 593.4 |
| ආදායම් බදු | 3,643.1 | 0.0 | 159.1 | 4, 492.1 | 702.9 | 0.0 | 2, 349.2 | 536.4 | 727.8 | 842.1 |
| ලාභය ආදායම් බදු ගෙවීමට පසු | 25,770.8 | 45,301.9 | 31, 538.0 | 27, 804.1 | 27, 325.1 | 37, 883.5 | 43, 357.3 | 53, 040.0 | 54, 614.0 | 46, 751.3 |
| වෙනත් විස්තීර්ණ ආදායම | 19.6 | 0.1 | 4.8 | 5.1 | 2.5 | 7.1 | 5.1 | 0.8 | 1.5 | 0.5 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 25,348.8 | 44,055.6 | 29, 308.5 | 22, 227.5 | 18, 817.6 | 27, 681.0 | 34, 529.0 | 40, 773.1 | 48, 816.9 | 43, 652.1 |
| මුළු විස්තීරණ ආදායම | 402.4 | 1,246.4 | 2, 234.3 | 5, 581.7 | 8, 505.0 | 10, 195.4 | 8, 823.2 | 12, 267.8 | 5, 798.6 | 3, 099.7 |
| **මුදල් ප්‍රවාහ** | | | | | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය | 32,271.5 | 44,885.6 | 28, 619.4 | 29, 113.6 | 27, 415.0 | 33, 498.7 | 44, 722.8 | 54, 790.7 | 51, 101.7 | 46, 054.0 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල | 587.6 | 5,630.0 | (1, 101.1) | (7, 353.3) | (1, 476.3) | (3, 946.8) | 3, 584.7 | (7, 398.2) | 22, 462.9 | (8, 339.2) |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් | (26,893.8) | (42,913.4) | (30, 156.3) | (24, 523.4) | (21, 583.8) | (29, 573.4) | (50, 301.2) | (53, 749.8) | (62, 420.8) | (42, 485.2) |

## කෙටි යෙදුම් ලැයිස්තුව

| | | |
|---|---|---|
| AI | Artificial Intelligence<br>කෘතිම බුද්ධිය |
| APT | Asia Pacific Telecommunity<br>ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය |
| ARPU | Average Revenue Per User<br>පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය |
| ASMS | Antenna Structure Management System<br>ඇන්ටනා ව්‍යුහ කළමනාකරණ පද්ධතිය |
| ATC | Advance Training Committee<br>උසස් පුහුණු කමිටුව |
| BOI | Board of Investment<br>ආයෝජන මණ්ඩලය |
| CDMA | Code Division Multiple Access<br>කේත බෙදුම් බහු ප්‍රවේශය |
| CEB | Ceylon Electricity Board<br>ලංකා විදුලිබල මණ්ඩලය |
| CEO | Chief Executive Officer<br>ප්‍රධාන විධායක නිලධාරි |
| CID | Crime Investigation Department<br>අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| CLT | Colombo Lotus Tower<br>කොළඹ නෙලුම් කුලුන |
| COPE | Committee on Public Enterprises<br>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව |
| CSSL | Computer Society of Sri Lanka<br>ශ්‍රී ලංකා පරිගණක සංගමය |
| CTL | Cellular Tower Levy<br>සෙලියුලර් කුලුනු බද්ද |
| DS | Divisional Secretariat<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| DTH | Direct to Home<br>ඍජු ගෘහස්ථ |
| DVB | Digital Video Broadcasting<br>ඩිජිටල් වීඩියෝ විකාශනය |
| ECSL | Engineering Council Sri Lanka<br>ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව |
| FM | Frequency Modulation<br>සංඛ්‍යාත මොඩියුලේෂන් |
| GPG | Government Procurement Guidelines<br>රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ |
| GPRS | General Packet Radio Services<br>පොදු දත්ත මලු ගුවන් විදුලි සේවය |
| GSM | Global System for Mobiles<br>ජංගම දුරකථන සන්නිවේදන සඳහා ගෝලීය පද්ධතිය |
| HR | Human Resource<br>මානව සම්පත් |
| ICT | Information and Communications Technology<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| IESL | Institution of Engineers Sri Lanka<br>ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය |
| IET | Institution of Engineering and Technology<br>ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය |
| IMEI | International Mobile Equipment Identity<br>ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය |
| IMSL | Institute of Management of Sri Lanka<br>ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය |
| IMT | International Mobile Telecommunications<br>ජාත්‍යන්තර ජංගම දුරකථන සන්නිවේදන |
| IP | Internet Protocol<br>අන්තර්ජාල ප්‍රෝටොකෝලය |
| ISOC | Internet Society<br>අන්තර්ජාල සමාජය |
| ISP | Internet Service Provider<br>අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් |
| IT | Information Technology<br>තොරතුරු තාක්ෂණය |
| ITU | International Telecommunication Union<br>ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය |
| JICA | Japan International Cooperation Agency<br>ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය |
| LNPS | Lanka Number Portability Services Ltd<br>ලංකා නම්බර් පෝටබිලිටි සර්විසස් ලිමිටඩ් |
| LTE | Long Term Evolution<br>දිගුකාලීන පරිණාමය |
| MOD | Ministry of Defence<br>ආරක්ෂක අමාත්‍යාංශය |
| MOE | Ministry of Education<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| MOU | Memorandum of Understanding<br>අවබෝධතා ගිවිසුම |
| MPLP | Multi-Purpose Lamp Pole<br>බහුකාර්ය ලාම්පු කලුනු |
| NFAT | National Frequency Allocation Table<br>ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුව |

| | | |
|---|---|---|
| NIA | National Information Agency<br>ජාතික තොරතුරු නියෝජිතායතනය |
| PAYE | Pay as You Earn Tax<br>උපයන විට ගෙවීමේ බදු |
| PCU | Project Consultancy Unit<br>ව්‍යාපෘති උපදේශන ඒකකය |
| PLC | Public Limited Company<br>පොදු සීමා සහිත සමාගම |
| PPE | Property, Plant and Equipment<br>දේපළ, පිරියත සහ උපකරණ |
| PSTN | Public Switched Telephone Network<br>පොදු ස්විච්කරණ දුරකථන ජාල |
| QOS | Quality of Service<br>සේවා ගුණාත්මකභාවය |
| RAN | Radio Access Network<br>රේඩියෝ ප්‍රවේශ ජාලය |
| RF | Radio Frequency<br>ගුවන්විදුලි සංඛ්‍යාත |
| RFSL | Radio Frequency Spectrum Licence<br>ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය බලපත්‍රය |
| RTTE | Radio and Telecommunications Terminal Equipment<br>ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ |
| SATRC | South Asian Telecommunication Regulators Council<br>දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය |
| SDG | Sustainable Development Goals<br>තිරසාර සංවර්ධන ඉලක්ක |
| SIM | Subscriber Identity Module<br>ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත් |
| SLAF | Sri Lanka Air Force<br>ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| SLAS | Sri Lanka Administrative Service<br>ශ්‍රී ලංකා පරිපාලන සේවය |
| SLCERT | Sri Lanka Computer Emergency Readiness Team<br>ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය |
| SLIDA | Sri Lanka Institute of Development Administration<br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| SMP | Significant Market Powers<br>විශේෂ වෙළඳපොළ බලය |
| SMS | Short Message Service<br>කෙටි පණිවිඩ සේවා |
| SOR | Scheme of Recruitment<br>බඳවා ගැනීමේ පටිපාටිය |
| TDC | Telecommunications Development Fund<br>විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව |
| TL | Telecommunications Levy<br>විදුලි සංදේශ බදු |
| TRCSL | Telecommunications Regulatory Commission of Sri Lanka<br>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව |
| UN | United Nations<br>එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| UN ESCAP | United Nations Economic and Social Commission for Asia and the Pacific<br>ආසියා සහ පැසිෆික් කලාපය සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම |
| UOM | University of Moratuwa<br>මොරටුව විශ්වවිද්‍යාලය |
| URLLC | Ultra Reliable Low Latency Communications<br>අතිශය විශ්වාසනීය වේගවත් සන්නිවේදනය |
| VIP | Very Important Person<br>ඉතා වැදගත් පුද්ගලයා |
| VLR | Visitor Location Register<br>ග්‍රාහකයින්ගේ ස්ථාන ලේඛනය |
| VPN | Virtual Private Network<br>අතථ්‍ය පුද්ගලික ජාලය |
| WFK | World Friends Korea<br>කොරියානු ලෝක මිත්‍රත්ව සංසදය |
| WRC | World Radiocommunication Conference<br>ලෝක ගුවන්විදුලි සන්නිවේදන සමුළුව |
| WTISD | World Telecommunication and Information Society Day<br>ජාත්‍යාන්තර විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

276, ඇල්විටිගල මාවත, කොළඹ 08, ශ්‍රී ලංකා
දුරකථන: +94 11 268 9345 / 1900 | ෆැක්ස්: +94 11 268 9341

www.trc.gov.lk twitter.com/TRCSL facebook.com/trcsl